
# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

ஸ்ரீ இலங்கை காலாட் படை சஞ்சிகை

**JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY**

61st ISSUE
JULY 2009





සම්බන්ධීකරන නිලධාරි ලුතිත කර්නල්
එච්එම්එන්බි හේරත් ශ්‍රීලපාහ



මානි I (පාලන) මේජර් ජේඑල්ටීකේ
හේවා ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ



මානි II මේජර් එම්පීඑස්පී කුලසේකර
ශ්‍රීලපාහ

## රෙම ශ්‍රීලපාහ හි නව තනතුරු සඳහා පත්වූ ඔබ සැමට රෙපිමේන්තු අධිපති තුමන් ඇතුළු සියලුම අයවළුන්ගේ උණුසුම් සුභ පැතුම්



මානි II (ප්‍ර) මේජර් කේඑස්යූ පෙරේරා
ශ්‍රීලපාහ



රෙළපාසැමේ බනි II රත්නසිරි එච්පී



ප්‍රධාන ලිපිකරු
බනි II බණ්ඩාර ඩබ්ලිව්එම්ආර්ඩබ්

## යූඑච්පී දියතලාව කෙඩෙට් නිලධාරීන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාරය







THE WHITE HACKLE

# THE WHITE HACKLE

**JULY 2009 VOLUME 15 NO.01 61st ISSUE**

## Headlines


| | Page |
|---|---|
| Feed back අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටින අයට ගෞරව දැක්වීම සඳහායි | 03 |
| සමුගත් කණ්ඩුල VI | 04 |
| ජාතික කොඩිය හා සබැඳි වත් පිළිවෙත් | 05 |
| ප්‍රාණ ඇපකරුවන් නිදහස් කර ගැනීමේ අවසන් මෙහෙයුම | 06-07 |
| වන්නි මානුෂිය මෙහෙයුමේ 10 ශ්‍රීලපාහ දායකත්වය | 08-10 |
| හොඳ බෞද්ධයකුවීම | 11 |
| 19 වන බළඇණි දිනය සමරූ 6 ශ්‍රීලපාහ | 12-13 |
| නිල කොබෙයියා (රුසියන් සුරඟනා කතාව) | 14-19 |
| වයිට් හැකල් කාටූනය | 22 |
| 19 ශ්‍රීලපාහ 31 වන බංකරය | 24-25 |
| යුධ හමුදා අන්තර් රෙජිමේන්තු මාර්ග ධාවන තරගාවලිය 2009 | 29 |
| 2 (සේවි) ශ්‍රීලපාහ 128 වන උපන් දිනය සමරයි | 30-31 |
| දසුනේ හසුන | 33 |
| THE WORLD SNIPING RIFLES | 34-35 |
| FEDERAL COUNTRIES IN THE WORLD | 38 |
| කෙසෙල් කොටයකට යට වුනු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය | 39 |
| ප්‍රහේලිකා අංක 42 | 39-40 |





මානුෂිය මෙහෙයුමේ ප්‍රාණ ඇපකරුවන් නිදහස්වීම



24 19 ශ්‍රීලපාහ 31 බංකරය මුදාගැනීමෙන් පසු



37 විරූ වාරුව සවිමත් වීමට අතහිත




## කවරයේ කථාව

1983 ජුලි මස 23 වන දින යාපනයේ දී ලුතිතන් වාස් ගුණවර්ධන ඇතුලු රණවිරුවන් 13 දෙනකු ඝාතනය කරමින් ඇරඹු ඊළාම් සිහින රාජ්‍යය සඳහා වූ යුද්ධය 2009 මැයි මස 18 වන දින එහි නිර්මාතෘ වේලුපිල්ලේ ප්‍රභාකරන් ඇතුලු එල්ටීටීඊ නායකයින් සමඟින් මෙරටින් තුරන් කිරීමට ආරම්භ කළ මානුෂිය මෙහෙයුමේදී පියවරෙන් පියවර ජයග්‍රහණ සොයා ගිය ශ්‍රීලපාහ රණවිරුවන් ගේ ඡායාරූප මෙවර කවරයේ කථාවෙන් පිළිබිඹු වේ.

Designed & Printed by
softwave
107D, Havelock Road, Colombo 05.

# THE WHITE HACKLE

**SRI LANKA**
**LIGHT INFANTRY MAGAZINE**


**COLONEL OF THE REGIMENT**

**MAJ GEN** RMD RATHNAYAKE RWP, RSP, USP, ndu, psc

**Editor in Chief**

**COL** TJ KODITHUWAKKU ,RWP
(CENTRE COMMANDANT)

**Assistant Editor**

**MAJ** MPSP KULASEKARA SLLI
(SO II RHQ SLLI)

**Associate Editor**

**MAJ** TP WEERASINGHE SLLI
(OIC 'WHITE HACKLE')

**Chief Consultant**

**MAJ GEN** HV ATHUKORALE VSV,psc,FBIM
( Rtd – Reg Force )
**BRIG** AER ABEYSINGHE
(Rtd – Vol Force)

| | |
|---|---|
| Publisher | - Regimental Centre<br>Sri Lanka Light Infantry |
| T:P: | - 0112855204<br>0112855356 |
| Fax | - 0112855204 |
| E-mail | - rhqslli@yahoo.com |


# Feedback

## අදහස්, උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 61st issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears though 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and use what if of a standard, like sketches cartoons stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

***Editor***

## කර්තෘ වාක්‍යය

වයිට් හැකල් සඟරාවේ 61 වන කලාපය ඔබ වෙත ඉදිරිපත් කරනුයේ හද පිරි සතුටිනි. අප රට සෑම අංශයකින්ම පරිහානිය කරා ගෙන ගිය කුරිරු එල්ටීටීඊ සංවිධානයේ නායකත්වය විනාශ වී අවසන්ය. ත්‍රිවිධ හමුදාව ලැබූ එම සුවිශේෂී විජයග්‍රහණයට පසුව ඔබ අතට පත් කරන ප්‍රථම වයිට් හැකල් සඟරාව මෙය වේ. යුද ජයග්‍රහණයෙහිලා ශ්‍රී ලංකා පාබල හමුදාව ලබාදුන් දායකත්වය ගැන අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ. 'තමා ගැන තමා නොකියන්න. එය අනුනට භාර දෙන්න ' යනුවෙන් කියමනක් තිබේ. එබැවින් අපි අප ගැන කතා නොකරමු.අපගේ වීරත්වය ගැන අපිම වර්ණනා කර නොගනිමු. එය අනුනට භාර දෙමු.

වයිට් හැකල් සඟරාව පෙරටත් වඩා උසස් තත්ත්වයෙන් ඔබ අතට පත් කිරීම අපගේ බලාපොරොත්තුවයි. සිංහල දෙමළ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම යුත් ලිපි නිර්මාණ සඳහා දැන් සඟරාව විවෘතව ඇත. එමෙන්ම කාටුන් චිත්‍ර ඇඳීමේ හැකියාවක් තිබෙන අයද අප අතර සිටින්නට පිළිවන. ඔබගේ හොඳ කාටුන් චිත්‍ර සඳහාද මින් ඉදිරියට වයිට් හැකල් සඟරාවේ ඉඩ කඩ වෙන් වෙනු ඇත. කාව්‍ය රීතින් සියල්ල ඉගෙනගත් පසු කවි ලියන්න යාම හරියට විලංගු දාගෙන දුවන්න ඉගෙන ගැනීම හා සමානය. එබැවින් ඔබේ සිතට ගලා එන මිහිරි අමිහිරි අදහස් වචන බවට පෙරලා අප වෙත එවන්න. ඉඩ ලැබෙන අයුරින් ඒවා වයිට් හැකල් සඟරාවේ පළ වනු ඇත. අවිය සේම පන්හිඳද අපි මැනවින් හසුරවමු. අපගේ ආදර්ශ පාඨය 'සේවය කරමි' මත පිහිටා රෙජිමේන්තුවටත්, හමුදාවටත්, රටටත් තව තවත් සේවය කරමින් අපගේ පාබල හමුදා ධජය ඉතා ඉහළින් ලෙළ දුන් විලසටම තව දුරටත් ලෙළ දීමට අවස්ථාව උදාකර දෙමු.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn,57380 or 57404. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, Of PA Army HQ CBO by letter No, A/275/27 of 16 Mar, '94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE KILLED IN ACTION

1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුදකල ශ්‍රීලපාහ විරෝධාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පලකරනු ලැබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2897 | S/178717 | L/Cpl | Indrajith KDAP | 15 SLLI | Welioya | 3/29/2008 |
| 2898 | S/310156 | L/Cpl | Bodipala J | 12 SLLI | Welioya | 3/29/2008 |
| 2899 | S/178721 | L/Cpl | Priyalal PTJ | 15 SLLI | Janakapura | 3/29/2008 |
| 2900 | S/179216 | L/Cpl | Anura Kumara WMP | 12 SLLI | Gen:Hosp : CBO | 3/30/2008 |
| 2901 | S/310612 | Sgt | Rathnapala KLC | 15 SLLI | Janakapura | 3/30/2008 |
| 2902 | S/181463 | L/Cpl | Fernando BIP | 7 SLLI | Gen:Hosp: ANP | 3/30/2008 |
| 2903 | S/314478 | Sgt | Kumara KJP | 10 SLLI | Wauniyawa | 4/1/2008 |
| 2904 | S/319499 | L/Cpl | Muthtettuwa MGARK | 7 SLLI | Wauniyawa | 02/04/2008 |
| 2905 | S/319485 | L/Cpl | Gunathilaka PANM | 7 SLLI | Wauniyawa | 02/04/2008 |
| 2906 | S/308279 | Sgt | Suriyabandara SMHM | 15 SLLI | Janakapura | 03/04/2008 |
| 2907 | S/181597 | L/Cpl | Satharasingha SASS | 10 SLLI | Maranamadu | 06/04/2008 |
| 2908 | S/319501 | L/Cpl | Karunarathna KSL | 7 SLLI | Pandirichchan | 09/04/2008 |
| 2909 | S/318222 | L/Cpl | Priyadarshena WCS | 7 SLLI | Madupalli | 12/04/2008 |
| 2910 | S/176647 | L/Cpl | Rathnadira KT | 12 SLLI | Kiri Ebban Wewa | 14/04/2008 |
| 2911 | S/170411 | L/Cpl | Wijerathna DDL | 12 SLLI | Kiri Ebban Wewa | 15/04/2008 |
| 2912 | S/314944 | Cpl | Darshena SKK | 15 SLLI | Janakapura | 15/04/2008 |
| 2913 | S/33195 | L/Cpl | Pallewatta PJTS | 16(V) SLLI | Palampiddi | 16/04/2008 |
| 2914 | S/165590 | L/Cpl | Dissanayaka MG | 12 SLLI | Kiri Ebbana Wewa | 17/04/2008 |
| 2915 | S/184619 | L/Cpl | Udayasiri WGC | 12 SLLI | Kiri Ebbana Wewa | 17/04/2008 |
| 2916 | S/184513 | L/Cpl | Jayalath JMTRK | 12 SLLI | Kiri Ebbana Wewa | 18/04/2008 |
| 2917 | S/315043 | Sgt | Ranaweera PGS | 11 SLLI | Mullikulam | 20/04/2008 |
| 2918 | S/164662 | Cpl | Gunasinghe UDLF | 12 SLLI | Kiri Ebbana Wewa | 20/04/2008 |
| 2919 | S/303660 | Cpl | Abesinghe AMAK | 1 SLLI | Muhamalei | 22/04/2008 |
| 2920 | S/317156 | Sgt | Wickramarathana AA | 1 SLLI | Muhamalei | 22/04/2008 |
| 2921 | S/317110 | L/Cpl | Dissanayaka MG | 1 SLLI | Army Hosp: Palaly | 23/04/2008 |
| 2922 | S/317985 | L/Cpl | Wickramatunga WN | 4 SLLI | Muhamalei | 23/04/2008 |
| 2923 | S/316672 | Cpl | Atula Kumara MS | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2924 | S/318075 | Cpl | Abekon AMSK | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2925 | S/319893 | L/Cpl | Rathnasuriya RISK | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2926 | S/315212 | L/Cpl | Kirthisiri IDR | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2927 | S/315196 | L/Cpl | Sisira Kumara SM | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2928 | S/318766 | Cpl | Wasantha Kumara AM | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2929 | S/315242 | Cpl | Jayaweera UM | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2930 | S/315945 | L/Cpl | Gunawardena MKASW | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2931 | S/315903 | L/Cpl | Sarath Premachandra MG | 1 SLLI | Muhamalei | 23/04/2008 |
| 2932 | S/315660 | L/Cpl | Prasanna SHA | 4 SLLI | Muhamalei | 23/04/2008 |
| 2933 | S/167789 | L/Cpl | Sampath HMS | 12 SLLI | Kiri Ebbana Wewa | 23/04/2008 |
| 2934 | S/165474 | L/Cpl | Wijesiri WMSN | 1 SLLI | Gen:Hosp: CBO | 26/04/2008 |
| 2935 | S/318514 | Cpl | Rathna Kumara RKDP | 8 SLLI | P: P: Kulam | 28/04/2008 |
| 2936 | S/315311 | Cpl | Anura P | 8 SLLI | P: P: Kulam | 30/04/2008 |
| 2937 | S/306008 | L/Cpl | Pushpakumara GGA | 7 SLLI | Panni Erichchan | 02/05/2008 |
| 2938 | S/186077 | L/Cpl | Wijerathna WMBL | 12 SLLI | Welioya | 03/05/2008 |
| 2939 | S/318310 | L/Cpl | Dissanayaka PMS | 8 SLLI | Palampiddi | 09/05/2008 |
| 2940 | S/172651 | L/Cpl | Ekanayaka ENMN | 8 SLLI | Palampiddi | 09/05/2008 |
| 2941 | S/319675 | L/Cpl | Deshapriya NLS | 11 SLLI | Mullikulam | 11/05/2008 |
| 2942 | S/309183 | S/Sgt | Werasinha DRSS | 7 SLLI | Gen: Hosp: CBO | 13/05/2008 |
| 2943 | S/317522 | L/Cpl | Kumarasinha D | 15 SLLI | Janakapura | 15/05/2008 |
| 2944 | S/319662 | L/Cpl | Ajith Kumara HM | 11 SLLI | Mullikulam | 18/05/2008 |
| 2945 | S/319708 | L/Cpl | Dissanayaka DMDSB | 11 SLLI | Mullikulam | 18/05/2008 |
| 2946 | S/306644 | Sgt | Rathnayaka RM | 15 SLLI | Janakapura | 18/05/2008 |

තව කොටසක් ලබන කලාපයේ

# සමුගත් කණ්ඩුල VI



රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ මංගල වස්තුව ලෙස සේවය කල "කණ්ඩුල VI" වසර 07 ක සිය සේවාකාලය අවසානයේ යුධ හමුදා රාජකාරියෙන් සමුගෙන 2009.05.20 දින විශ්‍රාම ගියේය. එම විශේෂ අවස්ථාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානය සම්මාන පෙළපාලියක් පවත්වා ගාම්භීර ලෙසින් කණ්ඩුල VI තම රාජකාරි කණ්ඩුල VII වෙත බාරදී සමුදෙන ලදී.

1960 දශකය ආරම්භයේ 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට මංගල වස්තුවක අවශ්‍යතාවය බෙහෙවින් ඉස්මතුවිය. එවකට ඒකකයේ අණදීම කල කර්නල් රිචඩ් උඩුගම මේ සඳහා සුදුසු මංගල වස්තුවක් සෙවීම පිණිස බෙහෙවින් වෙහෙසිනි. කර්නල් රිචඩ් උඩුගමගේ ඉමහත් උනන්දුව හා කැපවීම නිසාම 1961 ජනවාරි මස 02 වන දින ඒකකයේ මංගල වස්තුව වශයෙන් එවකට දෙහිවල සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂ මේජර් ඔබ්රි වයිමන් විසින් කුඩා ඇත් පැටවකු 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත පරිත්‍යාග කරන ලදී. ශ්‍රී ලංකාව එක්සේසත් කල විශිෂ්ඨ රජෙක් වූ දුටු ගැමුණු රජතුමා යුද්ධයට නැගී ගිය එඩිතර විරෝදාර ඇතාගේ නම වූ "කණ්ඩුල"



යන නම එම ඇත් පැටවාට ලබාදුනි. ඉන් පසුව එම නාමය රෙජිමේන්තු මංගල හස්තියාට නම් කිරීම පාබල හමුදාවේ සම්ප්‍රදායක් විය.

එතැන් පටන් කණ්ඩුල I, II, III, IV සහ V වශයෙන් රෙජිමේන්තු මංගල හස්තින්ගේ සේවාව මෙම රෙජිමේන්තුව වෙත ලැබුණි. 1997 පෙබරවාරි මස 7 දින පින්නවල අලි අනාථාගාරයේදී අර්ජුන ලෙසින් එලිය දුටු මෙම කුඩා ඇත් පැටවා කණ්ඩුල V මංගල හස්තියාගේ විශ්‍රාමයැමෙන් පුරප්පාඩු වූ තනතුර සඳහා 2001 දෙසැම්බර් මස 11 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත රපෝර්තු කරන ලදී.

තම රාජකාරින් මැනවින් පුරුදු පුහුණු වූ කණ්ඩුල VI තූර්‍ය වාදක බෙර හඬට නිවැරදිව පාද තබමින් ගමන් කිරීමටත් ආචාර කිරීමටත් පුහුණු විය.

ඔහුගේ මෙම ක්‍රියාදාමය දෙස් විදෙස් රාජ්‍ය නායකයින් සම්භාවනීය අමුත්තන් සහ ප්‍රභුවරුන්ගේ පැසසුමට ලක්වූ වාර අනන්තය. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සේවය කළ වසර 07 ක කාලය තුල නියෝජනය කර ඇති සම්මාන පෙළපාලි සහ සම්මාන මුර සංඛ්‍යාව අසීමිතය. විශේෂයෙන් මෙහිදී පහත සඳහන් ගෞරවණීය සම්මාන පෙළපාලි වර්ණවත් කර ඇති බව ද සටහන් කර තබමු.



- 2002 වර්ෂයේ පෙබරවාරි 04 වන දින නිදහස් උත්සව පෙළපාලිය.
- වර්ෂ 2002 ක් වූ ජූලි මස 15 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාපති තුමාගේ නික්ම යාමේ පෙළපාලිය
- 2003 වර්ෂයේ පෙබරවාරි 04 වන දින නිදහස් උත්සව පෙළපාලිය.
- වර්ෂ 2003 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින පාකිස්තාන ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානි වෙත පිරිනමන ලද සම්මාන මුරය.
- 2004 වර්ෂයේ පෙබරවාරි 04 වන දින නිදහස් උත්සව පෙළපාලිය.
- 2005 වර්ෂයේ පෙබරවාරි 04 වන දින නිදහස් උත්සව පෙළපාලිය.
- 2006 අගෝස්තු 08 වන දින පැවැත්වූ දකුණු ආසියාතික ක්‍රීඩා



උළෙලේ සමාරම්භක උත්සවයේ ගිණි සිළුව ඇතාගේ පිටේ රැගෙන යාම. අභිමානවත් ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන වර්ණලාභී රෙජිමේන්තුවකට කණ්ඩුල VI ගෙන් වූ අමිල සේවය මිලකළ නොහැක. ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහ විශේෂයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ උත්තමාචාරය ඔබට පුද කරමු.



# ජාතික කොඩිය හා සබැඳි වත් පිළිවෙත්

ශ්‍රී ලංකා ජාතික කොඩිය මේ දිනවල අන් කවරදාකටත් වඩා භාවිතාවට පැමිණ ඇති අතර යුධ ජයග්‍රහණය හේතුවෙන් ලත් උද්දාමය මත දිවයිනේ සෑම ස්ථානයකම ජාතික කොඩිය ඔසවා තිබෙනු දැකිය හැකිය. ලොව සෑම රටකම සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික කොඩියක් නිර්මාණය වී ඇති අතර ශ්‍රී ලංකාව තුල එම ධජය නිර්මාණය කිරීමේ ගෞරවය ජේ.ඩී.ඒ. පෙරේරා හා එස්.පී. චාල්ස් යන මැතිඳුන් දෙපලට හිමි වේ. වර්තමානයේ ශ්‍රී ලාංකිකයන් වන අප භාවිතා කරන ජාතික කොඩිය මුල් වරට ඔසවනු ලැබ ඇත්තේ 1972 මැයි 22 වන දින ශ්‍රී ලංකා ජනරජ දිනයේදීය.

ජාතික කොඩිය පරිහරණය කිරීමේදී ඒ හා සබැඳි වත් පිළිවෙත් දැන සිටීම ඉතා වැදගත් කරුණක් වන අතර යුධ හමුදා සාමාජිකයින් ලෙස බොහෝ උත්සව අවස්ථාවන්හි මෙම ජාතික කොඩිය නංවා ආචාර කරන හෙයින් ඒ පිළිබඳ අවබෝධය අනිවාර්ය කරුණක් වී ඇත. මෙම අවබෝධය තුලින් ජාතික කොඩිය අගෞරවයට ලක්වීම වැළැක්විය හැකි වන අතර ඊට දැක්විය හැකි උසස්ම ආචාරය දැක්වීමට හැකි වනු ඇත.

ජාතික කොඩිය භාවිතා කරන අවස්ථාවලදී පිළිපැදිය යුතු ආචාර ධර්ම ඇතුලත් ලිපියක් චාමර බණ්ඩාර නමැති ලේඛිකාව විසින් 2009 මැයි මස 27 වන දින දිවයින පුවත් පතෙහි පල කර තිබූ අතර එම ලිපිය අනුසාරයෙන් ගත් කරුණු කිහිපයක් ඔබගේ දැනගැනීම සඳහා පහත දක්වා ඇත.

- ජාතික දිනය හා රජය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන්හිදී හා සියලුම රාජ්‍ය උත්සවවලදී ජාතික කොඩිය ඔසවා තැබිය යුතුය.
- එසේම එය ප්‍රදර්ශනය කරනු ලබන කවර අවස්ථාවක වුවද එයට ඉහළම ගෞරවණීය ස්ථානය දිය යුතු අතර පැහැදිලිව පෙනෙන ස්ථානයක සවි කළ යුතුය.
- විදේශිය රාජ්‍ය නායකයකු මෙරටට පැමිණි අවස්ථාවක එරට ජාතික කොඩිය ප්‍රදර්ශනය කරන්නේ නම් ඒ සමග ලංකාවේ ජාතික කොඩියද ප්‍රදර්ශනය කළ යුතුය.
- ජාතික කොඩිය එස වීමත්, පහත් කිරීමත් ගෞරවාන්විතව කළ යුතු සේම, කොඩිය එසවිය යුත්තේ සිරස් තිරු දෙක කොඩි ගස පැත්තට සිටින ලෙසය.
- වෙනත් කිසිදු කොඩියක් ජාතික කොඩියට වඩා ඉහලින් එසවීම නොකළ යුතුය. වෙනත් ජාතියකට අයත් කොඩි ඔසවන්නේ නම් ඒවාද ජාතික කොඩියට සමාන උසින්, වම් පසින් තිබිය යුතුය.
- කොඩි සියල්ල ප්‍රමාණයෙන් සමාන විය යුතු අතර කිසිදු කොඩියක් ජාතික කොඩියට වඩා විශාල නොවිය යුතුය.
- ජාතික කොඩිය පළමුව ඔසවා අන්තිමට පහත් කළ යුතුය.
- කිසිදු විටක ජාතික කොඩිය පොළොවට සමතලාව සිටින සේ හෝ තිරස් ලෙස රැගෙන නොයා යුතුය.
- ජාතික කොඩිය පෙරහැරක හෝ එවන් අවස්ථාවකට යොදා ගැනීමේදී එය දකුණෙන් ගෙන යා යුතු අතර වෙනත් කොඩි පෙළක්ද ඇත්නම් එම පෙළේ මැද ඉදිරියෙන් ජාතික කොඩිය ගෙන යා යුතුය.
- ආචාර පෙළපාලි වැනි අවස්ථාවලදී ගෞරව සම්මාන දැක්වීමක් ලෙස අනෙකුත් කොඩි පහත් කරනු ලබන නමුත් ජාතික කොඩිය විටෙක එසේ පහත් නොකළ යුතුය.
- ජාතික දින උත්සවය වැනි අවස්ථාවල ජනාධිපතිතුමන් ජාතික කොඩිය එසවන තෙක් ආරක්ෂක අංශ සාමාජිකයන් කොඩිය අල්ලාගෙන සිටිනු ඔබ දැක ඇත. ඒ ආකාරයට කොඩිය එසවීමට පෙර එය එහි ලකුණු වලට අමුණා උස් ස්ථානයක තැබිය යුතුය. නැතිනම් පෙර කී ලෙස කවුරුන් හෝ එය අතින් ඔසවාගෙන සිටිය යුතුය. කිසිම අවස්ථාවක, කිසිම හේතුවක් මත ජාතික කොඩිය බිම නොතැබිය යුතුය.
- ජාතික කොඩිය එල්ලා තැබීම සුදුසු නොවන අතර එය නිතරම ඔසවා තැබිය යුතුය. නැතිනම් ගොඩනැගිල්ලක් වැනි ස්ථානයක සිට කෝණාකාරව රැඳවිය යුතුය.
- ජාතික කොඩියක් ඔසවන අවස්ථාවේදී සියලු දෙනා තම අසුනෙන් නැගිට සිරුවෙන් සිටිය යුතු අතර කතා කිරීම, සිනාසීම ආදී වෙනත් කාර්යයන් හි නිරතවීම ජාතික කොඩියට කරන අගෞරවයකි. ජාතික කොඩිය ඔසවන අවස්ථාවේදී හක්ගෙඩි පිඹීම, මහුල්බෙර වැයීම කළ හැකි වුවත් වෙනත් සංගීත නාද පැවැත්වීම නොකළ යුතු අතරම කොඩිය ඔසවා අවසන් වූ වහාම ජාතික ගීය ගායනය හෝ වාදනය කළ යුතුය. එම අවස්ථාවේදී ආරක්ෂක අංශවල නිල ඇඳුමින් සැරසුන අය හැර අන් සියල්ලන්ම ජාතික කොඩියට මුහුණලා සිට ගැනීම හා හිස්වැසුම් ඉවත් කිරීම කළ යුතුය.
- මොනම හේතුවක් නිසා හෝ හානියට හා අවලක්ෂණයට පත්වූ, වර්ණ වෙනස් වූ කොඩියක් ප්‍රදර්ශනය නොකළ යුතුය.
- කිසිම අවස්ථාවක ජාතික කොඩිය සැරසිල්ලක් ලෙස යොදා නොගත යුතුය.
- මේසයක් මත මිස, එම මේසයේ සිට පහතට වැටෙන ලෙස ජාතික කොඩිය නොතැබිය යුතුය.
- පොළොව ස්පර්ශ වන ලෙස, ජලය මත ඇදීගෙන යන ලෙස ජාතික කොඩිය නොදැමිය යුතුය.
- ජාතික කොඩිය ඇඳුමක් හෝ සැරසිල්ලක් නොවන අතර එය ශරීරය වැසෙන ලෙස යොදා ගැනීම, ඇතිරිල්ලක් ලෙස යොදා ගැනීම නොකළ යුතුය.
- වෙනත් කිසිවක් ඔතා තැබීමට බඳුනක් ලෙස, මල්ලක් ලෙස ජාතික කොඩිය යොදා නොගත යුතුය.
- කිසිම ආකාරයක වෙළෙඳ දැන්වීම් ප්‍රචාරයක් සඳහා ජාතික කොඩිය ප්‍රයෝජනයට නොගත යුතුය.
- ඇඳුම්, ලේන්සු හෝ අත්පිස්නා ආදිය හැඩ කිරීමට ජාතික කොඩිය යොදා නොගත යුතුය.
- ජාතික කොඩිය ඔසවා ඇති කොඩි ගස ද වෙළෙඳ දැන්වීම් සඳහා යොදා නොගත යුතුය.
- වාහනයක, දුම්රියක හෝ බෝට්ටුවක වහලය මත, දෙපස හෝ පිටුපස ආවරණයට ජාතික කොඩිය යොදා නොගත යුතුය.
- ජාතික කොඩියක් හානි වූ අවස්ථාවක ගරුසරු නොමැති ලෙස කුණු ගොඩවල්වල නොදමා අප්‍රසිද්ධියේ එහි ගරුත්වය රැකෙන ලෙස විනාශ කර දැමිය යුතුය.
- එකම කොඩි ගසක ජාතික කොඩිය සමග තවත් කොඩියක් එසවීම නොකළ යුතුය.

අප නොදන්නා නමුත් ජාතික කොඩිය සම්බන්ධ වූ නීති රීති බොහෝය. දැන හෝ නොදැන රටේ ගෞරවය, අපේ අභිමානය කියා පාමින් අහසේ ලෙළදෙන ජාතික කොඩියට අප කළේ කොතරම් නිගරුවක්දැයි බලන්න. ඉදිරියේදී හෝ මේ අඩුපාඩුව මඟහරවා ගනිමින් ජාතික කොඩියට ලබා දිය යුතු නිසි ගෞරවය ලබා දීමට කටයුතු කිරීම අප සතු වගකීමක් බව මෙහිලා සඳහන් කරමු.

කපිතාන් එච්එම්සීඒකේ හේරත් ජආසේ
ජනාධිපති ආරක්ෂක සේනාව
අරලියගහ මන්දිරය

# ප්‍රාණ ඇපකරුවන් නිදහස් කර ගැනිමේ අවසන් මෙහෙයුම

මේ ලංකා දරණී තලය තුල වාසය කරන විවිධ වු ජන කොටස් වල මිනිසුන් විවිධ ආකාරයට අතිශය සැප සම්පත් වලින් පිරි සුඛිත මුදිත දිවි පෙවතක් ගත කරද්දි මෙම ඒකකයට පමණක් නොව සමස්ථ යුධ හමුදාවේම හටපිරිස් තම අවශ්‍යතාවයන් පසෙකලා දමමින් මෙම අවසන් ක්‍රියාත්විතයට ප්‍රවිෂ්ටවී ඇති බවනම් සදහන් කළ යුතුම වේ. මෙහිදි ඔවුන් මුහුණ දෙන අම්හිරි වුන් කටුක වුන් අවස්ථාවන් තුලින් වුවද හෙට දිනයේ මෙලොව එළිය දකින දු දරුවන්ට අගනා වටිනා ඒකීය දේශයක් නිර්මාණය කර දෙන්නට හැකි වන බව ඔවුන්ගේ හදවත් තුලට නැඹුරු වී ඇතුවා පමණක් නොව නවතම නව පීවයක් ඔවුන් වෙත ප්‍රතිනිර්මාණය කර දෙන්නට වෙර දරණ බවද අවිවාදයෙන් යුතුව සදහන් කල යුතු වේ.

කෙසේ වෙතත් 2009.05.06 දින වන විට මෙම අවසන් මානුෂිය මෙහෙයුමට පීවයක් දෙන්නට ශක්තිය ධෛර්ය ලබා දෙන්නට 59 වන සේනාංකය වෙත පැමිණ සිටි බ්‍රිගේඩියර් පි ප්‍රසන්න ද සිල්වා මැතිදුන්ගෙන් ලද උපදෙස් මත අප හට පිරිස් වලට සිදුවිය හැකි හානි අවම කර ගනිමින් සතුරාට එල්ල කල හැකි විස්මිත වුත්, දැවැන්ත වුත් ප්‍රහාරයක් එල්ල කර ත්‍රස්තවාදින්ගේ දරුණුතම ආරක්ෂක මරමස්ථානයක්ව පැවති නන්දිකඩාල් කලපු තිරයට සමගාමිව ඉදිකර තිබු ආරක්ෂක පස් බැම්ම සිදබිද දැම්මේ කාර්ය භාරය මෙම ඒකකය භාරයට පත්විය.

එහෙත් කාලයක් පැවති මාණුෂිය මෙහෙයුම ක්‍රියාත්මක කරමින් පැමිණි මෙම ඒකක හට පිරිස් පැතිකඩ දෙකකින් තම දක්ෂතා විද්‍යාමාන කර තිබිම මෙම කැදවිමට ප්‍රධාන හේතු සාධකය විය හැකිය. ඉන් පලමු වැන්න ත්‍රස්තවාදින් විශ්මයට පත් කරමින් පුරා වසර ගණනක් තිස්සේ ත්‍රස්තවාදයට යටත්ව යුධ හමුදා සෙබළුන්ගේ පිඩනයට ලක්ව තිබු "මුහමලේ" ත්‍රස්ත ආරක්ෂක පස්බැම්ම බිදදමා විනාශ කර අප හමුදාවන්හි ඉදිරි ගමන් මග සකස් කර දිම, දෙවැන්න වෙනුයේ වෙත්තලකේනි, කඩ්ඩෙයිකාඩු, පුන්ඩිකුලම්, වලෙයි වැනි ප්‍රදේශ හරහා යමින් මුහුදු තිරය ඔස්සේ ඉදිකර තිබු ත්‍රස්තවාදින්ගේ ඉදිරි ආරක්ෂක වැලි සහිත පස්බැම් ඉතා දක්ෂ අන්දමින් සටන්වැද විනාශ කිරිම බව සදහන් කළ හැකිවේ. මෙකී කරුණු කාරණා වලින් පරිණත වු මෙම ඒකකයට ඉහත දැක්වු අභියෝගය පැවරීම පුදුමයට කරුණක් නොවන බවනම් මෙහිලා සදහන් කළ යුතුම වේ.

දේශයේ ආරක්ෂාව මතින් සාමයේ සෙවණැල්ල එක්කර සමෘද්ධිමත් අනාගතයක් ලංකා වාසි සැමට ලංකර දෙන්නට දරන වෑයමේ අවසන් නිමේෂය වුවද මෙම ඒකයේ යුධ කුසලතාවයන් දැක්විමට අවස්ථාව සලසා දිම නිතැනින්ම වාසනා මහිමයක් ලෙසද නවත් පැත්තක් ඔස්සේ කරුණු දැක්විය හැකි වේ. පුරා මාස 03 කටත් වඩා වැඩි කාලයක සිට නන්දිකඩාල් කලපු තිරයේ ආසන්නයට පැමිණි 59 සේනාංකයට අයත් හටපිරිස් රැකවල්ලා ගෙන සිටින්නට ඇත්තේ අපගේ ඒකකය පැමිණෙන තෙක්ද යන්න කරුණු දැක්විය යුතු නොවුවද, සමස්ත යුධ හමුදාවේම කාර්යභාරය ලංකා දරණිතලය නිදහස් කර ගැනිම බව නම් මෙහිලා සදහන් කළ යුතු වේ. 55 සේනාංකයට අයත් 553 වන බළසේනාව යටතේ පාලනය වු මෙම ඒකකය මෙතරම් දක්ෂ ඒකකයක්ද යන වග වරෙක ඇතම් පිරිස් වෙත සිතෙන්නට ඇත. තවත් වරෙක මෙම බළඇණියේ අවසන් නිමේෂය මෙය බව සිතන්නට ඇත. ඒකී සියළු බලවේගයන් වල කරුණු කාරණා සියතින් ගත් මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් වයිඒබිඑම් යහම්පත් ආර්ඩබ්පි ආර්එස්පි පිඑස්සි ශ්‍රීලපාභ ගේ නිවරදි නායකත්වය යටතේ දෙවන අණදෙන නිලධාරි මේජර් එස්ඒයුඑ් සෝලංගආරච්චි පීඑස්සි ශ්‍රීලපාභ . ක්‍රියා හා පුහුණු භාර නිලධාරි මේජර් කේඒ පුෂ්පකුමාර ආර්එස්පි ශ්‍රීලපාභ විධායක අධිකාරි කපිතාන් ආර්එස්එස්ආර්එන් දෙහිපිටිය ශ්‍රීලපාභ, ඒකක බුද්ධි නිලධාරි එස්ඩබ් ප්‍රියංකර ශ්‍රීලපාභ යන නිලධාරින් මුලික වෙමින් මෙම කටයුතු වලට සම්බන්ධව ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කරන්නට කටයුතු සම්පාදනය කළා පමණක් නොව ඒ සදහා අවශ්‍ය කළමනාදිය 593 බළසේනා මුලස්ථානය වෙතින් හා 59 වන සේනාංකය වෙතින් පමණක් නොව යාබද ඒකක වෙතින්ද ලබාගනිමින් මුලික කටයුතු සැලසුම් කරන්නට විය. මේ අතරතුර ඒකක උපකරණ පාලක නිලධාරිව කටයුතු කරන ලුතිනන් (උපා) පිකේ පෙතන්ගොඩ ශ්‍රීලපාභ ගේද නොමසුරු දායකත්වය සැලසිම ඒකක හට පිරිස් වලට නවත් ශක්තියක් විය. එසේම ඒකක අණදෙන නිලධාරි තුමන් විසින් කණඩායම් භාර නිලධාරින් එක්කොට ඉදිරි සැලසුම් නව දුරටත් පැහැදිලි කර දෙමින් ඒකකයේ නාමය රෙජිමේන්තුවේ නාමය හා ගෞරවය ආරක්ෂා කරලිමේ භාරදුර කාර්ය මෙය බව පැහැදිලි කලේ ඒබව තම කණ්ඩායම් නිලධාරින් හා සියළුම සෙසුනිලයින් දැනුවත් කිරිමේ අදහසද ලබා දෙමිනි.

මැන ඉතිහාසයේ ලැබු යුධ ජයග්‍රහණ ඒකකයක් වශයෙන් ඉතා ඉහළ තලයක පවති. එය ශ්‍රීලපාභ රෙජිමේන්තුවටත් සමස්ත යුධ හමුදාවටත් ගෞරවයක් වනවා සේම අපගේ මේ මාතෘ භූමියටද කරන ලද උත්තරිතර සේවාවක් වනු නියතය.


2009.05.06 වන දින නන්දිකඩාල් කලපු තිරයට එන යන වාහන ප්‍රමාණය වැඩි විය. පැමිණෙන හට පිරිස් ප්‍රමාණය වර්ධනය විය. මෙතෙක් කාලයක් තිස්සේ එල්ටිටිඊ නායක වේලුපිල්ලේ පිරභාකරන් සහ ඔහුගේ සහචරයින්ගේ ග්‍රහණයට යටත්ව පැවති මෙම බළ ප්‍රදේශය අත්පත් කර ගැනිම ඉක්මන් කරගත යුතු වුවද. අප ඒකක හට පිරිස් වෙත එල්ල විය හැකි හානිකර තත්ත්වයන් අවම කර ගනිමින් යුධ හමුදා/සිවිල් දේපලද ආරක්ෂා වන අන්දමින් කටයුතු කර අවසන් ප්‍රාණ ඇපකරුවන් මුදා ගන්නා තෙක් කටයුතු කළයුතු බැවින්, මේ කී භාරදුර කාර්යයට නිවැරදි සැලසුම් සකස් කළ යුතු බව සියළුම අයවළුන්ගේ අදහස විය.

ඒකකයේ සිටින සියළුම නිලධාරින් සහ සෙසුනිලයින් වෙත පැවරුනු ඒක් එක් රාජකාරින් නොපිරිහෙලා ඉටු වෙද්දි නන්දිකඩාල් කලපුවේ ජලය මුහුදට සේන්දු වන ස්ථානයේ සිට ඉදිරියට යුධ අගල් ඉදිකිරිමේ කටයුතු ආරම්භ කරන්න විය. මේ සදහා ඒකක ක්‍රියා හා පුහුණු භාර නිලධාරි මේජර් කේඒ පුෂ්පකුමාර ආර්එස්පි පිඑස්සි ශ්‍රීලපාභ ගෙන් ලද උපදෙස් පැසසුමට ලක්කල යුතු වේ. නි/65058 කපිතන් ආර්එස්කේ රත්නායක ශ්‍රීලපාභ ගේ නායකත්වයෙන් යුතු "සී" කණ්ඩායම් හට පිරිස් මෙම කාර්ය ඉටුකිරිමේහිලා 2009.05.06 වන දිනට පහන් වන තුරු රාත්‍රිය නිදි වර්ජිතව ගත කරන්නට විය. යළිදු 2009.05.07 දිනට රැය පහන් කරන්නට නි/64523 කපිතාන් ආර්එච්එම්එස් රාජකරුණා ශ්‍රීලපාභ ගේ නායකත්වයෙන් යුතු "ඒ" කණ්ඩායම් හට පිරිස්ද, 2009.05.08 දින නි/65734 කපිතාන් එච්ඒච්සිජේ හපුආරච්චි ශ්‍රීලපාභ ගේ නායකත්වයෙන් යුතු "බී" කණ්ඩායම් හට පිරිස්ද 2009.05.09 වන දින නි/64947 කපිතන් පිඩිඑස්පි සේනානායක ශ්‍රීලපාභ ගේ නායකත්වයෙන් යුතු මෙම ඒකක ඩී කණ්ඩායම හට පිරිස්ද වශයෙන් රාත්‍රිකාලයන් නිදි වර්ජිතව සිටිමින් මෙකී ක්‍රියාදාමයේ ශ්‍රමිකයන් බවට පත්වෙමින් "සිල්පර", රැලි තහඩු, බැරල් තහඩු, කන්සිටිනා, බාබ් වයර් ආදිය කොටගත් අමද්‍රව්‍යයන් උපයෝගි කර ගනිමින් අංක 61 සහ අංක 62 යනාදි වශයෙන් යුධ අගල් දෙකක් සකස් කරන්නට වුයේ ත්‍රස්තවාදින්ගේ දැත් බැදි දමා මෙන් විය. මේසා විශාල පරිශ්‍රමයක් දරමින් දේශයේ ස්වකීය නිදහස වෙනුවෙන් හෙලන දහඩිය දරන මහන්සිය කෙතරම්ද යන්න ඒ දෙස බලා සිටින්නෙකුටත් නොදැනෙනවා විය හැකිය. මේ අතර, යුධ මුක්ත කලාපයෙන් මහ සයුර දෙසට වන්නට නවතා තිබු පාරා III නෞකාව ත්‍රස්තවාදින්ගේ මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත්කරගෙන සිටි අතර, මෙම නෞකාවේ සවිකර ගෙන සිටි අධි ස්වංක්‍රිය (පැටල් ගන්) අවි වලින් එල්ල වන ප්‍රහාරයන් මෙසේ යුධ අගල් සකස් කරන සෙබළ පිරිස්හි හිස්වලට ඉහළින් පුපුරා යද්දි කිහිපදෙනෙකුට තුවාල සිදුවුවද. ඒකකය යා යුතු ගමන් මග අසුරා තබන්නට හෝ වළක්වාලන්ට ඔවුන්ට නොහැකි විය. 2009.05.12 වන දිනය මෙම ඒකකයේ සැබවින්ම තීරණාත්මක දිනයක් බවට පත්විය. මුළු මහත් ලක්වැසි සැමගේ පමණක් නොව ලෝකයේ විවිධ රටවල් බලා සිටියේ ත්‍රස්තවාදින්ගෙන් ග්‍රහණයට නතු වී සිටින ප්‍රාණ ඇපකරුවන් බේරාගෙන ත්‍රස්තවාදින් විනාශ කර උතුම් දේශයට සාමය ළගා කරන තෙක් විය යුතුය. මෙය මල්ඵල ගැන්විමේ ක්‍රියාදාමයේ නිරතව සිටින මෙම ඒකක වීර හට පිරිස තම මහගු කාර්යයට මුල පිරුවේ තම පීවිතය වුවද පරදුවට තබා මෙම දේශයේ නිවහල් භාවය ආරක්ෂා කිරිමේ උත්තරිතර සිතුවිල්ල තම හදවත් වලට එක්කර ගනිමින් යන්න නිරායාසයෙන්ම සදහන් කළ හැක.

නි/65625 කපිතාන් කේවිබිටි කොඩිතුවක්කු ශ්‍රීලපාභ ගේ අණදිම යටතේ (කුඩා කාලතුවක්කු බළඇණිය ලෙසින් විරුදාවලිය ලත්) මෙම ඒකක ආධාරක කණ්ඩායම, අංක 01 ලෙසත් සෙ/15900 බනි II දයාරත්න කේඩිඑම්එල් ගේ නායකත්වයෙන් යුතු ඒකකයේ (දෙවන කාලතුවක්කු බළඇණිය නමින් විරුදාවලිය ලත්) 60 මිමි මෝටාර් අවි ඛණ්ඩයත් මෙම ක්‍රියාන්විතයට මනා ශක්තියක් විය. මේ අතර අනෙකුත් කණ්ඩායම් වල



හට පිරිස් ඔවුන් විසින්ම සකස් කර නිර්මාණය කර ගන්නා ලද යුධ අගල් ඔස්සේ සෙමෙන් සෙමෙන් ආරක්‍ෂා සහිතව ත්‍රස්තවාදීන්ගේ ආරක්‍ෂක පවුර ආසන්නයට පැමිණියේ ඉතා හොර රහසේය. එයින් පිළිබිඹු වුයේ යුධ පිටියක දැක්විය යුතු යුධ ශිල්ප මනාව තේරුම් ගෙන ඔවුන් මෙම කාර්ය සඳහා පෙළගැසි සිටින බව වේ. මෙසේ ත්‍රස්තවාදීන්ගේ ආරක්‍ෂක පස් බැම්ම ආසන්නයට පැමිණි මෙම ඒකක වීර සෙබළ පිරිස එක් නිමේෂයකදී අකුණු සැර විදින්නාක් මෙන් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළේ සතුරු ත්‍රස්තවාදීන්ගේ සිත්පිත් මවිත කරවමිනි. එසේ නොනවත්වා එල්ල වුන දැවැන්ත ප්‍රහාරය හමුවේ හිස එසවීමට තරම්වත් අවස්ථාවක් නොලද ත්‍රස්තවාදීන් ඔවුන් විසින් ඉතා සුක්‍ෂම ලෙස තනා තිබු මුර කුටි සහ යුධ අගල් තුලට වී සිටින්න ඇති බවට පසුව දුටු දර්ශන වලින් දැනගන්නට ලැබිණි. මෙම ප්‍රහාරය අතරතුර "බි" කණ්ඩායම් සෙබළ පිරිසත් සෙමෙන් ඉදිරියටම ඇදුන අතර, බි කණ්ඩායම් නිලධාරී අණදෙන වශයෙන් කටයුතු කල කපිතාන් එච්ඒච්සිජේ හපුආරච්චි ශ්‍රීලපාහ ගේ පරිනත නායකත්වය තුලින් ධෛර්යමත් වී ත්‍රස්තවාදීන්ගේ ඉලක්කයන් සොයා දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන්ට විය. ආරක්‍ෂා සහිතව තනා තිබු ත්‍රස්තවාදී මුරකුටි සහ යුධ අගල් වලට එල්ල කල අත්බෝම්බ ප්‍රහාර සහ ආර්පිජී බෝම්බ ප්‍රහාර වලින් ත්‍රස්ත සාමාජිකයින් එම ස්ථාන වලම මියයන්නට විය. ඈත ත්‍රස්ත සීමාවේ සිට නවීන තාක්‍ෂණ ක්‍රම උපයෝගි කර ගනිමින් සකස් කර තිබු අවි ආයුධ වලින් ත්‍රස්තයන් ප්‍රහාර එල්ල කළද, මෙම හට පිරිස් ත්‍රස්තවාදීන්ගේ පළමු පස් බැම්ම බිඳ හෙලු අතර, මේ සඳහා කපිතාන් රත්නායක ශ්‍රීලපාහ ගේ නායකත්වයෙන් යුතු මෙම ඒකක සී කණ්ඩායම් හට පිරිස්ගෙන් ලද අපිරිමිත සේවාව වචනයෙන් පැහැදිලි කළ නොහැකි තරම් වේ. තම කණ්ඩායමේත්, ඒකකයෙත්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවේත් පමණක් නොව සමස්ත යුධ හමුදාවේම ගෞරවය දිනා ගනිමින් හෝරා කිහිපයක දරුණු සටනකින් පසු ඒකකයට පැවරි තිබු බැරෑරුම් කාර්ය භාරය ඉටු කලේ සැබවින්ම මෙම දේශය එක්සේසත් කරලීමේ අවසන් අධියරට අයත්ව තිබු වැදගත්ම ක්‍රියාවලිය මෙය බව මෙසේ සනිටුවහන් කරමිනි. එදා මෙදා තුර ඒකක ඉතිහාසයේ පමණක් නොව ශ්‍රීලපාහ රෙජිමේන්තු ඉතිහාසයේද, මෙය සනිටුහන් කර තබන්නේ නම් එය ඉතා වැදගත් වන බව මෙහිලා සඳහන් කළයුතු වැදගත් කරුණක් වේ.




ලංකා වාසි ජනතාවගේ අවධානයට නතුවී තිබු අවසන් ප්‍රාණ ඇපකරුවන් මුදවා ගැනීමේ කාර්ය මෙම ඒකකයේ ඊළඟ අභියෝගය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් බාධක දෙකක් මුල්වී තිබු අතර, ඉන් පළමුවැන්න ඉහත කී පරිදි මෙම ඒකක හට පිරිස් විසින් ඉටුකර දුන් අතර, අනෙක් වැදගත් කරුණ වුයේ නන්දිකඩාල් කලපුතීරය ඔස්සේ දිවෙන පාලම පිළිසකර කර සිවිල් වැසියන් ගෙන්වා ගැනීමේ කටයුත්ත පහසු කර ගැනීම විය. මේ සඳහා සියළු ආරක්‍ෂක කටයුතු සලසා දෙමින් 11 වන කාරක ඉංජිනේරු බලකායට එකී කාර්ය පවරා දී තිබු අතර, ඔවුන් යුහුසුලුව ක්‍රියාත්මක වී ඉතා කෙටි කාල පරාසයක් තුල එකී කාර්ය ඉටු කර දෙන්ට ක්‍රියාකිරීම තුලින් සිවිල් දමිළ පිරිස්හි පැමිණීම ඉතා ඉක්මන් කර ගන්න හැකියාව සැලසිණි. එයින් නොනැවතුනු මෙම ඒකක හට පිරිස් ඉහත කී පරිදි සකස් කළ පාලම ඔස්සේ යමින් වඩ්ඩුවාකල් ප්‍රදේශයට අවතීර්ණ වෙමින් භූමියේ බලය තව දුරටත් තහවුරු කර ගන්නට කටයුතු කරන ලදි. අවට මුළු ප්‍රදේශයම සෝදිසි කර ගනිමින් ආරක්‍ෂක පවුරක් සකස් කරගෙන මෙම ප්‍රදේශය තුලින් ත්‍රස්තවාදීන්ගේ අවසන් බිම් කොටස දක්වා ගමන් ගැනීමට අවශ්‍ය සියළු කටයුතු සැලසුම් කර සකස්කර ගැනීමටද මෙම හට පිරිස් විසින් කටයුතු කරන ලදි.

මෙසේ නිදහස් කර ගන්නා ලද භූමි ප්‍රමාණය කෙරෙහි නතු දැනගත් ත්‍රස්තවාදීන් යටතේ සිටි ප්‍රාණ ඇපකරුවන් ත්‍රස්තවාදීන් විසින් මිනිසුන් පැනයාම වළකාලන්නට යොදවා සිටි ආරක්‍ෂක නියාමකයන් හට ප්‍රහාර එල්ල කරමින් දහස් සංඛ්‍යාත මිනිස් පවුරු මෙම හමුදා බළ ප්‍රදේශය වෙත පැමිණියේ වසර ගණනක් තිස්සේ විවිධාකාර වු දුක් ගැහැට මධ්‍යයේ ජීවත් වු දුක්බිත තත්ත්වයෙන් මිදි බව මෙහිදි පැහැදිලිව ප්‍රකාශ කළ හැකි වේ. එසේ ඇරඹුනු ප්‍රාණ ඇපකරුවන් පැමිණීම පුරා දින දෙකක් මුළුල්ලේ අඛණ්ඩව සිදු වු අතර, මෙහිදි පැමිණි සංඛ්‍යාව ලක්‍ෂයකට නම් වැඩිවන බව පැහැදිලි වේ. මෙම කාර්ය භාරය ඉටුකිරිමේහිලා ඒකක හට පිරිස් ඉමහත් සේවාවක් ඉටුකළ අතර, මේ තුලින් ත්‍රස්තවාදීන්ගේ භයංකාර භූමිකාව සිදබිඳ යන අයුරු ඉදිරි දින දෙක තුන තුල දැකගන්ට හැකිවන බව නිර්මාණය කරන්ට අපගේ වීර සෙබළ පිරිසට හැකි වු බව සනිටුහන් කරනුයේ ඉතා ආඩම්බරයෙනි.

ලෝකයේ ප්‍රාණ ඇපකරුවන් එකවර මේසා විශාල සංඛ්‍යාවක් මුදවා ගනිමින් තබා ඇති මෙම වාර්ථාව ලෝක ඉතිහාසයටද එක් විය යුතු බව සඳහන් කරන අතර, මේ සඳහා දායකත්වය සැලසු ලංකා වාසි සියල්ලන්ටම ත්‍රිවිධ රත්නයේ පිහිට හා ආශිර්වාදය නිරන්තරයෙන්ම හිමි ගැන්වෙන බව සඳහන් කරමි. ලංකා මාතාවත්, උතුම් ධර්මයත්, ආරක්‍ෂා කර ගනිමින් දේශයේ අභිමානයට නව ජීවයක් දුන් ඒකක සියළුම නිලධාරි සහ සෙසුනිලයින්ටත් සිවිල් සේවක මහතුන් සැමටත් ලක්මාතාවගේ කෘතඥතාවය හිමි විය යුතු අතරම, මෙකී කාර්යභාර්ය ඉටුකිරිමේහිලා කුරිරු ත්‍රස්තවාදීන්ගේ වෙඩි ප්‍රහාර හේතුවෙන් මියගිය සියළුම අයවළුන්ට නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමු. තුවාල ලබා රෝහල් ගත කර ඇති සැමට ඉක්මන් සුවය ලැබේවායිද නිරතුරුවම ප්‍රාර්ථනා කරමු. දේශයටත් ජාතියටත් නිදහස් ස්වෛරීත්වය නිර්මාණය කර දුන් සියළු විරුවන්ට යෝධ බල යෝධ ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය, මුලස්ථානය 6 ශ්‍රීලපාහ,

---

**නොපෙනෙන දෙවිඳුන්**
**රට රැක දුන් අප රැක දුන්**
**මේ විරු දෙවිඳුන්**
**රැක දෙන්න. අපම අප රටට එයයි**
**මේ දෙරණේ ජීවත්වන අප සියලු ශ්‍රී**
**ලාංකිකයන්ගේ එකම පැතුම....**

රණ විරුවනට තුති

සදාදරණීය සෙබළ පුතුනේ දියණියනේ රතු ලේ කිරි කරමින් පොවා උස් මහත් කළ මවත් දහඩිය සිරුරෙන් මිහිකතට හෙලා නුඹලා පෝෂණය කළ පියාත් දිවි ඇති තෙක් සැම තත්පරයකම දෙනෙත් අයාගෙන බලා සිටින්නේ ඔබලා ඇස ගැටෙන මොහොතයි. එකම බලාපොරොත්තුව ඔබලායි. අපට රට රැක දෙන්න මානුෂිය මෙහෙයුමෙන් ලෙයින් මිහිකත තෙමා විරෝදාරව මිය ගිය පුතේ දුවේ අප කළ සියලු පින් දහම් නුඹලාටයි. එයින් නිවනේ දොරටු ඇරේවා.

සිරිලකම රැක දුන් අතිගරු මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිතුමාද සියල්ල ඒකරාශි කර හමුදා සියලු නායකතුමන්ලාද ආරක්‍ෂාව සැලසු පොලිසියද අපට රටක් තබා ආබාධිත දුපුතුන් ද කුසට අහරක් ගතට සැනසිල්ලක් ඇසට නින්දක් නැතිව අව් වැසි සුළං වලින් දුක් කම්කටොලු විඳ රටේ සියලූ දිසා රැක දුන් නුඹලායි පුජනිය අපේ දෙවිවරු.

රටම රැක දුන් සියලු ජාතින් රැක දුන් අපට රටක් ඉතිරි කළ විරු දූපුතුනේ නුඹලාටයි සිරිලක සියලු දෙනාගේ පුජනිය ගෞරවය හිමිවේවා! නොපෙනෙන දෙවිඳුනේ මේ රට රැක දුන් අප රැක දුන් පුජනිය මේ දෙවිඳුන් දේව දියණියන් රැක දෙන්න සැමදා අප සැමට.

ජීජී ධනපාල හබුරුගල, බෙන්තොට
(8 ශ්‍රීලපාහ ලාකෝ පුෂ්ප කුමාරගේ බිරියගේ පියා)



# වන්නි මානුෂීය මෙහෙයුමේ දායකත්වය 10වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව

නැගෙනහිර ප්‍රදේශයෙන්ම එල්ටීටීඊ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මුලුනුපුටා දමමින් එම ප්‍රදේශය මුදවාගැනීමත් සමගම සමස්ත නැගෙනහිර ප්‍රදේශයම රජයේ පාලනය යටතට ගෙන සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමෙන් පසු උතුරු ප්‍රදේශයද මුදවා ගැනීමේ අරමුණින් වන්නි මානුෂිය මෙහෙයුම ආරම්භ කිරීමට රජය විසින් තිරණය කරන ලදී. එම තිරණය අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාබල බළඇණි ඒකරාශි කරමින් යුද්ධ හමුදාධිපති තුමාගේ නියෝග මත ප්‍රහාරක සේනාංකයන් ස්ථාපනය කර ත්‍රස්තවාදය මුලුනුපුටා දමමින් සියලූ ලක්වැසියන් හට සාමයෙන් පිරි දේශයක් ගොඩනැගිමේ ඒකායන පරමාර්ථයෙන් යුතුව මෙම මෙහෙයුම ආරම්භ කරන ලදී. එහිදී ප්‍රථම ප්‍රහාරක සේනාංකය වශයෙන් 57 වන සේනාංකය ස්ථාපනය කරන ලද අතර එම සේනාංකය යටතේ 573 බළසේනාවට අනුයුක්තව මෙම වන්නි මානුෂිය මෙහෙයුමේ ආරම්භක බළඇණිය වශයෙන් 2007 මාර්තු මස 01 දින සිට ඕමන්තේ බටහිර දෙසින් තම මෙහෙයුම් ආරම්භ කලහ. පාබල හමුදා රෙජිමේන්තුව තුල පාලන රාජකාරි මෙන්ම ක්ෂේත්‍ර රාජකාරීන් සම්බන්ධයෙන් හසල අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන ලූතිතන් කර්නල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පි ශ්‍රීලපාභ යන නිලධාරිගේ අණාදීම යටතේ ඕමන්තේ බටහිර ප්‍රදේශයෙන් වන්නි මානුෂිය මෙහෙයුමේ ගමන් ආරම්භ කළ මෙම ඒකක භට පිරිස් ත්‍රස්තවාදින්ගේ යුධ උපායන් අසාර්ථක කරමින් ඔවුන්ට දැඩි ලෙස හානි පමුණුවමින් දිනෙන් දින පියවරෙන් පියවර ඉදිරියට ගමන් කලහ. ත්‍රස්තවාදි බලකොටු එකිනෙකින් අත්පත් කර ගනිමින් ඔවුන්ගේ









යුධ මරමස්ථාන වලට පහර දෙමින් ඉදිරියට ගමන් කළ අප කිතුණු බැතිමතුන්ගේ හදවත බදුවූ සියලූ ලොවැසියන්ගේ අවධානයට ලක්ව තිබූ ඓතිහාසික මඩු දේවස්ථානය මුදවා ගැනිමේ ඉලක්කය සපුරා ගැනිම සඳහා දායකත්වය ලබාදීම පිණිස 572 බළසේනාව යටතේ තම්පනේ ප්‍රදේශයේ 2007.09.06 දින ස්ථානගත වන ලදී.

කිතුණු බැතිමතුන්ගේ වන්දනාමාන කරනු ලබන මරද මඩු මෑණියන් තැන්පත් කර ඇති මඩු පල්ලිය ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයක් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද ප්‍රසිද්ධියක් ලබා තිබීම නිසා මෙම මඩු පල්ලිය ත්‍රස්තවාදින්ට වඩාත් වැදගත් ස්ථානයක් විය. දේවස්ථාන භූමියේ අණසක පැතිරීමට සියළු ප්‍රයත්නයන් දැරූ ත්‍රස්තවාදින් රජයේ හමුදාවන්ගේ ආගමනය වලක්වාලීම පිණිස උපරිම බලය යොදමින් දැවැන්ත ප්‍රහාරයන් එල්ල කිරිමට කටයුතු කරනු ලැබූහ. එම දැවැන්ත ප්‍රහාරයක් එල්ල වෙතැයි උපකල්පනය කර තිබූ මෙම ඒකක භට පිරිස් ඊට සාර්ථකව මුහුණ දිම පිණිස කල්වේලා ඇතිව සැලසුම් කර ගෙන තිබූ යුධ උපක්‍රම හා යුධෝපායන් එම අවස්ථාවේ ප්‍රායෝගික වශයෙන් යොදා ගනිමින් ඔවුන්ට සිතා ගැනිමටවත් අල්ප මාත්‍රයක් හෝ ඉඩක් නොතබා සතුරාගේ සියලූ අභිප්‍රායන් අසාර්ථක කරමින් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කර වල දමා තිබූ පුද්ගල නාශක බිම් බෝම්බ සහ ඔවුන් විසින් අටවා තිබූ මර උගුල් ආදිය ඉවත් කරමින් සිරුවෙන් ඉදිරියට ගමන් කළ අප භට පිරිස් ත්‍රස්තවාදීන්ගේ බලකොටු වන තම්පනේ, පෙරියතම්පනේ සහ පෙරියපණ්ඩිවර්විචාන් යන ප්‍රදේශයන් ක්‍රමානුකූලව අපගේ භට පිරිස් විසින් ත්‍රස්තවාදීන් හට බරපතල ලෙස සම්පත් හානි සහ ජිවිත හානි ගෙන දෙමින් මුදවා ගැනිමට හැකිවීම මෙම වන්නි මානුෂිය මෙහෙයුමේදී ඒකකය ලද විශිෂ්ට ජයග්‍රහණයක් බැව් මෙහිලා සදහන් කරමි. මෙම ජයග්‍රහණයත් සමගම ත්‍රස්තවාදීන් ශාරීරික මෙන්ම මානසිකවද මහත් පසුබෑමකට ලක්ව තිබූ අතර, ඔවුන්ගේ සියලූ පාලන කටයුතු වියවුල් තත්ත්වයකට පත්ව තිබුණද, තවදුරටත් මඩු දේවස්ථානය තමන් යටතේ තබා ගැනිම සදහා අසාර්ථක උත්සාහයක යෙදී සිටියහ. ත්‍රස්තවාදින්ගේ මෙම වියවුල් තත්ත්වය වටහා ගත් අප භට පිරිස් ඔවුන්ට දැඩි ප්‍රහාරයන් එල්ල කරමින් කිතුණු බැතිමතුන්ගේ



මුදුන් මල්කඩක් බඳුවූ ඓතිහාසික මඩු දේවස්ථානය 2008.04.23 දින ත්‍රස්තවාදී ග්‍රහණයෙන් සම්පූර්ණයෙන්ම මුදවා ගැනීමට දායක වීමට හැකිවීම මෙම ඒකකය ලද ඓතිහාසික ජයග්‍රහණයකි. මෙම ඓතිහාසික ජයග්‍රහනයේදී 572 බළසේනා මූලස්ථානයට අනුයුක්තව කටයුතු කරනු ලැබූ අප සහෝදර බළඇණි වන 7 ශ්‍රිලපාහ හා 7 ශ්‍රිලංසිරෙ ඒකකයන්හි නොමඳ සහයක් අප බළඇණිය වෙත ලැබුණු බව නිහතමානිත්වයෙන් යුතුව සඳහන් කරමි. ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් කටයුතු කරනු ලැබූ ලූතිතන් කර්නල් ටිපේ කොඩිතුවක්කු ආර්ඩබ්පි ශ්‍රිලපාහ ගේ නිවැරදි මග පෙන්වීම යටතේ මෙම ඒකකය වෙත පවරා තිබූ ඉලක්කය සාර්ථකව හා ජයග්‍රාහී ලෙස නිමා කරන්නට හැකි වූ අතර මඩු දේවස්ථාන භූමිය තුලද ත්‍රස්තවාදීන්ගේ අවි ස්ථානගත කර අප භට පිරිස් වෙත ප්‍රහාරයන් එල්ල කර අප භට පිරිස්හි ප්‍රති ප්‍රහාර වලින් මඩු දේවස්ථානයට අලාභහානි කරවීමේ ඔවුන්ගේ අසාර්ථක උත්සාහයද ජයග්‍රහණය කිරීමට හැකිවීම තුලින් යුධ හමුදාව ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත්වීම හා කිතුණු බැතිමතුන්ගේ දෝෂාරෝපණයට ලක් කිරීමට ගත් උත්සාහයද අසාර්ථක කරමින් මඩු පල්ලියට කිසිදු හානියක් නොවී ත්‍රස්තවාදීන් පළවා හැරීමට අපට හැකි වීම සමස්ත ක්‍රිස්තියානි ජනතාවගේ නොමඳ පැසසුමට ලක්වීමට හේතු වී ඇත.

ත්‍රස්තවාදීහු මඩු පල්ලිය අතහැර පාලම්පිඩ්ඩි දෙසට පසු බසින්නට වූහ. මෙහිදී අප භට පිරිස් ක්‍රමානුකූලව තම මෙහෙයුම් කඩිනම් කරමින් පාලම්පිඩ්ඩි මුදවා ගැනීම සඳහා යුහුසුලු වන ලද අතර ඒ සඳහා 8 ශ්‍රිලපාහ ඒකකයද 572 බළසේනාව සමගින් අනුයුක්ත වී පාලම්පිඩ්ඩි මුදවා ගැනීම සඳහා දායක වන ලදී. ත්‍රස්තවාදීන්ට දැඩි පරාජයක් ගෙන දෙමින් පාලම්පිඩ්ඩි ප්‍රදේශය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුලුමනින්ම මුදවා ගත් අතර, මෙහිදී අප බළඇණිය මෙම වන්නි මානුෂිය මෙහෙයුමේදී ප්‍රථම වරට ත්‍රස්තවාදීන් විසින් පවත්වාගෙන යනු ලැබූ පුහුණු පාසලක් ඇතුළු ත්‍රස්තවාදී කඳවුරු සංකීර්ණයක් අත්පත් කර ගැනීමට හැකි වන ලදී. ත්‍රස්තවාදීන් විසින් මනා සැලැස්මකින් යුතුව ඉදිකර තිබූ මෙම කඳවුරු සංකීර්ණය තුල වෛද්‍යාගාරයක්, රට අංගනයක්, මුලුතැන්ගෙයක් හා හිස් ආවරණ සහිත සකස් කරන ලද බංකර් 20කට අධික සංඛ්‍යාවක් ඉදිකර තිබුණි.

තව දුරටත් 57 සේනාංකය යටතේ ක්‍රියාත්මක වී පාලම්පිඩ්ඩි ප්‍රදේශය අත්පත් කර ගැනීමත් සමගම මන්නාරම් ප්‍රදේශයෙන් වන්නි මානුෂිය මෙහෙයුමේ ගමන් ආරම්භ කරන ලද 58 සේනාංක භට පිරිස්ද තම අභියෝග ජයගනිමින් එම ප්‍රදේශයට පැමිණීමත් සමගම අප භට පිරිස් හා ඒකාබද්ධ වන ලදී. ඒ සමගම තව දුරටත් එම සේනාංක වෙන් වශයෙන් තම මෙහෙයුම් ඉදිරියට දියත් කරනු ලැබූ අතර, මෙම ඒකක භට පිරිස් කල්ලිවිලාන් සහ විරඩ්ඩිකුලම් යන ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවැති ගම්මාන මුදවාගනිමින් මෙරටේ තිරසාර සාමයක් ස්ථාපිත කිරීමේ ඉලක්කය කරා ජයග්‍රාහී මාවතේ ඉදිරියටම ගමන් කරන්නට වූහ. මෙහිදී ඒකකයේ අණදෙන නිලධාරි හා භට පිරිස් නිර්භිතව නොපසුබට උත්සාහයෙන් යුතුව ත්‍රස්තවාදීන්ට සුලු විවේකයක් ලබා ගැනීමට පවා ඉඩක් නොතබා ස්වභාවික බාධකයන්ද ජයගනිමින් ඔවුන් අටවා තිබූ මරළගුල් මග හරිමින් වන්නි මානුෂිය මෙහෙයුමේ තුණුක්කායි නගරය අත්පත් කර ගැනීමේ ඉලක්කය කරා ගමන් කරන්නට වූහ.

මෙහිදී අප බළඇණියට මෙන්ම සෙසු සහෝදර බළඇණි වලට නව අභියෝගයකට මුහුණ දීමට සිදුවිය. මාන්කුලම් සිට තුණුක්කායි දක්වා දිවෙන මාර්ගය සහ වෙල්ලන්කුලම් සිට තුණුක්කායි දක්වා වන මාර්ගයන් සම්බන්ධවන තුණුක්කායි මන්සන්දිය ත්‍රස්තවාදීන්ට ඉතාමත් වැදගත් ප්‍රදේශයක් වූ අතර, ඔවුන්ගේ ප්‍රධාන සැපයුම් මෙම මාර්ගයන් ඔස්සේ සිදුකිරීම ඊට හේතු සාධක විය. එම මංසන්දිය ඔවුනට අහිමි වුවහොත් විශාල භූමි ප්‍රදේශයක් අතහැරීමට සිදුවෙනවා මෙන්ම ඔවුන්ගේ පාලන කටයුතු සිදුකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් ත්‍රස්තවාදී කටයුතු සිදුකිරීමේදී මහත් අසීරුතාවයකට මුහුණ දීමට සිදුවන බැවින් කෙසේ හෝ මෙම ප්‍රදේශය රැක ගනිමින් විරෝදාර හමුදාවන්ගේ ඉදිරි ගමන අඩාල කිරීම සඳහා විශාල පස් බැම් ඉදිකර ඉදිරි ගමන නවතාලිමට උත්සාහ කර තිබුණි. මෙම ප්‍රදේශය අත්පත් කර ගැනීමේදී මෙම ඒකකයට තිබුණ වෙල්ලන්කුලම් සිට තුණුක්කායි මන්සන්ධිය දක්වා දිවෙන මාර්ගය අත්පත් කර ගැනීමේ ඉලක්කයයි. මෙම අභියෝගය ඉතාමත් සාර්ථකව අප පස්බැම්ම පමණක් නොව තුණුක්කායි මන්සන්ධිය හා එම ප්‍රදේශය අත්පත් කර ගැනීමට හැකි විය. මෙහිදී ත්‍රස්තවාදීන් විශාල සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වූ අතර, පසුව කල පරීක්ෂාවේදී ඔවුන් සතුව තිබූ අවි ආයුධ විශාල ප්‍රමාණයක් සහ ත්‍රස්තවාදී මළසිරුරු විශාල ප්‍රමාණයක් සොයා ගැනීමට හැකි වූහ. අනෙක් ත්‍රස්තවාදීහු එම ප්‍රදේශය අතහැර දමා පසුබසින්නට වූ අතර අප ඒකක භට පිරිස් විසින් පලායන ත්‍රස්තවාදීන්ටද ප්‍රහාර එල්ල කරමින් උයිලංකුලම ගම්මානයද අත්පත් කර ගැනීමට කටයුතු කරන ලදී.

මෙම වන්නි මානුෂිය මෙහෙයුමේදී ඒකකය වෙත පැවරී තිබූ සුවිශේෂි මෙන්ම ප්‍රධාන කාර්යභාරයක් වූයේ වසර 15කටත් අධික කාලයක් ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවැති කොකාවිල් රූපවාහිනී සම්ප්‍රේක්ෂණාගාරය පිහිටි ප්‍රදේශය මුදවා ගැනීමේ කාර්යයයි. මෙම රූපවාහිනී සම්ප්‍රේක්ෂනාගාරය ත්‍රස්තවාදීන් වෙත අතිශයින් වැදගත් ස්ථානයක් වූ අතර, කොටින්ගේ ගුවන් විදුලි ජාලය සම්ප්‍රේක්ෂණය කිරීම සඳහා මෙම කුලුණු උපයෝගි කරගෙන තිබීම ඊට ප්‍රධාන හේතුවක් විය. එමෙන්ම භූගෝලිය පිහිටීම අනුව එම ස්ථානය උසකින් පිහිටා තිබීම හේතුවෙන් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වශයෙන්ද මෙම භූමි ප්‍රදේශය උපක්‍රමික වශයෙන්ද ඔවුනට ඉතාමත් වැදගත් ස්ථානයක් විය. එම ස්ථානය අනෙක් ප්‍රදේශයන්ට වඩා උසකින් පිහිටීම නිසා ප්‍රහාරයන් එල්ල කිරීම ඉතාමත් අසීරු කටයුත්තක් වූ අතර, මෙම ප්‍රදේශයේ ඇති වැදගත්කම අනුව එය කෙසේ හෝ රැක ගැනීමේ අරමුණින් හමුදා භට පිරිස්හි ඉදිරි ගමන වලක්වා ලීම පිණිස ත්‍රස්තවාදීන් විසින් ප්‍රථම වරට අප ඒකක භට පිරිස් වෙත ගෑස් ප්‍රහාරයන් එල්ල කළහ. ත්‍රස්තවාදීන් විසින් ගෑස් භාවිතා කිරීම හේතුවෙන් ගෑස් ආවරණ භාවිතා කරමින් ඉදිරි ක්‍රියාන්විතයන් සැලසුම් කරන්නට සිදුවීම අසීරු කටයුත්තක් වුවද එම අභියෝගයන්ටද සාර්ථකව මුහුණ දෙමින් ත්‍රස්තවාදීන්ට දැවැන්ත ප්‍රහාරයන් එල්ල කර ඔවුන්ට දැඩි ජීවිත හානි සහ සම්පත් හානි ගෙනදෙමින් 2008 නොවැම්බර් 15 වන දින ත්‍රස්තවාදීන් කොකාවිල් ප්‍රදේශයෙන්ද පලවා හැර කොකාවිල් රූපවාහිනී සම්ප්‍රේක්ෂණා ගාර මධ්‍යස්ථානය හා එම මධ්‍යස්ථානයට ඉදිරියෙන් ඇති ඒ 9 මාර්ගයේද බලය අත්පත් කර ගැනීමට අප ඒකක භට පිරිස් භට හැකිවිය.

මෙතෙක් අප බළඇණිය වෙත අභිත නායකත්වයක් ගෙනදෙමින් වන්නි මානුෂිය මෙහෙයුම සඳහා විශාල දායකත්වයක් ලබාදෙමින් මෙම ඒකකය වෙත අණදෙනු ලැබූ ලූතිතන් කර්නල් ටිපේ කොඩිතුවක්කු ආර්ඩබ්පි ශ්‍රිලපාහ යන නිලධාරි තම තනතුරේ රාජකාරි නව අණදෙන නිලධාරි වශයෙන් පැමිණි ලූතිතන් කර්නල් වික්‍රමසේන ආර්ඩබ්පි ආර්එස්පි පිඑස්සි ශ්‍රිලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත භාර දීමෙන් අනතුරුව ශ්‍රිලපාහ රෙජිමේන්තු සේනාවිධායක වශයෙන් රාජකාරි භාර ගැනීම සඳහා ඒකකයෙන් බැහැරව යන ලදී. වන්නි මානුෂිය මෙහෙයුමේ මෙතෙක් අප ඒකකය විසින් ලබාගත් ජයග්‍රහණයන් විජයග්‍රහණයන් බවට පත්කිරීමේ අභිලාෂයෙන් යුතුව තම යුද්ධ හමුදා ජීවිතයේදී ලත් අත්දැකීම් හා ක්ෂේත්‍ර රාජකාරීන්හි මනා නිපුනත්වයක් ඇති නව අණදෙන නිලධාරිගේ අණදීම යටතේ නව ජවයකින් යුතුව ඉදිරි ක්‍රියාන්විතයන් වලට මුහුණ දෙමින් ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන බලකොටුවක් වූ අක්කරායම්කුලම් ප්‍රදේශය අත්පත් කර ගැනීමට ක්‍රියාකිරීම ඒකකය වෙත පැවරුන මීලග ඉලක්කය විය. ත්‍රස්තවාදීන් විසින් ඉදිකර තිබූ තවත් පස් බැම්මක් වූ අක්කරායන්කුලම් පෙදෙසට සේන්දු වන්නට විය. තුණුක්කායි පස් බැම්ම අත්පත් කර ගැනීමේදී ලබාගත් අත්දැකීම් අනුව මෙම පස්බැම්ම මුදවා ගැනීම ඉතාමත් අසීරු කාරියක් නොවුනද ත්‍රස්තවාදීන් විසින් තවත් කිලෝ මීටර දෙකක් ඉදිරියට ගමන් කිරීමේදී ඉරණමඩු ප්‍රදේශයේදී විශාල හා ශක්තිමත් පස් බැම්මක් ඉදිකර තිබිණි. ඊලාම් රාජ්‍ය සිහිනයෙහි අගනගරය වශයෙන් සැලකූ කිළිනොච්චි නගරයට ඇතුලු වීමට නොහැකි ලෙසින් ඉරණමඩු වැවේ සිට ඒ 09 මාර්ගය දක්වා මෙම ශක්තිමත් පස් බැම්ම ඉදිකර තිබූ අතර, ත්‍රස්තවාදීන් වෙත

විදේශයන්හි සිට ආධාර කරනු ලබන අයවලුන්ගෙන් තව දුරටත් ආධාර ලබා ගැනීම එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ චිත්ත ධෛර්ය ඉහල මට්ටමක පවත්වා ගැනීම සඳහාත් කිලිනොච්චි නගරය රැක ගැනීම හා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට තව දුරටත් සටන් කිරීම සඳහා අවශ්‍ය සටන්කාමීන් බඳවා ගැනීමටත් කිලිනොච්චිය රැකගැනීම සිදුකළ යුතුම විය. ඊළාම් රාජ්‍යයේ සිහින අගනගරය වශයෙන් සැලකූ කිලිනොච්චි නගරය අත්පත් කර ගැනීම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ දවල් සිහිනයක් බැව් වරක් ප්‍රභාකරන් පැවසීමෙන්ම එය කොතරම් ත්‍රස්තවාදීන්ට වැදගත්දැයි මනාව පැහැදිලි වේ. ඉරණමඩු වැව දෙසින් අප බළඇණිය මෙම පස් බැම්ම අත්පත් කර ගෙන කිළිනොච්චි නගරය අත්පත් කර ගැනීමේ මෙහෙයුම් සිදුකරන ලදී. 2008.12.22 දින ත්‍රස්තවාදීන් විසින් හමුදා භට පිරිස් ඉරණමඩු වැව් දෙසින් කිළිනොච්චි නගරය වෙත ඇතුළු වෙතැයි සිතා මෙම සටන් පෙරමුණෙන් භට පිරිස් පසු බැස්සවීමට කොටි නායකයෝ මහා පරිමාණයේ ප්‍රහාරයන් වරුසාවක් මෙන් එල්ල කරන්නට වූහ. ගැස් ප්‍රහාර පවා මෙහිදී එල්ල කළ අතර, ප්‍රථම වරට යුධ පෙරමුණ වෙත යුධ ටැංකියකින් ප්‍රහාර එල්ල විණි. කොටි ත්‍රස්තයන් ඉරණමඩු වැව දෙසින්ද බෝට්ටු හතක් යොදවා පහර දුන් අතර, ඔවුන්ගේ උපරිම ශක්තිය යොදවා මෙම ප්‍රදේශයෙන් හමුදාව ඉදිරියට ඒම වැලැක්වීමට පියවර ගත් බැව් මෙහිදී මනාව පැහැදිලි විය. මෙම සටනේදී කොටින්ගේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් විශාල ප්‍රමාණයක් මියගොස් ඇති බැව් ඔවුන්ගේ පණිවිඩ හුවමාරුවලට සවන්දීමෙන් තහවුරු කර ගැනීමට හැකි විය. නොපසුබට උත්සාහය හා මනා මග පෙන්වීමේ නායකත්වය යටතේ නොසැලී මෙම ප්‍රහාරයන්ට මුහුණ දී සාර්ථකව ජය ගැනීමට අප බළඇණිය සමත්විය. ත්‍රස්තවාදීන්ගේ කටමැත දොඩවල හා පස්බැම් පුස්සක් කරමින් එල්ල කරන ලද සියලු ප්‍රහාරයන් ව්‍යාර්ථ කරමින් 2009.01.02 දින ඊළාම් රාජ්‍යයේ සිහින අගනගරය වන කිළිනොච්චිය හමුදාව සතුකරගනිමින් ජාතික කොඩිය කිළිනොච්චි නගර මධ්‍යයේ ලෙළ දෙන්නට විය. සමස්ත ශ්‍රී ලංකා වැසියන්ගේ සතුටුදායක ආරංචියක් වන්නට වූ හෙයින් කිළිනොච්චි නගරය අත්පත් කර ගැනීම රට පුරා උත්සවශ්‍රීයෙන් සමරන්නට විය. ඒ සමගම ඊළාම් රාජ්‍යයේ කඩාවැටීමට ආරම්භ වූ අතර, මෙතෙක් රාජ්‍ය නොවන සංවිධාන හා නොයෙකුත් මාධ්‍යයන් විසින් පරාජය කළ නොහැකි මහා බලගතු සංවිධානයක් ලෙස හැඳින්වූ එල්ටීටීඊ සංවිධානය අවසානය කරා ගමන් කිරීම වේගවත් වන්නට විය.

කිළිනොච්චි නගරය අත්පත් කර ගැනීමත් සමගම 57 වන සේනාංකයෙන් මානුෂීය මෙහෙයුමට තම දායකත්වය ලබා දෙමින් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ අභිමානය ඉදිරියට ගෙන යමින් 58 වන සේනාංකය සමගින් ඉදිරි ක්‍රියාන්විතයන් සඳහා එක්වන්නට විය. පරන්තන් මුලතිව් ඒ 35 මාර්ගයේ ධර්මපුරම් ප්‍රදේශයේ 582 බළසේනාව යටතේ ස්ථානගත වෙමින් ඉදිරි මෙහෙයුම් සඳහා සහභාගි වන්නට විය. දැඩි පරාජයක් හමුවේ පසුබැස ගිය ත්‍රස්තවාදීන් අහිංසක සිවිල් වැසියන් ආරක්ෂක වැටක් ලෙස යොදා ගනිමින් සියලු යුධ උපක්‍රම වෙනස් කරමින් හමුදාව වෙත මුහුණ දෙන්නට විය. මෙහිදී යුධ හමුදාවට නව අභියෝගයකට මුහුණදෙන්නට සිදු විය. එනම් සිවිල් ජනතාව වෙත හානියක් නොවන පරිදි ත්‍රස්තවාදීන් විනාශ කිරීමයි. මෙහි පළමු පියවර වශයෙන් රජයෙන් විශ්වමඩු ප්‍රදේශය ආවරණය වන පරිදි ප්‍රථම වරට වර්ග කිලෝ මීටර් 35ක් පමණ වන යුධ මුක්ත කලාපයක් නම් කිරීමයි. සිවිල් ජනතාව රැඳී සිටින ප්‍රදේශයන්හි බර අවි ස්ථානගත කර ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කරන්නට වූ හෙයින් හමුදාවේ සියලු යුධ උපායන් වෙනස් කරමින් ඉදිරි ක්‍රියාන්විත සැලසුම් කරන්නට විය.

මේ වන විට මෙම ඒකක භට පිරිස්ද ධර්මපුරම් ප්‍රදේශයේ සිට ඒ 35 මාර්ගයට සමාන්තරව ඉදිරියට ගමන් අරඹා විශ්වමඩු ප්‍රදේශය වෙත පැමිනෙන ලදී. මෙම ප්‍රදේශයන් හා සිවිල් ජනතාව විශාල වශයෙන් ජීවත්ව සිටි නිවාස, ගොඩනැගිලි වලින් පිරී තිබූ ප්‍රදේශයක් විය. වන්නි මානුෂීය මෙහෙයුමේදී මෙතෙක් අත් විඳින්නට වූ දරුණුතම කාර්යයට මුහුණ දෙන්නට වුයේ මෙම ප්‍රදේශයේදීය. එනම් වැල නොකැඩී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් පලා එන සිවිල් ජනතාවට කිසිදු හානියක් සිදු නොකර ආරක්ෂක හමුදා පාලනය වෙතට ගැනීමයි. භට පිරිස් ගමන් කර ඒ 35 මාර්ගයේ සිට මදක් ක්‍රියාන්විත ගමන් මග වෙනස් කරමින් සුදර්මපුරම් ප්‍රදේශයේ ස්ථානගත විය. මෙම ප්‍රදේශය අතිශයින්ම විවෘත භූමියක් වූ අතර, ත්‍රස්තවාදීන්ගේ බර අවි ප්‍රහාර නිරන්තරයෙන්ම එල්ල වන්නට විය. ක්‍රියාන්විතය සිදුකිරීමට සිදුව ඇති අතර, ත්‍රස්තවාදීන්ගේ බර අවි ප්‍රහාර, ස්නයිපර් ප්‍රහාර නිරන්තරයෙන්ම එල්ල වන්නට විය. ක්‍රියාන්විතය සිදුකිරීමට සිදුව ඇති භූමි ප්‍රදේශය කිසිසේත්ම දිවා කාලයේදී ඉදිරියට ගමන් කිරීමට නොහැකි බව මනාව වටහාගත් අණදෙන නිලධාරී තුමා ඇතුළු නිලධාරී අණදෙන වරුන් සහ භූමියේ අණදෙන්නන් වහා තම ක්‍රියාන්විත සැලසුම් වෙනස් කරමින් රාත්‍රී කාලයේදී කුඩා කණ්ඩායම් වශයෙන් ඉදිරියට ගොස් සතුරා වෙත විශ්මය ජනක ප්‍රහාර එල්ල කර රාත්‍රී කාලයේදීම තම ආරක්ෂක වළල්ල තනා ගැනීමට භට පිරිස් වෙත උපදෙස් ලබා දෙන ලදී.

මේ වන විට ආරක්ෂක හමුදාවන්ගේ ඒකායන අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා යුධ පිටියේ වේගය තව තවත් උණුසුම් වන්නට විය. සියලු දෙනාම එකාමෙන් තම රාජකාරීන් දිවි පරදුවට තබා ඉටු කරන්නට වූ අතර ත්‍රස්තවාදී ජ්‍යේෂ්ඨ නායකයින්ගේ මියයාම පිළිබඳ තොරතුරු දිනපතා ගලා එන්නට විය. මෙම කරුණු භට පිරිස්හි චිත්ත ධෛර්ය තව තවත් ඉහල මට්ටමකට ගෙන ඒමට හේතු සාධක විය.

මෙම තීරණාත්මක සටනේදී ත්‍රස්තවාදීන් ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා ලක්ෂ සංඛ්‍යාත සිවිල් ජනතාවක් ආරක්ෂක පලිහක් ලෙස ප්‍රාණ ඇපයේ රඳවා ගෙන සිටියදී එම ජනතාව බේරා ජාත්‍යන්තරයට පවා අභියෝගයක් කරමින් රජය විසින් නම් කරනු ලැබූ යුධ මුක්ත කලාපයට ඇතුළු වීම සඳහා වූ මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම තීරණාත්මක මෙහෙයුම් සඳහා මෙම ඒකක භට පිරිස්ද ඉතා අධිෂ්ඨානශීලිව හා උසස් චිත්ත ධෛර්යකින් යුක්තව සහභාගි වූ අතර මේ අවස්ථාවේදී කොටි සංවිධානයේ මිලේච්ඡත්වයට එරෙහිවූ දමිළ ජනතාව ත්‍රස්තවාදීන්ගේ වෙඩි බලය දෙවෙනි කොට හමුදා පාලන ප්‍රදේශයන් වෙත පැමිණෙන ලදී.

සිවිල් ජනතාව යුධ මුක්ත කලාපයේ සිට රජයේ පාලන ප්‍රදේශයට ගැනීමත් සමගම වසර 30ක දීර්ඝ ඉතිහාසයක් පුරාවට දිවෙන එල්ටීටීඊ සංවිධානයට එරෙහිව දියත් කරන ලද වන්නි මානුෂීය මෙහෙයුමෙ තීරණාත්මක මොහොත උදාවිය. මේ වන විට භට පිරිස් යුධ බිමේ ලද හසල අත්දැකීම් හා නිවැරදි නායකත්වයේ අණදීම යටතේ එල්ටීටීඊ නායකත්වය සොයා ක්‍රියාන්විතය ආරම්භ වූ අතර එහිදී 2009.05.17 දින රාත්‍රියේ ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් පැමිණ ආරක්ෂක වළල්ල වෙත ප්‍රහාර එල්ල කර ක්‍රියාන්විතය වෙනත් මගකට යොමු කිරීමට උත්සහ දැරූ අවස්ථාවේ මෙම ඒකක අණදෙන නිලධාරී විසින් අවසන් මොහොතේ තමා යටතේ සිටින භට පිරිස් භට අවස්ථානුකූලව ඉටුවිය යුතු කාර්යය මැනවින් වටහා ගෙන භට පිරිස් මෙහෙයවා ත්‍රස්තවාදීන්ගේ අරමුණ ව්‍යර්ථ කිරීමටත් පසුදින එනම් 2009.05.18 දින උදෑසන වන විට එල්ටීටීඊ සංවිධානයේ අවසන් ත්‍රස්තවාදියාද ජීවිතක්ෂයට පත් කිරීම සඳහා ක්‍රියාන්විතයට දායකත්වය ලබාදීම වන්නි මානුෂීය මෙහෙයුමට ප්‍රථමයෙන්ම එක්වූ බළඇණිය වශයෙන් අතිශයින්ම සතුටට පත්වන කරුණක් විය. ශ්‍රී ලංකාද්වීපයේ ස්වාධීනත්වය හා භෞමික අඛණ්ඩතාවය සුරැකිමෙහිලා බළඇණියක් ලෙස අනෙකුත් සහෝදර බළඇණි සමග එක්ව "සේවය කරමි" යන ආදර්ශ පාඨය පෙරදැරි කර ගෙන දශක 03 කට ආසන්න කාලයක් පුරාවට පැවැති ත්‍රස්තවාදය සහ මුලින්ම පරාජයට පත්කරමින් ස්වාධීන රාජ්‍යයක් ගොඩනැංවීමට උරදීම ඉතිහාසයේ රන් අකුරින් සනිටුහන් වනු ඇත. මෙම විජයග්‍රහණය උදෙසා විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සටනේදී දිවිදුන් විරුවන්ටත් තුවාල ලැබූ විරුවන්ටත් ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු වේ. අවසාන වශයෙන් ජීවිත පූජාකළ රණවිරුවන්ට නිවන් සුවය ප්‍රාර්ථනා කරනු ලබන අතරම තුවාල ලැබූ සියළු විරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ

# හොඳ බෞද්ධයකු වීම

සකල ලෝකවාසී ජනයා සංසාර සාගරයෙහි පවතින නිරන්තර පීඩනයෙන් මුදවා ගැනීම පිණිස බෙහෙවින් ක්‍රියා කළ ලොව පළමු වීර පුරුෂයාණන් වහන්සේ අප තථාගත ලොව්තුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේය. රූපකායයෙන් උන්වහන්සේ අද අප අතර ජීවමානව නැත.එහෙත් බුදු හිමියන්ගේ අසදෘශ වු ඒ අති උතුම් ධර්මකාය තවමත් අප අතර වැඩ වාසය කරති.

ජීවිතයේ සියලු දුක් දොම්නස්වලින් අත්මිදී ලබන අමාමහ නිවන් සුවය ලබා සංසාරයෙන් එතෙරවීමට නම් මේ දහම අවබෝධ කොට ගත යුත්තේ තම තමන් විසින්මය.පටිච්ච සමුප්පාදය.චාතුරාර්ය සත්‍යය. ත්‍රිලක්ෂණ දර්ශනය හා ත්‍රිශික්ෂාව ආදි බුදුරජාණන් වහන්සේගේ ගැඹුරුතර ඉගැන්වීම් කෙරෙහි මනස මෙහෙවීම මෙහිලා අත්‍යවශ්‍යය.

එහෙත් අද්‍යතන පොදු ජන සමාජය දෙස බැලුවහොත් මෙවැනි සැබෑ බොදු පුනරුදයක් අපට දැකගත නොහැකිය. එනම් බෞද්ධයන් නිරන්තරයෙන් හැඩගැසී සිටින්නේ මලින ්ද. පහනින් ද. ගඳින් ද.බුදුන් පිදීමටයි. දහම් වැඳීමටයි. සඟුන් වැඳීමටයි. එසේම ළිං පැන් පොකුණු වෙහෙර විහාර ආදිය ආරාම් තුළ ඉදිකිරීම් ආදියෙන් ඇතැම්හු සම්බුද්ධ ශාසනයෙහි පැවැත්වීමට උර දී කටයුතු කරති.

බුදු හිමියන්ගේ ධර්මතාවයට අනුව මෙවැනි පින්කම් සිදුකිරීම ද බෙහෙවින් අගනේය. ඒ හුදෙක්ම එවා ආමීස පුජා ගණයෙහි ලා සැලකෙන බැවිනි. ආමිස පුජා නිවනට යන මගෙහි අඳුරු අඟුමුළු තැන්වල ඝන කළුවර දුරු කොට පුද්ගලයාට එතැනට යන්නට මග පෙන්වා මිණි පහනක් වැන්න.එතෙකුදු වුවත් මෙසේ සිදුකරන ආමීස පුජාවන්ගේ ආනිසංස එලෙසින්ම පුද්ගලයාට අත්පත් වන්නේ එම පින්කම් ශ්‍රද්ධාවත් .ප්‍රඥාවත් මුල්කොට සිදු කළහොත් පමණි.

අද්‍යතන සමාජය දෙස බැලුහොත් වැඩිපුරම සිදුවන්නේ ද මෙයමය. ඒ අනුව වර්ථමානයේ දී කෙනෙක් දන් දෙන්නේ ස්වකිය ඇති හැකිකමේ තරම බාහිර ලෝකයාට පෙන්වීමට විය හැක. තවත් සමහරෙක් පන්සල් යන්නේ . සිල් සමාදන් වන්නේ .දහම් අසන්නේ තමන්ගේ පිවිතුරු බව ඇඟිල්ලෙන් ඇන ලෝකයාට පෙන්වා දෙන්නටයි. මේ වනාහී භාග්‍යාවත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ මහඟු ධර්මයේ මුලික පරමාර්ථවලට පිටුපෑමකි.

වර්තමාන සමාජයේ බහුතරයක් වන බෞද්ධයින් ද බුදුදහම අනුගමනය කරන්නේ මේ හා සමානවමය. මෙසේ නොවුයේ නම් තුන්යාමයේහිම බණ කියන. බණ අසන .සමාජයක මේ තරමින් නොසන්සුන්කම. අසහනය. අතෘප්තිය. පීඩනය ඇතිවන්නට ඉඩක් තිබිය නොහැකිය. මිහිමවට දරාගත නොහැකි තරම් මළකඳන් වළලා දැමීමට සමත් යුධ කලකෝලාහල ඇතුළු ආරවුල් රැල්ලකින් මිනිස් සමාජය වැසී නොයනු ඇත.එනමුදු මේ අවාසනාවන්ත සමාජ වාතාවරණ සියල්ල අද අපි අත්විඳිමින් සිටින්නෙමු.

මෙම සියලු සමාජ අගතින් ඉවත දමා සසර ගමනින් සදහටම අත්මීදෙන මග හෙළි පෙහෙළි කර ගැනිමට නම් අප වඩාත් ළංවිය යුත්තේ ආමීසයට වඩා ප්‍රතිපත්ති පුජාවන්ටයි.

ප්‍රතිපත්ති පුජාවන් වැදගත් බව අප සටහන් කරන්නේ මන්ද යන්න විමසා බැලිය යුත්තකි. මේ දෙකෙහි වෙනස පිළිබඳව අප ඇති තරමින් කරුණු ගොඩනගාගෙන ඇති මුත්. ඒ වෙනස පිළිබඳව එතරම්ම සැලකිල්ලක් නොදැක්වු බව වටහා ගත යුතුය.

ප්‍රතිපත්ති පුජාව කවරේද? එය වටහාගත යුත්තේ කෙසේද? "ප්‍රතිපත්ති "යන වදන තුළම "ප්‍රතිපත්ති පුජාව" පිළිබඳව අර්ථය සැඟව ඇත. බොහෝවිට සමාජයෙන් ගරු බුහුමන් ලබන්නේ ස්ථිරසාර ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කරන්නේකු වන බව ඔබ අත්දැක ඇතුවාට සැක නැත.

තමන් නිවැරදි මගට පිළිපන් ස්ථිරසාර ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීම යනු බුහුමන් ලැබීමට හේතු වේ. එම ප්‍රතිපත්ති "සුදන" ගුණයෙන් යුත් ස්ථිරසාර නිවැරදි එකක් වේ නම් සමාජයෙන් එවැනි ප්‍රතිචාරයක් ලැබීම පුදුමයට පත් විය යුතු තරමේ එකක් නොවේ. බෞද්ධයන් වශයෙන් අපේ ප්‍රතිපත්ති රටාව සුපිරිසිදු .සුපේශිල එකක් විය යුතු බව අමුතුවෙන් සටහන් කළ යුතු නොවේ. එහෙයින්ම එය "පුජා" ලබන්නට එසේත් නැත්නම් පුජා කරන්නට තරම් හේතුවෙන බැවින් එය "ප්‍රතිපත්ති පුජාව" ලෙසින් හැඳින්වීම වරදක් නොවේ.

අපේ ප්‍රතිපත්තින් බෞද්ධ දර්ශනයට අනුව හැඩගැස්විය යුත්තේ කෙසේද?
අප නම් කල්පනා කරන්නේ එය.අවම වශයෙන් පන්සිල් පද පහට අනුකූලව හෝ ගොඩනැංවිය යුතු එකක් බවයි. දසකුසල් හෝ ඉන් ඔබ්බට ගැඹුරු ප්‍රතිපත්තීන් මත පිහිටා කටයුතු කරනවාටත් වඩා පන්සිල් පද පහ පමණක් රැකීමෙන් වුවද ඉතා හොඳ ප්‍රතිපත්තී ගරුක ධාර්මික ජීවිතයක් ගත කළ හැකි බව වටහාගත යුතුයි.

එවැනි ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කරන්නෙකුට නිතර නිතර පන්සල් ඇසුරෙහිම කාලය ගත කිරීමේ අවශ්‍යතාවයන් මතුවන්නේ නැත. එසේ කියන්නේ එවැන්නෙකු ඔහු විසින් රකිනු ලබන නිවැරදි ප්‍රතිපත්තී රටාව විසින්ම රකිනු ලබන හෙයිනි.

එවැනි ප්‍රතිපත්ති රටාවන් රැකි ධාර්මික. අවිහින්සාවාදී පුද්ගලයෙකු හඳුන්වාදීමට අවැසි නම් ඒ සඳහා ඇති සරලතම හා උච්චතම උදාහරණය වන්නේ ඒ .ඩබ්ලිව්.අදිකාරම් මහතාය. අදිකාරම් මහතා ජීවත්ව සිටිය දී කිසිවිටෙකත් නිතර නිතර පන්සල් ඇසුරෙහි කාලය ගත කළ බවක් අසන්නට නැත. එතුමාගේ ජීවිත කාලය පුරාවටම පන්සිල් පද පහ කියා ඇත්තේ ද එක්වරක් පමණි. එසේවුවද අදිකාරම් මහතා තරම් අවිහින්සාවාදී .බෞද්ධ දර්ශනයට අනුව ජීවිතය ගත කළ අයෙකු නොවු තරම් ය.

මුලින් සඳහන් කළා සේ ආමිස පුජාවන් විදහා පාන බෝහෝ දේට වඩා මතුපිට පමණක් ස්පර්ශ නොකරන බෞද්ධ දර්ශනයත්, ඒ ධර්මයේ ගැඹුරු විහිදී පැතිරී යන ප්‍රතිපත්ති පුජාව වඩා වටිනා එකක් වන්නේ ඒ නිසාය. ඒ වෙනුවෙන් වනගතව භාවනා කළ යුතු නැත. ගමේ විහාරස්ථානය තිබිය දී දුර බැහැර පිහිටි වෙහෙර විහාරස්ථානවලට ගොස් පෝදාට සිල් සමාදන් විය යුතු නැත. නිසි ප්‍රතිපත්ති පුජාවට පන්සිල් පද පහ සුරැකිම ප්‍රමාණවත් ය. ඒ මග හොඳ බෞද්ධයකු නිර්මාණය කරනු නිසැකය.

("සිංහල බෞද්ධයා" පුවත් පත ඇසුරෙන් උපුටා ගන්නා ලද්දකි.)

කෝප්‍රල් දීලුක බීපීඩී. ආර්එස්පී
1 ශ්‍රිලපාහ (රෙජිමුබ)



# 19 වන බලඇණි දිනය සමරන 6 ශ්‍රීලපාහ

වසර තිහකට ආසන්න කාලයක් මෙම දේශය වෙලාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය මැඩලන්නට විවිධ අවස්ථා වලදී දායකත්වය ලබාදුන් 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාව පසුගියදා සැමරුවේ සිය 19 වන වර්ෂ පූර්ණයයි. මුලු මහත් යුධ හමුදාවේම ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන අප පාබල හමුදා රෙජිමේන්තු මානාවගේ 4 වන නිත්‍ය ඒකකය ලෙසින් 1990.06.08 වන දින අභිෂේක ලද මෙම ඒකකය එදා සිට මේ දක්වා ත්‍රස්තවාදී ග්‍රහණයට නතු වු ප්‍රදේශ මුදා ගන්නට විශේෂයෙන් අවසන් සටනේ අවසන් අධියරටද අපිරිමිත සේවයක් රටත් ජාතියත් වෙනුවෙන් සලසන්නට අවස්ථාව උදා කරගෙන ඇත. මේ ඒ වෙනුවෙන් ලියවෙන කෙටි සටහන් පෙලකි.

එදා මුල්ම අණදෙන නිලධාරි වු එවකට ලුතිනන් කර්නල් ඩි රත්නසභාපති ශ්‍රීලපාහ ගේ අධිෂ්ඨාන ශක්තියෙන් ගොඩ නැංවුන මෙම ඒකකයට අද දිනයේ මේජර් වයිඑච්එම් යහම්පත් ආර්ඩබ්පි ආර්එස්පි පිඑස්සි ශ්‍රීලපාහ විසින් නායකත්වය සපයන්නේ දස වන අණදෙන නිලධාරි වශයෙනි . එදා මෙදා තුර මෙම ඒකකය වෙත නායකත්වය සපයා දුන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ටත් දෙවන අණදෙන නිලධාරි වරුන්ටත් අනෙකුත් නිලධාරින් සහ සියලුම සෙසුනිලයින්ටත් ඒකකයේ නාමයෙන් සිය කෘතවේදීත්වය පල කරන, අතර එම විශිෂ්ඨයින් විසින් මනා පෙර දැක්මකින් යුතුව ශ්‍රීලපාහ රෙජිමේන්තුවට සහ සමස්ත යුධ හමුදාවටම කීර්තියක් අත්වෙන අන්දමින් ඉදිරියට ගෙන ආ මෙම ඒකකය වර්තමාන අණදෙන නිලධාරිගේ නායකත්වය යටතේද සුවිශේෂි වු ජයග්‍රහණ රැසක් අත්පත් කර ගැනිමට මේ වන විටත් සමත් වී ඇති බව මෙහිලා සදහන් කරමි.

ලොවක් දිනන්නට අවශ්‍ය වන්නේ ගනෙහි ශක්තියක් සිතෙහි ඇති විය යුතු අධිෂ්ඨානයත් පමණක් බව අප අසා ඇත්තෙමු. අද දිනය වන විට එම තත්ත්වය සැබෑ කරගත් මෙම ඒකක විරුවෝ මුලු ලොවම දිනාගත්තාටත් වඩා සතුටක් ලබති. ඒ පුරා දශක තුනකට ආසන්න කාලයක් විවිධ වු හැල හැප්පීම් වලට මුහුණ දෙමින් ත්‍රස්තවාදී භීතිකාවෙන් තෙරපෙමින් සිටි අහිංසක ජන කොටස් වලට සාමකාමි පරිසරයක් නිර්මාණය කර දුන් නිසාය. ඔවුන් එදා ලෙයින් දහඩියෙන් මේ මිහිතලය තෙමද්දී අහිංසක දෙමාපිය දූ දරුවන් හඬා වැළපුනේ යුධ පෙරමුණේ සිටින තම දරුවා හෝ ස්වාමිපුරුෂයාට විපතක් සිදුවේද යන බිය නිසාවෙනි. නිවාඩු අවසානයේ රාජකාරියට පැමිණෙන සෙබළ නැවත නිවසට පැමිණෙන තෙක් විශ්වාසයක්ද තිබෙන්නට නැතුවා විය යුතුය. ඒසා විශාල බිහිසුනු යුගයක් නිර්මාණය කර තිබු වේලුපිල්ලේ පිරබාහරන් ප්‍රමුඛ විසිදාහක් ඉක්මවා සිටි ඔහුගේ සහචරයින් පිරිස සම්පුර්ණයෙන්ම විනාශ කර දමා ඇත. අවි/පතුරොම් නිෂ්පාදිත රටවල් වලටත් නොමැති තරම් රැස්කරගෙන සිටි ත්‍රස්තවාදින්ගේ අවි ආයුධ වෙඩිද්‍රව්‍ය ආරක්ෂක හමුදා යටතට ගෙන ඇත. ත්‍රිවිධ බලවේගයන් ගෙන් පරිපුර්ණ වු ත්‍රස්ත සංවිධානය සතු ගුවන් සහ නාවික බලය යුධ ටැංකි ස්වයංක්‍රිය ගිනි අවි ආදී සියල්ලක්ම විනාශ කර දමමින් නිවහල් දේශයක් ගොඩ නැගු මෙම සටනේ පෙරමුණ ගත් ඒකකයන් අතර අප ඒකකය පසු වන්නේ ඉහළම ස්ථානක බව සැබෑය.

2009.06.07 වන දින වන විට පලෙයි නගරය සිය කේන්ද්‍රස්ථානය කර ගනිමින් බළඇණි මුළස්ථානය ස්ථානගතකර පාලනමය රාජකාරි යුහුසුළුව ඉටු වෙමින් තිබු අතර 8 වන දිනට නැගෙ නහිරින් හිරු මෝදු වුයේ බළඇණියේ සුවිශේෂි වු දිනයක් සනිටුහන් කර එය ඉතිහාසයට නව පිටුවක් මත සලකුණු කර තබමිනි. පුරා දශක තුනක සාපලත් යුද්ධය නිමාවීමෙන් පසු එළඹි ඒකකයේ 19 වන සංවත්සරය සමරන්නට ඒ වන විටත් සියලුම කටයුතු සංවිධානය වෙමින් තිබිණ. හිමිදිරියේ ප්‍රථමයෙන්ම ඒකක ධජය සහ ජාතික ධජය ඔසවා නව දිනක මෙන්ම සුභ නව වසරක ආරම්භය සනිටුහන් කළ අතර, නැග එන හිරු කිරණින් මේ මිහිතලය සිප ගනිද්දී මුළු ප්‍රදේශය පුරාවටම සිසිල් සුළංරැලි ගලා ගියේද මුළු පරිසරයම මෙම ඒකකයේ ඉදිරි ගමන් මගට සුබාසිංශන එක්කරන්නාක් මෙනි.

සෙමෙන් සෙමෙන් හිරු කිරන මෝදු වෙද්දී ඒකකයට අයත් භට පිරිස් එකට එකතුකර ගාම්භිරත්වය විදහා දක්වමින් ඒකක අණදෙන නිලධාරි තුමන් වෙත සම්මාන මුරයක් පිරිනැමු අතර පසුව එය නව දුරටත් වර්ධනය කර ගනිමින් සම්මාන පෙළපාළියක් මගින් සිය නායකත්වයට උත්තමාචාරය පුදකළේ මේ දේශය රකින ඒකක සෙබළ ඒකක අණදෙන නිලධාරි තුමන් දිවි හිමියෙන් ආරක්‍ෂා කර ගනිමින් එතුමන් විසින් ගන්නා යහපත් තීරණ ක්‍රියාත්මක කිරිමට සැදී පැහැදී සිටින බව කියා පාමිනි.

මෙම අවස්ථාවට එක්වු ඒකක අණදෙන නිලධාරි මේජර් වයිඒච්එම් යහම්පත් ආර්ඩබ්පි ආර්එස්පි පිඑස්සි ශ්‍රීලපාහ ඒකක භට පිරිස් අමතා වටිනා දේශනයක් පැවැත් වු අතර ඒකකයේ ඉදිරි ගමන් මග වෙනුවෙන් ගතයුතු වැදගත් මෙන්ම යහපත් සෑම දෙයක්ම ඉටු කිරිමට ඇපකැප වී ක්‍රියා කිරිමේ ඇති වැදගත්කම එහිදී පැහැදිලි කරන ලදි.

පසුව ඒකකයේ සියලුම අයවළුන් විසිතුරුව සකස් කරන ලද ශාලාවක් වෙත එක්රැස් කර දිවාභෝජන සංග්‍රහයක් පිළියෙල කර තිබු අතර එම අවස්ථාවේද ඒකකය ආරම්භයේ සිට මේ දක්වා විවිධ අවස්ථාවන් වලදී සකස් කර තිබු සංග්‍රහ කටයුතු වලට වඩා මෙය ප්‍රමුඛස්ථානයක ගන්නා බව ඒ සදහා සහභාගි වු පැරණි සාමාජිකයෝ පවසන්නට ඇතැයි විශ්වාස කරමි.

මේ දේශය රකින්නට පවතින ත්‍රස්තවාදී මිලේච්ඡ ක්‍රියාවන් වළකා ලන්නට ඒකක විරුවන් ගත් උත්සාහයන් අපමණය. ඒ අතර තුරේ ලෙයින් දහඩියෙන් මේ මිහිතලය නැහැවු ඒකක විරුවන් අතරින් සුලු පිරිසකට සදහටම දැයෙන් සමුගන්නට සිදුවිය. තවත් පිරිසකට දෑත් දෙපා කං ඇස් අහිමි විය. වසර තිහක යුධ ඉතිහාසයේ යුධ ක්‍රියා අතර ඉතා ඉහළ ස්ථානයක සිටින මෙම ඒකකය මේ දක්වා රැගෙන ඒමටත් මේ දැය සතුරු ආක්‍රමණයන්ගෙන් ආරක්‍ෂා කර ගන්නටත් දරු උත්සාහන් වල ප්‍රතිඵල අද අප විසින් භුක්ති විදින්නෙමු. ගතවන සෑම නිමේෂයක් පාසාම ඔවුන් සිහිපත් කරන බව පිලිබිඹු වන අන්දමින් විනාඩි 02ක් නිශ්ශබ්දව සිට මියගිය/අතුරුදහන් වු විරුවන් සිහිකර ඔවුනට පිං අනුමෝදන් කළේ මෙම අවස්ථාවේ එම විරුවන්ද අප අතර සිටියානම් මොනතරම් සතුටු වේද යන ආකල්පය හදවතේ නැඹුරු කරගෙන විය යුතුය. එසේ ඒකක භට පිරිස්හි පැතුමන් දැයෙන් සමුගත් විරුවන් වෙනුවෙන් එක්කරද්දී ක්‍රියාන්විත රාජකාරින් වල නියැලී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලැබු ඒකක භට පිරිස් වෙත ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරිමටද මෙම අවස්ථාමේ අමතක නොකළේය.

රටත් ජාතියත් ආගමත් ආරක්‍ෂා කිරිමට සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අතරේ මෙම ඒකකයද ඉතා සාඩම්බර ලීලාවෙන් තිලිණ කරදුන් සේවාවන් රැසක් මේ මොහොතේ සිහිපත් කළ යුතුම වේ. ඒ අතරේ අම්පාර කිරාන් බදුලු හංදිය මඩකලපුව තොප්පිගල වැනි නැගෙනහිර පළාතට අයත් ප්‍රද්දශ වල සීමිත ක්‍රියාන්විත සිදු කරමින් නව ජීවයක් ලබා දුන් මෙම ඒකක විරුවෝ පසුව යාල්දේවි රිවිරැස සහ ජයසිකුරු වැනි දැවැන්ත ක්‍රියාන්විත වලට දායකත්වය දෙමින් ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාකළ අතර අවසානයේදී හතර වන ඊළාම් යුද්ධය පරාජ කිරිම දක්වා වු මානුෂිය මෙහෙයුමේ ඉදිරියෙන්ම සිටිමින් අවශ්‍ය අවස්ථා වලදී ක්‍රියාත්මක වෙමින් ත්‍රස්තවාදින්ගේ මරමස්ථාන සුනු විසුනු කරන්නට කටයුතු කරන ලදි. ඒවා අතර මුහමාලෙයි ඉදිරි ආරක්‍ෂක වළල්ලේ සිට ත්‍රස්තවාදින්ගේ ආරක්‍ෂක වළල්ලට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරමින් විනාශ කර දැම්ම තුලින් වලෙයි ප්‍රදේශය අල්ලා ගැනීමටත් මුහදු කොටි බළකායේ ත්‍රස්තවාදී නායකයින් පවා මරා දමමින් දැවැන්ත ජයග්‍රහණ අත්පත් කර ගැනිම මෙන්ම මුලතිව් ප්‍රදේශයට පැමිණ යුධ හමුදාවේ ඉදරි ගමන් මගට මහත් බාධකයක්ව තිබු නන්දිකඩාල් කලපු තීරය තරණය කරමින් වෙල්ලමුල්ල වෛක්කාල් ප්‍රදේශ අත්පත් කර ගැනිමට සටන් දියත්කර ත්‍රස්තවාදින්ගේ ප්‍රාණ ඇපකරුවන් බවට පත්ව සිටි අහිංසක සිවිල් වැසියන් දස දහස් ගණනක් බේරා ගැනිමට දායකත්වය සැපයීම මෙහිලා වැදගත් සිද්ධින්සේ හැදින්විය හැකිය.

13 පිටුවට ➔



දිවා භෝජන සංග්‍රහයෙන් පසුව ඒදිනට නියමිතව තිබූ වැඩ සටහන නිමාවට පත් වු අතර පසු දිනට පහන් වුයේ තවත් සුන්දර දවසක් ඒකක භට පිරිස් වෙත එක් කර දෙමින් ඒකක අණදෙන නිලධාරි තුමාගේ ආරාධනය මත 1 වන ගජබා රෙජිමේන්තුවේ කෙටේරියන්ස් සංගීත කණ්ඩායම ඒ වන විටත් ඒකකය වෙත පැමිණ සිටි අතර විචිත්‍රවත් අන්දමින් තනා තිබූ සංගීත මණ්ඩපය තුලට ඔවුන් කැඳවා පලෙයි ප්‍රදේශයම සංගීතයෙන් පුරවාලන්නට කටයුතු කලේ ඒකක භට පිරිස්ද ඒ අතරට එක්කර ගනිමිනි. වසර කිපයකට පසු යුධ බිමේදිම එවන් මිහිරි නාද ඇසෙනු ලැබූ ප්‍රථම අවස්ථාව වු අතර, මෙමගි න් යුධ ගිණිදැල් මැද තෙරපෙමින් සිටි ඒකක භට පිරිස් සියලු දෙනා ලැබූ ආස්වාදය අනන්තය අප්‍රමාණය. ඒ අතරට එක්වු ඒකක සෙබළුන්ද කෙටේරියන්ස් සංගීතරාවයට අනුව ගී ගයමින් තම කුසලතාවයන් ඔප් නැංවු අතර යුධ පිටියක යුධ සෙබළුන් වශයෙන් ඇප කැප වී සිටියත් තමන්ටද විවිධ වු හැකියාවන් ඇති බව මෙහිදි විද්‍යාමානු කළහ.



ජාතියේ නාමයට රණවිරුවන් පෑ දස්කම් විස්කම් නිසාම වන්නට සමස්ත ලක්වැසි සියලුම දෙනා ඒ වෙනුවෙන් පුෂ්පෝපාහාර දක්වන මේ මොහොතේ ලංකා දේශය පුරාවටම සාමයේ අරුණැල්ල උදා වී ඇත. දැයක් ජයගත් හෙලයේ දු පුතුන්ගේ නාමයෙන් රණවිරු උපහාර උත්සව මාලාවන් ලංකාවේ විවිධ වු ස්ථාන වල පැවැත්වේ. මුලු රටම එක් ධජයක් සෙවනේ බබලවන්නට උරදුන් මෙම ඒකක විරුවෝද එහි කොටස් කරුවන් විම නිතැතින්ම ආඩම්බරයට කරුණක් බව නිහතමානිව සිහිපත් කරන්නට පුළුවනි.



පුරා දින තුනක් පමණ 19 වන බලඇණි දිනය වෙනුවෙන් ප්‍රිති ප්‍රමෝධයට පත් වු මෙම ඒකක විරුවෝ කිසි විටෙකත් ඔවුන් අතර සිට ත්‍රස්තවාදි ප්‍රහාර හේතුවෙන් මියගිය සහ තුවාල ලැබු සහෝදර විරුවන් අමතක නොකලේය. අණදෙන නිලධාරිගේ පූර්ණ මග පෙන්විම මත ඓතිහාසික මිහින්තලා පුදබිමට සමගාමිව පිහිටා ඇති මෙම ඒකක මැදමුලයේ සිට මියගිය විරුවන්ට පිං පැමිණවිමටත් තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව දැනට ප්‍රතිකාර ලබමින් සිටින සියලුම දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු. 2009.06.14 වන දින සංධ්‍යා කාලය වන විට ඒකකය නියෝජනය කරමින් සිට මියගිය විරුවන්ගේ පවුල් වල ඥාතිහු විශාල පිරිසක් අණදෙන නිලධාරිගේ ආරාධනය මත පැමිණ සිටි අතර, එම සියලු දෙනා එක්කර ගනිමින් 2009.06.15 වන දින ගරුතර ස්වාමින් වහන්සේලා සියක් නමක් උදෙසා අට පිරිකර සියයක්ද සහිත සංඝගත දක්ෂිණාවක් පූජා කලහ. මෙතුලින් ජාතියේ නාමයෙන් දිවිදුන් ඒකක විරුවනේ ඔබ සැමට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු. එසේම යුද්ධයේදි තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටින විරුවනි ඔබලාට ඉක්මන් සුවය අත්වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.






6 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 19 වන බලඇණි දිනය සංවිධානය කර තිබු සියලු කටයුතු එලෙස නිමාවට පත්වු අතර මෙකී සියලු කටයුතු සංවිධානය කිරිමෙහිලා ඇපකැප වී දායකත්වය සැපයූ ඒකකයේ සියලුම දෙනාටත් එම පවුල් වල සැමටත් සිවිල් සේවක මහතුන් සහ එම පවුල් වල අයටත් කෘතවේදිත්වය පළ කිරිමට මෙය අවස්ථාව කර ගන්නෙමු.

බුද්ධි අංශය 6 ශ්‍රීලපාභ



# නීල කොබෙයියා

එකෝමත් එක රටක රජ කෙනෙක් හිටියා. එයා තනිකඩයෙක්. එයාට බිසවක් හිටියේ නැහැ. මේ රජු ළඟ සේවය කළා දුනු ශිල්පියෙක්. ඔහුගේ නම අන්ද්‍රේ. දවසක් දා අන්ද්‍රේ දඩයම් කරන්න කැලයට ගියා. දවස තිස්සේම කැලෑව පුරා ඇවිද්දා. දඩයමට සතෙකු හොයන්නට බැරිවුණා. හවස් වුණාම ඔහු ආපසු ගෙදර යන ගමන් කණගාටු වුණා. ඔන්න හිටිහැටියේම ගහක අත්තක් උඩ කොබෙයියෙක් වහලා ඉන්න හැටි ඔහු දැක්කා.

'මේ කොබෙයියාට හරි විදින්න ඕන.' ඔහු කල්පනා කළා. දුන්න අරගෙන ඊයක් අමුණලා විද්දා. කොබෙයියා ඊ පහර කා ගෙන ගහෙන් බිමට වැටුනා. අන්දරේ ඌව අරගෙන උගේ බෙල්ල කඩලා දඩයම් මල්ලට දමන්න ලැහැස්ති වුණා.

එතකොට කොබෙයියා මිනිහෙක් වගේ කතා කළා. අන්ද්‍රේ දුනු ශිල්පියා මාව මරන්ට එපා. මාව පණ පිටින් ගෙදර ගෙනියපන්. ජනේලය ළඟ තියලා ඇති කරපන්. මම නිදි කිරා වැටෙන කොට මට දකුණ අත දිගහැරලා පාරක් ගහපන්. එතකොට නුඹට වාසනාව ළඟා වේවි.

මිනිහෙකු වගේ කතා කරන කොබෙයියාව දැකලා අන්ද්‍රේ පුදුම වුනා. බලන කොට කුරුල්ලෙකු වගෙයි. කතා කරනවා මිනිහෙකු වගේ. අන්ද්‍රේ කොබෙයියාව ගෙදර ගෙනියලා ජනේලය ළඟ තැබුවා. ඌ නිදි කිරා වැටෙන තුරු බලා ගෙන හිටියා.

ටික වේලාවක් ගත වුණා. කොබෙයියා බෙල්ල අත් තටුව යට හංගා ගෙන නිදියගන්න පටන් ගත්තා. කොබෙයියාගේ කීම මතක් වෙලා අන්ද්‍රේ දකුණු අත දිග හැරලා ඌට පහරක් ගැසුවා. කොබෙයියා බිම වැටිලා කුමාරිකාවක් වුණා. ඇගේ නම මාර්යා. ඈ බොහොම ලස්සනයි. එතරම් ලස්සන අය ඉන්නවයි කියලා හිතාගන්නවත් බැහැ.

කතන්දර වල විතරයි එතරම් ලස්සන අය ඉන්නේ.

මාර්යා රජ කුමරිය දුනු ශිල්පියාට කතා කළා.

'මාව අල්ලාගන්ට ඔයාට පුලුවන් වුණා. දැන් ඉතින් මාව ඔයා ළඟම තියාග න්න. ඉක්මනට ඔයා මාව සරණ පාවා ගන්න. ඔයාට අවංක, හොඳ බිරියක් වෙන්නම්.

දෙදෙනාම කැමති වුණා. අන්ද්‍රේ දුනු ශිල්පියා මාර්යා කුමාරිව සරණ පාවා ගෙන හොඳින් ජීවත් වෙනවා. රාජකාරිය ගැන අමතක කරන්නේ නැහැ. හිමිදිරි පාන්දර කැලේට ගිහිල්ලා සතුන් දඩයම් කරලා රජ ගෙදර කුස්සියට බාර දෙනවා.

අන්ද්‍රේ සහ මාර්යා කුමරිය ඔහොම ටික කාලයක් ජීවත් වුණා. 'අන්ද්‍රේ ඔයා බොහොම දුප්පත්' මාර්යා කුමරිය දවසක් කියනවා.

'ඔව් ඇත්ත.'

'කොහොම හරි රූබල් සියයක් විතර හොයාගන්න, පාට නූල් මිලදී ගන්න. මම ඔයාට ඉතුරු හරිය කරලා දෙන්නම්.'

කුමරියගේ කීම අහලා අන්ද්‍රේ යාලුවන්ගෙන් සල්ලි ණයට අරගෙන පාට නූල් බිරියට ගෙනත් දුන්නා.

අන්ද්‍රේ ඔයා දැන් නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා. 'පාට නූල් අරගෙන කුමරිය කීවා.

අන්ද්‍රේ නිදා ගන්ට ගියා.

මාර්යා කුමරිය පලසක් වියන්නට පටන් ගත්තා. එතරම් ලස්සන පලසක් කවදාවත් වියලා නැහැ. රටේ තියෙන හැම දෙයක්ම ඒ පලසෙහි තියෙනවා: නගර, ගම්, කැලෑ, ගංගා, අහසේ පියාසර කරන කුරුල්ලෝ, කැලෑවේ කඳුවල ජීවත් වන සත්තු, මුහුදේ ඉන්න මාලුවෝ, ඉර හඳ පායලා.

උදේ පාන්දර මාර්යා කුමරිය පලස අන්ද්‍රේ අතට දුන්නා. 'මේ පලස අරගෙන කඩ පොළට යන්න. පොහොසත් වෙළෙන්දන්ට එය විකුණන්න. මිලක් ඉල්ලන්ට එපා. දුන්න දෙයක් අරගෙන එන්න.'

පලස අරගෙන අන්ද්‍රේ කඩ පොළට ගියා.

එක් වෙළෙන්දෙක් පලස දැකලා දුවගෙන ආවා.

'මේ අහපන් යාලුවා මේ පලසට නුඹ කීයක් ඉල්ලනවාද?'

'නුඹ වෙළෙන්දෙක්. නුඹම මිල නියම කරපන්.'

වෙළෙන්දා කල්පනා කළා. කල්පනා කළා. මිල නියම කරන්ට බැහැ.



තවත් වෙළෙන්දෝ රැස් වුණා. ඔහොම මහ ගොඩක් වෙළෙන්දෝ රැස් වුණා. පලස දිහා බලනවා. පුදුම වෙනවා. මිලක් නියම කරන්ට බැහැ.

මේ වෙලාවේදී රජුගේ ඇමතියා ඒ ළඟින් ගියා. වෙළෙන්දෝ රැස්වෙලා ඉන්න හැටි දැකලා, ඒ ගැන හොයා බලන්නට ඔහු කල්පනා කළා. ඔහු රියෙන් බැහැලා සෙනඟ පීරා ගෙන ඇවිල්ලා කතා කළා.

'ආයුබෝවන් වෙළෙන්දෙනි, පිටරට සිය ආ අමුත්තෙනි, මොකද මෙතැන රැස්වෙලා?'

'මෙන්න බොහොම අපූරු පලසක්, මිලක් නියම කරන්න බැරිව අපි කල්පනා කරනවා.'

රජුගේ ඇමතියා පලස දැකලා බොහොම පුදුම වුණා.

'දුනු ශිල්පියා නුඹ මට ඇත්ත කියපන්. මේ ලස්සන පලස නුඹ කොහෙන්ද ලබා ගත්තේ?

'මගේ බිරිය මෙය වියලා දුන්නා'

නුඹ මේ පලස කීයක් ඉල්ලනවද?

'මම දන්නේ නැහැ. මිල නියම කරන්ට එපායි කියලා බිරිය කීවා. දෙන ගානක් ගන්ට කිව්වා.'

'දුනු ශිල්පියා මෙන්න නුඹට රූබල් දහදාහක්'

අන්ද්‍රේ පලස ඇමතිට දීලා සල්ලි අරගෙන ගෙදර ගියා. ඇමතියා පලස අරගෙන රජ ගෙදර ගිහිල්ලා එය රජුට පෙන්නුවා.

රජතුමා පලස අරගෙන බලා පුදුම වුණා. රටේ තියෙන හැම දෙයක්ම පලසෙහි තියෙනවා.

'ඇමතියා, නුඹට ඕන දෙයක් දෙන්නම්, පලස විතරක් ඉල්ලන්ට එපා!'

රජතුමා රූබල් විසිදාහක් ඇමතිට දීලා පලස අරගත්තා. ඇමතියා සල්ලි අරගෙන මෙහෙම කල්පනා කරනවා. 'කමක් නැහැ. ඔයිට වැඩිය හොඳ පලසක් මම වියන්ට කියන්නම්.'

ඇමතියා රිය නැඟලා අන්ද්‍රේ දුනු ශිල්පියා ඉන්න කුඩා ගෙය හොයාගෙන ගිහිල්ලා දොරට තට්ටු කලා. මාර්යා කුමරිය දොර හැරියා. ඇමතිය එක පයක් ගේ ඇතුලට තැබුවා. අනිත් පය දොරින් එපිට. ආ කාරණය ගැන ඔහුට අමතක වුණා. කුමරිය කියන්නට බැරි තරම් ලස්සනයි, ඇස් ඇරගෙන අවුරුදු සියයක් වුණත් ඇගේ ලස්සන දිහා බලාගෙන ඉන්නට පුලුවනි.

මාර්යා කුමරිය ඇමති ආපු කාරණය ගැන කියනතුරු බලාගෙන හිටියා.

ඇමතියා ගල් ගැහිලා වගේ ඇය දෙස බලාගෙන ඉන්නවා. කුමරිය ආපහු හැරිලා දොර වැහුවා. ඇමතිට සිහිය ආවේ ඉන් පසුවයි. ඔහු බොහොම අමාරුවෙන් ගෙදර ගියා. එදින සිට ඔහු කෑවත්, බීවත්, ආවත්, ගියත්, හැම තිස්සෙම දුනු ශිල්පියාගේ බිරිය ගැන හිතන්නට වුණා.

ඇමතිගේ හැසිරීම ගැන රජු දැකලා ඔහුගෙන් තොරතුරු ඇසුවා.

එවිට ඇමතියා රජුට මෙහෙම කීව්වා.

'අනේ රජ්ජුරුවන් වහන්ස, මම දුනු ශිල්පියගේ බිරියව දැක්කා. ඒ වෙලාවේ සිට මම ඇය ගැන විතරයි හිතන්නේ. දැන් මට කන්නත් බෑ, බොන්නත් බැහැ. මොනවා කළත් ඇයව අමතක කරන්න බැහැ.'

'දුනු ශිල්පියාගේ බිරිය බලන්ට යන්ට රජුට ආසා හිතුනා. රජු නිකම් මිනිහෙකු වගේ ඇඳගෙන, දුනු ශිල්පියාගේ ගෙය සොයා ගෙන ගිහිල්ලා දොරටු තට්ටු කළා. මාර්යා කුමරිය දොර ඇරියා. රජු එක පයක් ගේ ඇතුළට තියලා, අනික් පය මිදුලේ තබාගෙන, ඇය දිහා බලා ගෙන ඉන්නවා. ගල් ගැහුණ වගේ, ඇගේ ලස්සන රූපය දිහා බලාගෙන ඉන්නවා.

මර්යා කුමරිය බලා හිටියා. ආ මිනිහා කතාකරයි කියලා. ඔහු කතාවක් නැතුව ඇය දිහා බලා ගෙන ඉන්නවා. කුමරිය ආපහු හැරිලා දොර වැහුවා. රජුගේ හදවත රිදෙන්නට වුණා. 'මම මොකද මෙච්චර කල් තනිකඩයෙක් වෙලා හිටියේ? මා දැක්ක ලස්සනම ලස්සන ගැහැණිය සරණ පවා ගන්නට ඕනෑ. දුනු ශිල්පියා ගේ බිරිය වන්නට ඈට ඉඩ දීමට බැහැ. ඇය රජබිසවක් වෙන්ට ම ඕනෑ' රජු කල්පනා කළා.

රජු බොහොම අමාරුවෙන් මාලිගාවට ආවා. දුනු ශිල්පියාගේ බිරිය තමාට අයිති කරගන්නට ඕනෑ කියලා ඔහු සිතුවා. රජු ඇමතිට අඬගහලා මෙහෙම කිව්වා.

අන්දරේගේ දුනු ශිල්පියාගේ බිරිය මට ඕනෑ කියලා ඔහුට දන්වන හැටියක් ගැන කල්පනා කරපන්. උපායක් කල්පනා කළොත් නුඹට නගර, ගම්, රත්තරන් තෑගි දෙනවා. කල්පනා නොකළොත් නුඹේ හිස ගසා දමනවා'.

'ඇමතිට බොහොම කණගාටුයි. දුනු ශිල්පියාට කීමට උපායක් කල්පනා කළා, කළා. බැරිවුණා. කණගාටුව නිසා ඔහු වයින් ටිකක් බොන්ට තැබෑරුමට ගියා. වැරහැලි ඇඳුමක් ඇඳගෙන සිටි පිනට තැබෑරුම් වලින් බොන මිනිහෙක් ඉදිරියට ආවා.


'අපේ මහ රජතුමාගේ ඇමතිතුමනි ඔබතුමා කණගාටු වන්නේ මොකද?'

'පලයන්, පලයන්, යන්ට'

'ඔබතුමා මාව එළවන්ට එපා. මට වයින් වීදුරුවක් අරන් දෙන්න. එතකොට මම ඔබතුමාට හොඳ උපායක් කියා දෙන්නම්'

ඇමතිතුමා වයින් වීදුරුවක් ඒ මිනිහාට අරගෙන දීලා, තමාගේ දුක ඔහුට කිව්වා.

අන්ද්රේ දුනු ශිල්පියාට ඔය ගැන දැන්වීම අමාරු වැඩක් නොවෙයි. මිනිහා බොහොම චාම්. එයාගේ ගෑනි කපටියි. ඈට උදව් කරන්න බැරි වැඩක් අපි අන්ද්රේට බාර කරමු. ඇමතිතුමා රජ්ජුරුවන් වහන්සේට කියන්ඩ අන්ද්රේට මෙහෙම කියන්ට කියලා, මගේ පිය මහ රජතුමාගේ දුක සැප දැනගෙන එන්ට අන්ද්රේ නුඹ එලොව පලයන්, අන්ද්රේ යන්ටම යාවි. ආපසු එන්නේ නැහැ.' ඒ මිනිහා ඇමතිට කියා දුන්නා.



ඇමතියා ඒ මිනිහාට ස්තුති කරලා රජු ළඟට එක පිම්මට දිව්වා. ගිහින් උපාය ගැන රජුට කිවා.

අන්ද්රේ එලොව යවන්න ඕනෑ කියලා ඔහු රජුට දැන්නුවා. රජතුමා බොහොම සතුටු වෙලා අන්ද්රේව ගෙන්වලා ඔහුට අණ කළා. අන්දරේ නුඹ මට බොහොම අවංකව සේවය කළා. නුඹගෙන් මම තව සේවයක් බලාපොරොත්තු වෙනවා. නුඹ එලොව ගිහිල්ලා, එහි ඉන්න මගේ පිය රජතුමා ගේ සුව දුක් දැනගෙන වරෙන්. මෙය නොකළොත් නුඹේ හිස ගසා දමනවා.'

අන්ද්රේ ගෙදර ගිහිල්ලා බොහොම කණගාටුවෙන් බංකුවක් උඩ වාඩිවෙලා හිටියා. මාර්යා කුමාරිය ඔහු ළඟට ආවා.

'ඔයා මොකද කණගාටුවෙන් ඉන්නේ? ඔයාට විපතක් සිදු වුණාද?' ඈ ඇසුවා.

රජුගේ නියමය ගැන අන්ද්රේ ඈට කිව්වා.

'ඕකත් වැඩක් ද, ඕක බොහොම පොඩි වැඩක්. ලොකු වැඩ පසුවට ඇති වෙයි. දැන් ඔයා නිදා ගන්න. රෑට නැති නුවණ උදේට පහල වේවි.' මාර්යා කුමරිය මෙහෙම කියලා අන්ද්රේව සැනසුවා.

උදේ පාන්දර අන්ද්රේ නැගිට්ට හැටියේ මාර්යා කුමරිය රූලං විස්කෝතු මල්ලකුයි, රත්තරන් මුද්දකුයි ඔහුට දුන්නා.

ඔයා රජු ඉදිරියට ගිහිල්ලා මේ ගමනට ඔයාත් එක්ක යන්ට ඇමතියත් එන්ට ඕනයි කියලා කියන්න. නැතිනම් ඔයා එලොව ගියාට සාක්කි කාරයෝ නැති නිසා ඒක විශ්වාස නොකරාවි කියලා කියන්න. ඇමතියත් එක්ක ගමනට පිටත් වුණු හැටියම රත්තරන් මුද්ද විසිකරලා යන්න. ඔයාට ඕන තැනට මුද්ද ඔයාව ගෙනයාවි.'

අන්ද්රේ විස්කොතු මල්ලයි, මුද්දයි අරගෙන, බිරියගෙන් සමුගෙන ගමනට සාක්කි කාරයෙකු ඉල්ලා ගන්ට රජතුමා ළඟට ගියා. අන්දරේ මාරියා කුමරිය කී විදිහටම රජතුමාට කියා සිටියා. රජතුමා සිද්ද වුණා ඔහුගේ ඇමතියාව අන්ද්රේත් සමඟ එලොව යවන්නට.

ඔන්න ඉතින් දෙදෙනාම ගමනට පිටත් වුණා. අන්ද්රේ මුද්ද විසිකලා. එය රෝදයක් වගේ කැරකැවී යන්ට පටන් ගත්තා. විශාල කැලෑ, මඩ ගොහොරු බිම්, තණ පිට්ටනි හරහා මුද්ද ගියා. ගංගා සහ පොකුණු හරහා මුද්ද පීනුනා. අන්ද්රේ ඇමතියාවත් ඇදගෙන මුද්ද පස්සෙන් යනවා.

දෙදෙනාම මහන්සි වුණාම, වාඩිවෙලා විස්කෝතු කාලා ආයෙමත් ගමනට පිටත් වෙනවා.

ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා මේ දෙදෙනා බොහොම අඳුරු කැලෑවකට ආවා. එතන මහ විශාල වලක් ළඟ රත්තරන් මුද්ද නැවතුනා. එතන වාඩිවෙලා දෙදෙනා ම විස්කෝතු කෑවා. වළ ළඟින් යක්කු දෙදෙනෙක් කරත්තයක් දක්කනවා. කරත්තය ඇදගෙන යන්නේ අන්ද්රේලා ගේ රජුගේ පියරජ. ඔහු බොහොම මහලුයි. එක යකෙක් වම් පැත්තෙන් මහලු රජුට කෙවිටකින් අනිනවා. අනිත් යකා ඔහුට දකුණු පැත්තෙන් පහර දෙනවා.

'ඔන්න, බලපන් මේ අපේ රජතුමාගේ පිය රජතුමා නේද? අන්ද්රේ ඇසුවා.

'නුඹ හරි ඔහු දර අදිනවා.' ඇමතියා කීවා.

අන්ද්රේ යකුන්ට කතා කළා.

'යක් රාළහාමිලාට ආයුබෝවන්! මට අපේ මහලු රජතුමාගෙන් තොරතුරු ටිකක් දැනගන්ට ඕනෑ. එයාව පොඩ්ඩකට නිදහස් කරන්න.'

ඇයි බන් මිනිහෝ එතකොට කවුද දර අදින්නේ, අපිද?'

ඒ වැඩේ අපේ ඇමතිගෙන් කරවා ගන්න පුලුවනි.'

යක්කු දෙදෙනා මහලු රජුව කරත්තෙන් ලිහලා, ඇමතියාව කරත්තේට බැඳලා ඔහුට පහරදී දී වැඩ ගත්තා.

අන්ද්රේ මහලු රජතුමාගෙන් දුක සැප ඇසුවා.

'අනේ අන්ද්රේ දුනු ශිල්පියා මම බොහොම දුක් විඳිනවා. මගේ පුතාට මගෙන් සුබ පැතුම් බාර දීපන්.

රට වැසියන්ට කරදර කරන්ට එපා කියලා මම ඔහුට අණකළ බව කියපන්. නැතිනම් ඔහුටත් මට වගේම දුක් විඳින්ට සිද්ද වේවි.' මහලු රජු කීවා.

එතකොටම යක්කු දෙදෙනා හිස් කරත්තේ අරගෙන ආවා. අන්ද්රේ මහලු රජ යකුන්ට බාරදීලා ඇමතියාවත් අරගෙන ආපහු තම රටට ගියා.

තමන්ගේ රටට ඇවිත් රජ ගෙදරට ඇතුළු වුණා. රජ දුනු ශිල්පියා දැකලා බොහොම තරහෙන් කෑ ගැසුවා.

'නුඹ කොහොමද එලොව ගිහින් මෙලොව ආවේ?'

'එහෙමයි රජ්ජුරුවන් වහන්ස! එලොව ගිහිල්ලා ඔබතුමාගේ පිය රජතුමා සමඟ කතා කළා. පිය රජතුමා එලොව දුකින් පසුවෙනවා. රටවැසියන්ට කරදර කරන්ට එපැයි කියලා ඔබ තුමාට ඔබේ පියතුමා දැන්නුවා.' අන්ද්රේ රජතුමාට කීවා.

නුඹ එලොව ගිහිල්ලා මගේ පියරජතුමාව දැක්කයි කියලා ඔප්පු කරන්නේ කොහොමද?'

'ඔබතුමාගේ ඇමතියා ගේ පිට දෙපැත්තේ කෙවිට පහරවල

ලකුණු ඇති. ඒ කෙවිට පහර ගැහුවේ යකුන් දෙදෙනෙක්.'

ඇමතියා අන්ද්රේගේ කතාව ඇත්ත කියලා කිව්වා. රජුට කරන්ට කිසිවක් නැහැ. අන්ද්රේට ගෙදර යන්ට අවසර දුන්නා. ඔහු ගියාට පස්සේ රජ ඇමතිට අයෙමත් කතා කරලා මෙහෙම කීවා.

'අන්ද්රේ ගේ බිරිය මට ඕන කියලා ඔහුට දන්වන උපායක් කල්පනා කරපන්. නැතිනම් නුඹේ හිස ගසා දමනවා.'

ඇමතියා හිතේ කණගාටුව හන්දා වයින් විදුරුවක් බොන්ට තැබෑරුමට ගියා. පුටුවක වාඩිවෙලා වයින් වීදුරුවක් ඉල්ලුවා. ඔහු ළඟට තැබෑරුම් වල පිනට බොන මිනිහා දුවගෙන ආවා.

'මොකද? අපේ ඇමතිතුමා අද කණගාටුවෙන් ද? මටත් වයින් වීදුරුවක් අරන් දෙන්න, මම ඔබට යස උපායක් කියා දෙන්නම්.'

ඇමතියා පිනට බොන තැබෑරුම්කාරයාට වයින් වීදුරුවක් අරන් දීලා ඔහුට තමාගේ දුක ගැන කිව්වා. තැබෑරුම් කාරයා වයින් බීලා ඇමතියාට මෙහෙම කියනවා.

'ඔබ වහාම රජගෙදරට ගිහිල්ලා මෙහෙම කියන්න. රටවල් තිස්අටක් පහුකරගෙන තිස්නව වෙනි රටට ගිහින්, ඒ රටේ ඉන්න නිදි මන්තරකාර පූසාව අල්ලාගෙන එන්ටයි කියලා දුනු ශිල්පියාට අණ කරන්න කියන්න.'

ඇමතියා සතුටුවෙලා රජගෙදරට දුවගෙන ගිහිල්ලා උපාය ගැන රජුට කිවා, රජ අන්දරේට එන්ටයි කියලා අණ කළා.

'අන්ද්රේ නුඹ මට සේවයක් කළා. දැන් තව සේවයක් කරපන්, තිස්නව වෙනි රටට ගිහිල්ලා ඒ රටේ ඉන්න නිදි මන්තරකාර පූසාව අල්ලගෙන වරෙන්. නැතිනම් නුඹේ හිස ගසා දමනවා.'

අන්ද්රේ බොහොම කණගාටුවෙලා ගෙදර ගිහින් මාර්යා කුමරියට රජුගේ නියමය ගැන කීවා.

'ඒක කණගාටුවෙන්ට කරුණක් තමා! ඒ වුණාට එය බොහොම පොඩි වැඩක්. ලොකු වැඩ පසුවට. ගිහින් නිදාගන්න, රෑට නැති නුවණ උදේට පහළ වෙනවා! මාර්යා කුමරිය කීවා.

මාර්යා කුමරිය යකඩ කම්හල් කාරයා ළඟට ගිහිල්ලා, කම්මල් බාස්ලට කියලා යකඩ හිස්වැසුම් තුනකුයි, යකඩ අඬුවකුයි, රිටි තුනකුයි හදවා ගත්තා. එක රිටක් යකඩ, අනෙක් රිට තඹ, තුන්වැනි රිට ටියම්.

පහුවදා උදේ පාන්දර මාර්යා කුමරිය අන්දරේට කතා කළා.

'මෙන්න ඔයාට හිස් වැසුම් තුනකුයි, රිටි තුනකුයි, අඬුවකුයි, මේවාත් අරගෙන ඔයා තිස්නව වැනි රටට යන්න. ඒ රටේ ගව් තුනක් යනකොට නිදිමත හැදේවි. ඔයා නිදා ගන්ට එපා. නිදි මන්තරකාර පූසා ඔයාව නිදි කරන්ට හදනවා. දෑත් දෙපැත්තකට විසිකර කර කකුල් අද්ද අද්දා යන්න. ඉඳ හිටලා පෙරලී, පෙරලී යන්න. ඔයා නිදාගත්තොත් නිදි මන්තරකාර පූසා ඔයාව මරා දමාවී.'

මොනව කළ යුතුද කොහොම කළ යුතුද කියලා මාර්යා කුමරිය අන්ද්රේට උගැන්නුවා.

අන්ද්රේ රටවල් තිස් අටක් පහුකරගෙන තිස්නව වැනි රටට ඇවිල්ලා. ගව් තුනක් යන කොට, ඔහුට නිදිමත හැදුනා. අන්ද්රේ යකඩ හිස් වැසුම් තුන හිසෙහි දමා ගෙන, අත් දෙපැත්තට විසි කර, කර, දෙපා අද්ද, අද්දා යනවා. පෙරලි පෙරලි යනවා. කොහොම හරි නිදි මත නැති කරගත්තා. අන්ද්රේ උස කණුවක් ළඟට ආවා. නිදි මන්තරකාර පූසා අන්ද්රේව දැකලා කණුව උඩ ඉඳලා ඔහුගේ ඔළුවට පැන්නා. එක හිස්වැස්මක් කැඩුනා. දෙවැනි හිස් වැස්මත් කැඩුණා. පූසා තුන්වැනි හිස් වැස්ම කඩන්ට ලෑස්ති වෙනකොට, අන්දරේ ඌව යකඩ අඬුවෙන් අල්ලා ගත්තා. අන්ද්රේ ඌට යකඩ රිටෙන් ගහන්න පටන් ගත්තා. යකඩ රිට කැඩුණා. අන්දරේ තඹ රිටෙන් ඌට ගැහැව්වා. තඹ රිටත් කැඩුණා. ඊට පස්සේ ටියම් රිටෙන් ගහන්ට පටන් ගත්තා.

ටියම් රිට කැඩෙන්නේ නැහැ. නැමෙනවා විතරයි. නිදි මන්තරකාර පූසා ගේ පිට කොන්දේ වටේ එතුනා. අන්ද්රේ පූසාට පහර දෙනවා. ඌ පූජකයින් ගැන, අන්නව් රාළලා ගැන, පූජකයින්ගේ දූවරුන් ගැන කතන්දර කිව්වා. අන්ද්රේ උගේ කතන්දර අහන්නේ නැතුව ඌට පහර දුන්නා.

පූසාට බොහොම රිදෙනවා අන්ද්රේව නිදි කරවන්න බැරි බව ඌට තේරුණා. ඌ බැරීම තැන අන්දරේට කන්නලව් කළා.

'මාව අතහැර දාපන්. හොඳ මනුස්සයෝ. මම නුඹට ඕන උදව්වක් කරන්නම්.'

නුඹ මාත් එක්ක එනව ද?

'ඕන තැනකට එන්නම්.'

අන්ද්රේ නිදි මන්තරකාර පූසාවත් අරගෙන ආපහු ගියා. තම රටට ගිහිල්ලා රජු ඉදිරියේ පෙනී හිටියා.

'රජතුමනි! ඔබතුමා ගේ අණ අනුව නිදි මන්තරකාර පූසාව ගෙනාවා.' අන්ද්රේ කිව්වා.

රජ බොහොම පුදුම වුණා.

නිදි මන්තරකාර පූසා නුඹේ හපන්කම් පෙන්නපන්' රජ අණ කළා.

ඔන්න පූසා නියපොතු මුවහත් තියන්නට පටන් ගත්තා. මොකටද දන්නවද රජුගේ පපුවට කඩා පැනලා ඔහුගේ හදවත එළියට ගන්ට. රජ බයවුණා

'අනේ අන්ද්රේ මේ පූසාව සන්සුන් කරපන්' රජු ඉල්ලා සිටියා. අන්ද්රේ පූසාව සන්සුන් කරලා, ඌ කූඩුවක දාලා, වහලා ගෙදර ගියා. ලස්සන තරුණ මාර්යා කුමරියත් සමඟ අන්ද්රේ ජීවත් වෙනවා. රජුට මාර්යා කුමරිය කොහොමටවත් අමතක කරන්ට බැහැ. ඔහු අයෙමත් ඇමතිට මෙහෙම කිව්වා. 'කොහොම හරි මට මාර්යා කුමරියව ඕනෑ. අන්ද්රේට ඒ ගැන කියන්ට උපායක් කල්පනා කරපන්. නැත්නම් නුඹේ හිස ගහලා දමනවා.'

ඇමතියා අයෙමත් වයින් බොන්ට තැබෑරුමට ගියා. වැරහැලි ඇඳගත්, තැබෑරුම් වලින් පිනට බොන මිනිහා එතන හිටියා. ඇමතියා ඔහු ළඟට ගිහිල්ලා වයින් වීදුරුවක් අරන් දීලා ඔහු ගෙන් උදව් ඉල්ලුවා. ඒ මිනිහා වයින් වීදුරුවක් බීලා කට පිසදලා මෙහෙම කිව්වා.

'රජතුමාට ළඟට ගිහිල්ලා මා කියන විදිහට කියාපන්. අන්දරේ දුනු ශිල්පියා නැති රටට යවලා, නැති දෙයක් ගෙනෙන්ට කියලා ඔහුට අණ කරන්න කියාපන්.'

ඇමතියා බොහොම සතුටු වෙලා රජ ගෙදරට දුවගෙන ගිහිල්ලා ඔහුගේ උපාය ගැන රජුට කිව්වා. රජ අන්ද්රේ ගෙන්වා ගත්තා.

'නුඹ මට ලොකු සේවයන් දෙකක්ම කළා. තව සේවයක් කරන්න ඕනෑ. නැති රටට ගිහිල්ලා නැති රටෙන් නැති දෙයක් ගෙනෙන්. මගේ අණ ඉටු කළොත් නුඹට තෑගි දෙනවා. නැතිනම් හිස ගසා දමනවා.'

අන්ද්රේ ගෙදර ගිහිල්ලා බංකුව උඩ වාඩිවෙලා අඬන්නට පටන් ගත්තා. මාර්යා කුමරිය ඔහුගෙන් ඇහුවා.

'මගේ ආදරණීය අන්ද්රේ ඔයා මොකද අඬන්නේ? විපතක් සිදු වුණාද?

'අනේ සුන්දර කුමරිය ඔයාගේ උදවු නිසා මම රජුට සේවය කළා. ඔයාගේ ලස්සන රූපය නිසා තමා මේ කරදර. නැති රටකින් නැති දෙයක් ගෙනෙන්ට කියලා රජතුමා මට අණ කළා.'

'හැබෑට ඒක තමා නියම රාජකාරිය. කමක් නෑ ඔයා ගිහින් නිදා ගන්න. රෑට නැති නුවණ උදේට පහල වෙනවා.'

මාර්යා කුමරිය පොතක් අරගෙන කියවන්න පටන් ගත්තා. මුල ඉඳලා අගටම කියෙව්වා. නැති රටක් ගැන තොරතුරු ඒ පොතේ නැහැ. ඈ පොත විසිකරලා හිස බදා ගත්තා. මාර්යා කුමරිය ගෙයි පිළිකන්නට ගිහිල්ලා ලේන්සුවක් වැනුවා. එතකොට ලෝකයේ ඉන්න කුරුල්ලෝ සහ සත්තු එතැනට ආවා.

මාර්යා කුමරිය ඔවුන්ගෙන් නැති රටක් ගැන තොරතුරු ඇහුවා.

'කැලෑවේ ඉන්න සතුනි, අහසේ පියාසර කරන කුරුල්ලෙනි, නුඹලා යනවා, හැමතැනම පියාසර කරනවා. නැති රටට යන්නේ කොහොමද? නැති රටෙන් නැති දෙයක් ගේන්නේ කොහොමද?'

'මාර්යා කුමරියනි, ඒ වගේ රටක් ගැන අපි කවදාවත් අහලා නැහැ.' සත්තු සහ කුරුල්ලෝ පිළිතුරු දුන්නා.

මාර්යා කුමරිය අයෙමත් ලේන්සුව වැනුවා විතරයි. සත්තුයි කුරුල්ලොයි අතුරුදහන් වුණා. ඈ තවත් වරක් ලේන්සුව වැනුවා. ඇය ඉදිරිපිට යෝධයන් දෙදෙනෙක් පෙනී හිටියා.

'අඬගැහුවේ මොකද? උවමනා මොනවද?

'මගේ හිතවත් සේවකයිනි මාව මහා සාගරය මැදට ගෙනියපල්ලා.'

යෝධයෝ දෙදෙනා මාර්යා කුමාරිව උස්සා ගෙන මහා සාගරය මැදට ගියා. ඔවුන් දෙදෙනා මාර්යා කුමරිය උස්සා ගෙන සාගරය මැද කණු වගේ හිට ගෙන හිටියා. මාර්යා කුමරිය ලේන්සුව වැනුවා විතරයි, මහ

මුහුදේ ඉන්න මාලුවොයි, මුදු සත්තුයි ආවා.
'මගේ ආදරණීය මාලුවෙනි, මුහුදු සතුනි, නුඹලා මුදුවලයි, සාගරවලයි පීනනවා, නුඹලා නැති රටට යන හැටි දන්නේ නැද්ද? නැති රටින් නැති දෙයක් ගෙනෙන හැටි දන්නේ නැද්ද?

'මාර්යා කුමරියනි අපි එහෙම රටක් ගැන අහලා නැහැ.'
මාර්යා කුමරිය බොහොම දුක්වුණා. ඇයව ගෙදර ගෙනියන්ට කියලා යෝධයින්ට කිව්වා. යෝධයොදෙදෙනා ඇයව උස්සාගෙන අන්ද්‍රේගේ ගෙදරට ගෙනල්ලා එළිපත්ත උඩ තැබුවා.
උදේ මාර්යා කුමරිය අන්ද්‍රේව නැගිට්ටවලා ඔහුට නූල් බෝලයකුයි, තුවායකුයි දුන්නා.
'ඔයා ගමනට පිටත්වෙලා මේ නූල් බෝලය විසිකරන්න. එය යන තැනට ඔයත් යන්න. යන හැම තැනදීම මුහුණ හෝදන්න. අනුන්ගේ තුවා පාවිච්චි කරන්න එපා. මගේ තුවාය විතරක් පාවිච්චි කරන්න.'

අන්ද්‍රේ, මාර්යා කුමරියගෙන් සමුගෙන හතර පැත්තට වැඳලා ගමනට පිටත් වුණා. නූල් බෝලය විසි කළා. නූල් බෝලය යන පාර දිගේ ඔහුත් ගියා.

ඔන්න ඔහොම ඉතින් නූල් බෝලය යන මග දිගේ අන්ද්‍රේ යනවා. රට, රටවල් පහුකරගෙන යනවා. නූල් බෝලය අන්ද්‍රේට මග පෙන්නනවා. නූල් බෝලය එන්ට, එන්ටම කුඩා වුණා. දැන් ඒක කුකුලෙකුගේ ඔලුවක් තරම් පුංචියි, තවත් දුර යනකොට නූල් බෝලය නොපෙනෙන තරම් කුඩා වුණා. අන්ද්‍රේ දැන් හිටගෙන ඉන්නේ කුකුල් කකුල් උඩ තියෙන පොඩි ගෙයක් ඉදිරිපිට. ඒක කැරකැවෙනවා.

'පුංචි ගෙය, පුංචි ගෙය, කැලෑවට පිටුපා, මට මුණලා හිටගනින්.'

අන්ද්‍රේ ගෙට ඇතුලු වුණා. ඒ ගෙයි ඇතුලේ බොහොම වයසක මැහැල්ලක් ලොම් වලින් නූල් කටිනවා.

'අපොයි, අපොයි, මිනිස් ගඳයි. මගේ ගෙදරට මිනිහෙක් ඇවිල්ලා. මම ඒ මිනිහව මරලා බැදගෙන කාලා, ඔහුගේ ඇට කටු උඩ නටනවා.' මැහැල්ල කිව්වා.
'බාබායිගා යකින්න, නුඹ මොනවා කියනවද, රට රටවල් ගානේ ඇවිද්ද මගේ ඇග පතේ කුණු ගොඩයි. ඉස්සෙල්ලා නුඹ වතුර උණුකරවලා මාව නාවලා, පස්සේ මාව කාපන්' කියලා අන්ද්‍රේ ඈට කිව්වා.

බාබයිගා යකින්න අන්දරේට නාන්ට වතුර උණු කළා. අන්ද්‍රේ උණු වතුර නාලා මාර්යා කුමරිය දුන් තුවායෙන් ඇග පිහදාන්න පටන් ගත්තා.

'නුඹට කොයින්ද ඔය තුවාය? ඔය තුවාය මගේ දුවටයි අයිති.' බාබායිගා යකින්න ඇහුවා.
'නුඹේ දුව මගේ බිරිය. ඇය තමා මේ තුවාය මට දුන්නේ.'

අනේ මගේ හොඳ බෑණෝ! නුඹට සත්කාර කරන්නේ කොහොමද?

බාබායිගා යකින්න කෑම මේසය පිළියෙල කළා. වයින් සහ මී පැණි ගෙනාවා. අන්ද්‍රේ ආඩම්බරකම් නැතුව මේසයට ඉඳගෙන කෑවා. බීවා, බාබායිගා යකින්න මාර්යා කුමරිය ගැන විපරම් කළා. කසාද බැඳලා හොඳින් ජීවත් වෙනවද කියලා ඇහුවා. අන්ද්‍රේ සියලු විස්තර ඈට කිව්වා. රජතුමා නැති රටින් නැති දෙයක් ගේන්ට කියලා අණ කළ හැටිත් ඇයට කීවා.

'අනේ නැන්දම්මේ මට උදව් කරන්න!'
'බෑනෝ මම නැති රට ගැන උපන්තේකට අහලා නැහැ.' බබයිගා යකින්න කිව්වා.

'ඔය ගැන දන්න ගෙම්බෙක් ඉන්නවා. ඌ අවුරුදු තුන්සියක් තිස්සේ මඩ ගොඩේ ඉන්නවා... දැන් ඉතින් කමක් නැහැ. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා. නුඹ දැන් නිදා ගනින්.'

අන්ද්‍රේ නිදාගත්තා. බාබායිගා යකින්න ඉපල් දෙකක් අරගෙන ගෙම්බාව හොයා ගෙන අහසින් ගියා. මඩ ගොහොරුවට ගිහිල්ලා ගෙම්බාට කතා කළා.

'වයසක ගෙම්බා තවම ඉන්නවද?'
'ඉන්නවා'
'කරුණාකරලා මා ළඟට
එන්න.'

මහලු ගෙම්බා එළියට ආවා.
'නුඹ දන්නවද නැති රට ගැන. නැති රටේ නැති දේ ගැන?' බාබායිගා යකින්න අහනවා.
'දන්නවා'
'කරුණාකරලා නැති රටට යන පාර පෙන්නාපන්. මගේ බෑණාට එහි යන්නට රජ්ජුරුවෝ අණ කරලා. නැති රටින්, නැති දෙයක් ගේන්ට ඕන කියලා ඔහුට රාජා අණ කරලා තියෙනවා.'

මම ඔහුට පාර පෙන්වන්නම්. මම දැන් බොහොම මහලුයි. මට පනින්ට බැහැ. පිරිසිදු එළකිරි වලට දාලා මාව ගිනි ගඟ ළඟට ගෙනියන්න කියලා නුඹේ බෑණට කියාපන්. එතැනදී මම ඔහුට කියා දෙන්නම්.'

බාබායිගා යකින්න ගෙම්බාව අරගෙන ගෙදර ගිහිල්ලා එළදෙනගෙන් මුට්ටියකට කිරි දොවලා ගෙම්බාවත් ඒ මුට්ටියට දැම්මා.

> **තුන්වෙනි වෙළෙන්දා සාක්කුවෙන් බටනලාවක් අරගෙන වාදනය කළා. යුද්ධ හමුදාවක් ආවා. අසරු හමුදාවකුයි, පාබල හමුදාවකුයි ආවා. යුද අවි, කාලතුවක්කු අරගෙන හමුදාව ගමන් කරනවා. යුද්ධ සංගීත ඇහෙනවා. කොඩි ලෙලදෙනවා. අසරු භටයෝ යුද්දෙට සැරසෙනවා.**

උදේ පාන්දර අන්දරේව කුද්දලා ඔහුට බාබායිගා යකින්න මෙහෙම කිව්වා.

'බෑණෝ නැගිටපන්, මේ කිරි මුට්ටියේ ගෙම්බා ඉන්නවා. ඌව අරගෙන මගේ අස්පයා පිට නැගලා ගිනි ගඟ ළඟට පලයන්. අස්පයාට යන්ට ඉඩ දීලා ගිනි ගඟ ළඟදී ගෙම්බාව කිරි බඳුනෙන් එළියට ගනින්. ගෙම්බා නුඹට ඕනදේ කියාදේවි.'

අන්ද්‍රේ ඇඳ ගෙන කිරි මුට්ටියක් අරගෙන අශ්වයා පිට නැග්ගා. අශ්වයා බොහොම වේගයෙන් දුවලා, දුවලා ගිනි ගඟ ළඟට ආවා. ගිනි ගඟ හරහා කිසිම සතෙකුට පනින්න බැහැ.

අන්ද්‍රේ අසු පිටින් බැස්සා විතරයි. ගෙම්බා ඔහුට කතා කළා.
'තරුණයා මාව එළියට ගනින්, අපට ගඟ හරහා යන්ට ඕන.'
අන්ද්‍රේ ගෙම්බාව කිරි බඳුනෙන් එළියට අරගෙන බිම තැබුවා.
'තරුණයා නුඹ මගේ පිට උඩ නැගපන්.'
'අනේ නුඹ බොහොම පුංචියි, මම නැග්ගොත් නුඹ පොඩිවී යාවි.

'නුඹ බයවෙන්ට එපා. මගේ පිට උඩ නැගලා හයියෙන් අල්ලා ගනින්.'

අන්ද්‍රේ උගේ පිට උඩ නැග්ගා විතරයි ඌ පිම්බෙන්ට පටන් ගත්තා. ඌ පිම්බිලා, පිම්බිලා ලොකු පිදුරු ගොඩක් තරම් ලොකු වුණා.

නුඹ මාව හයියෙන් අල්ලාගෙන ඉන්නවද?
'ඔව්, ඔව්.'

ගෙම්බා අයිමත් පිම්බිලා, පිම්බිලා ලොකු කන්දක් තරම් විශාල වුණා. ඌ දැන් ලෝකේ තියෙන උසම ගහට වඩා උසයි. ගෙම්බා එක පිම්මට ගිනි ගඟ හරහා පැන්නා. ගඟෙන් එහාට පැන්නට පස්සේ ඌ ආයෙමත් පොඩි ගෙම්බෙක් වුණා.

'තරුණයා ඔය අඩි පාර දිගේ පලයන්. ඔහොම යනකොට ගෙයක් පෙනේවි. ගෙයක් කියල කියන්නත්, මඩුවක් කියල කියන්නත් බැහැ. නුඹ එතැන උදුන ළඟ හිටගනින්. නැති රටේ නැති දෙය එතැනදී ලැබේවි.' ගෙම්බා කිව්වා.

අන්ද්‍රේ අඩි පාර දිගේ ගියා. ඔන්න තියෙනවා ගෙයක් වගේ මඩුවක්, නැහැ මඩුවක් වගේ ගෙයක්. එය වටේට වැටක්. ඒ ගෙදරට පිළිකන්නක් නැහැ. ජනේල නැහැ. අන්ද්‍රේ ඒ ගෙදර උදුනට මුවා වෙලා හිටියා.

ටික වේලාවක් ගත වුණා. කැලෑව පැත්තෙන් සද්දයක් ඇහෙනවා. දිග නියපොතු ඇති, වැළමිට ළඟට යටි රැවුලක් ඇති මිනිහෙක් එනවා. ඔහු ඇවිත් කෑ ගැසුවා. 'ඒයි, නවුම් මස්සිනා. බඩ ගිනියි කෑම දීපන්.'

කොහේ ඉඳලද දන්නේ නැහැ. එකපාරටම මේසයක් මතුවුණා. මේසය උඩ බීර පයිප්පයකුයි, තෙලෙන් තම්බපු ලොකු

හරකෙකුයි, තම්බපු හරකාගේ ඇඟට පිහියෙන් ඇනලා තියෙනවා. යටි රැවුළා මේසය ළඟට වාඩිවෙලා මස් කෑලි වලට කපලා සුදුළූණු එක්ක කෑවා. කන ගමන් පුරසාරම් දොඩවනවා.
හරකාගේ මස් ඔක්කොම කාලා බීර පිප්පයම බිව්වා.

'නවුම් මස්සිනා මේසය අස් කරපන්.' යටි රවුලා කී හැටියේම මේසය අතුරුදහන් වුණා.

එතැන මස් කටු, හිස් බීර පිප්පය කිසිම දෙයක් තිබුණෙ නැහැ.
ඔක්කොම අතුරුදහන් වුණා. යටි රැවුලා යනතුරු අන්ද්රේ හැංගිලා හිටියා. අන්ද්රේ උඳුන මුල්ලේ ඉඳලා එළියට ඇවිත් බය නැතුව මෙහෙම කිව්වා.

ඒයි නැවුම් මස්සිනා මට කෑම දීපන්!'
කිව්ව හැටියේම කොහේ ඉද්ලද, කෑම බීම මහ ගොඩක් එක්ක මේසයක් දිස් වුණා. මේසය උඩ කෑම විතරක් නෙමෙයි, වයින් තියෙනවා. මී පැණි තියෙනවා.

අන්ද්රේ මේස උඩ වාඩි වුණා.
'නවුම් මස්සිනා. මාත් එක්ක මේසයට වාඩිවෙලා කාපන්, බීපන්.' අන්ද්රේ කිව්වා.

නොපෙනෙන මිනිහා ඔහුට පිළිතුරු දුන්නා.
'නුඹට බොහොම ස්තුතියි. නුඹ බොහොම කරුණාවන්ත මිනිහෙක්. මම අවුරුදු කියක් තිස්සේ සේවය කරනවද, මට පාන් වාටියක්වත් දුන්නේ නැහැ. නුඹ මට මේසයට වාඩිවෙලා කෑම කෑමට අඬගැසුවා.'

අන්ද්රේට කට හඬ ඇහෙනවා. කතා කරන මිනිහාගේ රූපය පේන්නේ නෑ. මේසය උඩ තියෙන කෑම ජාති ඉක්මණින් අඩුවෙන හැටි පේනවා. වයින් ඉබේටම විදුරුවට වත්කරනවා. නොපෙනෙන මිනිහා ඒවා බොනවා. වයින් අඩුවෙන හැටි විතරයි පේන්නේ. බොන හැටි පේන්නේ නැහැ.

'නැවුම් මස්සිනා මා ඉදිරියේ පෙනී හිටපන්.' අන්දරේ ඉල්ලා හිටියා.
'මාව කාටවත් පේන්නේ නැහැ. මම තමයි නැති දේ.'
'නවුම් මස්සිනා නුඹ මට සේවය කරන්ට ලෑස්ති ද?'

'අකැමැති වෙන්ට කාරණයක් තියෙනවද? නුඹ බොහොම හොඳ මනුස්සයෙක් බව පේනවා.'
දෙදෙනාම කෑවා, බීවා.
'නවුම් මස්සිනා දැන් ඉතින් නුඹගේ බඩුත් අරගෙන මාත් සමඟ ගමනට පිටත් වෙමු.'
අන්ද්රේ ගමනට පිටත් වුණා.
'නවුම් මස්සිනා නුඹ මෙතැනද?'
'ඔව්, ඔව්, මං මෙතැන. මම නුඹව අත්හැරලා යන්නේ නෑ. නුඹ බයවෙන්ට එපා.' නොපෙනෙන මිනිහා කියන හැටි අන්ද්රේට ඇහුණා.

අන්ද්රේ ගිනි ගඟ ළඟට ආවා. එතැන ඔහු එනතුරු ගෙම්බා බලා ගෙන ඉන්නවා.

'කොහොමද නැති දේ හොයාගත්තද?'
'ඔව් හොයාගත්තා.'
'මගේ පිට උඩ නැගපන්.' ගෙම්බා අන්ද්රේට කිව්වා.
ගෙම්බා කන්දක් විතර ලොකුවන තුරු පිම්බිලා, ගිනි ගඟෙන් එගොඩට එක පිම්මෙට පැන්නා.
අන්ද්රේ ගෙම්බාට බොහොම ස්තුති කරලා තමාගේ රටට යන්න පිටත් වුණා. ඔහු ගිහිල්ලා ගිහිල්ලා පස්ස හැරිලා කතා කරනවා.

'නවුම් මස්සිනා නුඹ මෙතැනද? ඔව් මම නුඹ ළඟමයි. නුඹ බයවෙන්න එපා! නුඹ අතහැරලා දාල මම යන්නේ නෑ.
අන්ද්රේ යනවා, යනවා, යනවා, ඔහුගේ දෙපා වලට බොහොම මහන්සියි. දෑත්වලට බොහොම තෙහෙට්ටුයි.

'අනේ, අනේ, මට කොතරම් මහන්සිද?' අන්ද්රේ තමාටම කියාගත්තා.
'නුඹ ඇයි මට ඉස්සෙල්ලා නොකීවේ? මම නුඹව ඉක්මණට ගෙනියන්නම්.' නොපෙනෙන නවුම් මස්සිනා ඔහුට කීව්වා.

අන්ද්රේ හිටි හැටියේම අහසින් යන්ට පටන් ගත්තා. කඳු, කැලෑ, නගර සහ ගම්, කුඩාවට පේනවා. අන්ද්රේ නිල්පාට මහමුහුද උඩින් පියාසර කළා. ඔහුට බය හිතුණා.

'නවුම් මස්සිනා මට පොඩ්ඩක් විවේක ගන්න ඕනෑ.

අන්ද්රේ ඉබේටම පහතට වැටෙන්නට පටන් ගත්තා. මූදට ළං වෙන කොට මහ මූද මැද පොඩි දූපතක් තියෙනවා. එතැන මාලිගාවක්. මාලිගාවේ වහළ රත්තරන්, මාලිගාව වටේ ලස්සන මල් වත්තක්. නොපෙනෙන මිනිහා අන්දරේට මෙහෙම කිව්වා.

'නුඹ විවේක ගනින්, කාපන්, බීපන්, මූද දිහා බලපන්. මේ දූපත ළඟින් වෙළඳ නැව් තුනක් යාවි. ඒ නැව් තුනේ වෙළෙන්දන් තුන්දෙනාට අඬගහපන්, ඒ ගොල්ලන්ට හොඳට කන්ට, බොන්ට දීපන්. ඒ ගොල්ල ළඟ තියෙනවා වටිනාදේවල් තුනක්. නුඹ ඒවා තුනට මාව හුවමාරු කරගනින්. නුඹ බයවෙන්න එපා. මම ආපසු නුඹ ළඟටම එනවා'

ඔන්න ඔහොම අන්ද්රේ මාලිගාවට වෙලා මුහුද දිහා බලා ගෙන ඉන්නකොට, වෙළඳ නැව් තුනක් ආවා. මාලිගාවේ රත්තරන් වහලයි, ලස්සන මල් වත්තයි දැකලා වෙළෙන්දෝ පුදුම වුණා.

'මේක හරි පුදුමයක් නේද? අපි මෙතනින් කීපාරක් ගියාද, ආවද, මෙතැන කිසිම දූපතක් තිබුණේ නැහැ. අපි මාලිගාවට යමු!. වෙළෙන්දෝ කිව්වා.

නැව් තුන නැංගුරම් දාලා නවත්වලා වෙළෙන්දෝ තුන්දෙනා පුංචි බෝට්ටුවකින් දූපතට ආවා. අන්ද්රේ මේ තුන්දෙනාම පිළිගන්ට ඉදිරියට ආවා.

'කරුණාකරලා මාලිගාවට එන්න.'
වෙළෙන්දෝ මාලිගාව බලනවා, රත්තරන් වහල දිහා බලනවා. මල් වත්තේ ලස්සන කුරුල්ලෝ ගී ගයනවා. ලස්සන මුවපැටවුන්, හාවුන් දුවනවා.

'ඔබට මේතරම් ලස්සන මාලිගාවක් හැදුවේ කවුද? වෙළෙන්දෝ ඇහුවා.
'මගේ යාලුවා නැවුම් මස්සිනා මේ සේරම එක රෑට හැදුවා.'
අන්ද්රේ වෙළෙන්දන් ව මාලිගාවට ගෙනාවා.
'නවුම් මස්සිනා මේ අයට කන්ට බොන්ට ඕන. ලැහැස්ති කරන්න.'

ඔන්න හිටි හැටියේම ලොකු මේසයක් පුරා කෑම බීම ජාති තියෙනවා. වෙළෙන්දෝ පුදුමවෙලා කට ඇරගෙන බලාගෙන ඉන්නවා.

'අපි අපේ ළඟ තියෙන ඕනෑම දෙයකට නුඹේ නවුම් මස්සිනාව හුවමාරු කරගන්න කැමතියි.' කියලා වෙළෙන්දෝ කීවා.

'හුවමාරු කරගන්නේ මොනවාට ද? නුඹ ළඟ තියෙන දේ මොනවාද?

එක වෙළෙන්දෙක් මන්තර පොල්ලක් පෙන්නුවා.
'මේක පුදුම පොල්ලක්. ඔය මිනිහට ගහපිය කියලා කී හැටියේම පොල්ල දඩි බිඩි ගාලා ඕනෑම මිනිහෙකුට පහර දෙනවා. ඕනෑම චන්ඩියෙකුගේ ඇට කටු කඩාවි.'

අනිත් වෙළෙන්දා පොරවක් අරගෙන, පොරොවේ මිට උඩට හරවලා මෙහෙම කිව්වා.

'පොරොව වැඩ පටන් ගනින්.' පොරොව පට පට ගාලා දර පලලා ලස්සන නැවක් හැදුවා. පට පට ගාලා තවත් නැවක් හැදුවා. ඒ නැවේ රුවල් තියෙනවා කාල තුවක්කුත් තියෙනවා. පණ ඇති නාවිකයෝ වැඩ කරනවා. නැව් මුහුදේ යනවා. කාල තුවක්කු වෙඩි තියනවා. නිර්භිත නැවිකයෝ වැඩ කරනවා.

පොරොවේ මිට පහළට හැරෙව්වා විතරයි, නැව් නාවිකයෝ සියලු දේම අතුරුදහන් වුණා.

තුන්වෙනි වෙළෙන්දා සාක්කුවෙන් බටනලාවක් අරගෙන වාදනය කළා. යුද්ධ හමුදාවක් ආවා. අසරු හමුදාවකුයි, පාබල හමුදාවකුයි ආවා. යුද අවි, කාලතුවක්කු අරගෙන හමුදාව ගමන් කරනවා. යුද්ධ සංගීත ඇහෙනවා. කොඩි ලෙලදෙනවා. අසරු භටයෝ යුද්දෙට සැරසෙනවා.

නළාවේ අනිත් කොනින් වාදනය කළා විතරයි. හමුදාව, අශ්වයෝ, යුද අවි සේරම අතුරුදහන් වුණා.

අන්ද්රේ වෙළෙන්දාට කතා කළා.
'නුඹලා ළඟ තියෙන දේ හොඳයි. නමුත් මගේ යාලුවා මට බොහොම වටිනවා. පොල්ලයි, පොරොවයි, නළාවයි තුනම මට දෙනවා නම් මම නුඹලාට මගේ යාලුවාව බාර දෙන්නම්.'

'නුඹ බොහොම වැඩියෙන් ඉල්ලනවා නේ ද?' වෙළෙන්දෝ ඇහුවා.
'කැමති නැති නම් අපි මේ කතාව නවත්වමු.'

වෙළෙන්දෝ කල්පනා කරලා, කරලා තීරණය කළා. 'අපිට

මොකටද පොල්ලයි, පොරොවයි, නළාවයි. නවුම් මස්සිනාව ලබා ගත්තොත් අපට කිසි කරදරයක් නැතිව හොඳට කාලා, හොඳට බීලා ඉන්ට පුළුවනි.'

නැව් අයිතිකාර වෙළෙන්දෝ තුන්දෙනා අන්දරේට පොල්ලයි, පොරොවයි, නළාවයි තෑගි දුන්නා. ඒ ගොල්ල නොපෙනෙන මිනිහට කතා කළා.

'නවුම් මස්සිනා අපි නුඹව අයිති කර ගත්තා. නුඹ අප සමඟ වරෙන්! නුඹ අපට කීකරුව සේවය කරනවද?'

ඔන්න එතකොට නොපෙනෙන මිනිහාගේ කට හඬ ඇහෙනවා.

'සේවය කරන්ට මොකද බැරි? කා ළඟ හිටියත් කාට සේවය කළත් මට එකයි!'

වෙළෙන්දෝ තුන්දෙනා නැව් වලට ඇවිල්ලා නවුම්ට කියලා කෑම, බීම ගෙන්වා ගෙන කන්ටයි, බොන්ටයි පටන් ගත්තා. බීලා වෙරි වෙලා කෑ ගහනවා.

'නවුම් මස්සිනා තවත් බීම, තවත් බීම ගෙනෙන්!'

වෙළෙන්දෝ තුන්දෙනා බීලා හොඳටම වෙරි වෙලා වැටුණ තැන ගොරව, ගොරව නිදා ගත්තා.

අන්ද්රේ මාලිගාවට වෙලා කණගාටු වුණා.

'අනේ, අනේ, මගේ හොඳ යාලුවා නවුම් මස්සිනා දැන් කොහිද?'

'මම මෙතැන. නුඹට මොනවද ඕන?' නොපෙනෙන මිනිහා ඇහුවා.

අන්ද්රේ බොහොම සතුට වුණා.

'මට දැන් මගේ රටට යන්ට, මගේ සුන්දර බිරිය ළඟට යන්ට වේලාව හරි නේද? මාව ගෙදර ගෙනියන්න.'

ඔන්න ආයෙමත් අන්ද්රේ ඉබේටම අහසින් යන්නට පටන් ගත්තා. ඔහු තමාගෙ රටට ගියා.

සෙනෙවිරු අන්ද්රේ අණ දෙන තුරු බලා ඉන්නවා. අන්ද්රේ යුද්ධ පටන් ගන්නට අණ කළා. යුද බෙර ගහනවා, නළා පිඹිනවා. හමුදාව ඉස්සරහට ගියා. පාබල හමුදා රජුගේ සේනාවට පහර දුන්නා. අස්ව හමුදා ඉදිරියට ගියා. රජුගේ හටයින් සිර භාරයට ගත්තා. මුහුදු වෙරළේ ඉඳන් කාලතුවක්කුවලින් වෙඩි තැබුවා. රජුගේ අගනුවරට වෙඩි වැදුණා.

බීලා වෙරි වෙලා නිදාගත්තු වෙළෙන්දෝ නැගිටලා ආයෙමත් බීම ඉල්ලන්ට වුණා.

'ඒයි නවුම් මස්සිනා අපිට කෑම බීම විගහට ගෙනෙන්! කොහේද, නොපෙනෙන මිනිහා අහලකවත් හිටියේ නැහැ. දූපතක් නැහැ. මාලිගාවක් නැහැ. එතැන මුහුද විතරයි. රැළි නගන හඬ විතරයි. නැව් අයිතිකාර වෙළෙන්දෝ කණගාටු වුණා. අර නපුරු මිනිහා අපව රැවටුවා!' කරන්ට දෙයක් නැහැ. ඒ ගොල්ලෝ නැව් පදවාගෙන යන්ට ගියා.

අන්ද්රේ දුනුශිල්පියා අහසින් ඇවිල්ලා ගෙදරට පාත් වුණා. එතැන ගෙයක් නැහැ. ගේ වෙනුවට ගින්නට අහුවෙලා කළු පාට වුණු යකඩ පයිප්පයක් විතරයි ඉතිරි වෙලා තිබුණේ.

අන්ද්රේ බොහොම කණගාටුවෙලා, නගරයේ ඉඳලා මහ මුහුද අයිනේ පාළු තැනකට ගිහිල්ලා කල්පනා කළා. කොහේදෝ ඉඳලා නිල්පාට කොබෙයියෙක් පියාඹාගෙන ඇවිත්, අන්ද්රේ ළඟ බිම වැටිලා එකපාරටම ලස්සන කුමාරියක් බවට පත්වුණා. ඒ තමා මාර්යා කුමරිය.

දොදෙනාම සිප ගත්තා. වැළඳ ගත්තා. තම තමාට වුණ දේ ගැන කතා කරන්නට වුණා.

'ඔයා ගෙදරින් පිටවී ගියදා ඉඳලා මම නිල්පාට කොබෙයියෙක් වෙලා පියාසර කරනවා. රජ්ජුරුවෝ මට එන්ටයි කියලා පණිවුඩ තුනක්ම එවුවා. මාව අල්ලන්ට ආවා. මා හිටියේ නෑ. රජුගේ සේවකයෝ අපේ ගෙයට ගිනි තැබුවා.' මාර්යා කුමරිය කිව්වා.

'නවුම් මස්සිනා, මූද ළඟ මේ පාලු ඉඩමේ නුඹට බැරිද මාලිගාවක් හදන්නට.' අන්දරේ නොපෙනෙන මිනිහාගෙන් ඇහුවා.

'බැරි මොකද? මේ දැන් වහාම හදන්නම්.'

මොහොතක් ගියේ නෑ ලස්සන මාලිගාවක්. රජුගේ මාලිගාවටත් වඩා හොදයි. මාලිගාව වටේට මල් වත්තක්. ගස් උඩ ලස්සන කුරුල්ලෝ ලැගලා ඉන්නවා. ලස්සන මුව පැටවු හා පැටවු වත්ත හැම තැනම දුවනවා.

අන්ද්රේ මාර්යා කුමරියගේ අතින් අල්ලාගෙන මාලිගාව ඇතුළට ගියා. මේ දෙදෙනා ජනේල ළඟ වාඩිවෙලා සිප ගන්නවා. ආදර බස් කියනවා.

හුරතල් කරනවා. ඔහොම සැපෙන් සතුටෙන්, මාස දෙකක්, තුනක්ම කල් ගත කළා.

ඒ අතර රටේ රජ්ජුරුවෝ දඩයම් කරන්ට මුහුද ළඟ කැලෑවට ආවා. ඉස්සර පාලු ඉඩමේ දැන් මාලිගාවක් තියෙනවා දැකලා රජුට තරහ ආවා.

'කොයි අඩම්බරකාරය ද මගෙන් අවසර නැතුව මෙතැන මාලිගාවක් හැදුවේ.?'

රජුගේ මෙහෙකාරයෝ මාලිගාව ළඟට ගිහින් සොයා බැලුවා. ආපහු ඇවිත් රජුට ඒ ගැන කිව්වා. ඒ මාලිගාව අන්ද්රේ දුනුශිල්පියා හදලා තියෙන්නේ. එතැන ඔහු මාර්යා කුමරිය සමඟ ජීවත් වෙනවා.

ඒ වතාවේ රජුට බෙහොම තරහ ආවා. 'අන්ද්රේ නැති රටට ගිහිල්ලා නැති රටෙන් නැතිදේ ගෙනාවද කියලා හොයා දැනගෙන වරෙල්ලා.' රජ මෙහෙකරුට අණ කළා.

මෙහෙකරුවෝ ගිහිල්ලා විපරම් කරලා ඇවිත් රජුට දන්වනවා.

'රජ්ජුරුවහන්ස අන්ද්රේ දුනු ශිල්පියා නැති රටට ගිහිල්ලා නැති දේ අරගෙන ඇවිත් ඉන්නවා.'

ඒ පාර රාජාට තවත් තරහා ගියා. වහාම මුහුදු වෙරළට ගිහිල්ලා මාලිගාව විනාශ කරලා අන්ද්රේවයි, මාර්යා කුමරියවයි අල්ලා දස වද දීලා මරා දමන්ට කියලා රජ හමුදාවට නියම කලා.

රජුගේ යුද්ධ හමුදාව මාලිගාව විනාශ කරන්ට එන හැටි අන්ද්රේ දැක්කා. ඉක්මණට පොරොව අතට අරගෙන මිට ඉහළට හරවලා මෙහෙම කිව්වා. 'හදපන් නැවක්. හදපන් නැව් දෙකක්. හදපන් නැව් සියයක්.' කිව්ව හැටියේම පොරොව නැව් සියයක් හැදුවා. ඒවා දැන් මුහුදේ ගමන් කරනවා.

අන්ද්රේ බට නළාව අරගෙන වාදනය කළා. අස්ව හමුදාවක් ආවා. පාබල හමුදාවන් අවි ගෙනාවා. කාල තුවක්කු ගෙනාවා, යුද කොඩි ගෙනාවා.

සෙනෙවිරු අන්ද්රේ අණ දෙන තුරු බලා ඉන්නවා. අන්ද්රේ යුද්ධ පටන් ගන්නට අණ කළා. යුද බෙර ගහනවා, නළා පිඹිනවා. හමුදාව ඉස්සරහට ගියා. පාබල හමුදා රජුගේ සේනාවට පහර දුන්නා. අස්ව හමුදා ඉදිරියට ගියා. රජුගේ හටයින් සිර භාරයට ගත්තා. මුහුදු වෙරළේ ඉඳන් කාලතුවක්කුවලින් වෙඩි තැබුවා. රජුගේ අගනුවරට වෙඩි වැදුණා.

තමාගේ හමුදා පරාද වෙලා දුවන හැටි රජ්ජුරුවෝ දුටුවා. ඔහු හමුදාව නවත්වන්නට ඉදිරියට ආවා. එතකොට අන්දරේ පොල්ලට කතා කළා.

'පොල්ල දුෂ්ට රාජාගේ ඇට කටු කඩාපන්.!'

පොල්ල රෝදයක් වගේ කැරකැවිලා රජ්ජුරුවන්ගේ පස්සෙන් එළවාගෙන ගිහිල්ලා, රජුගේ නළලට ගැහුවා. ඒ පහරට මෝඩ, නපුරු රාජා මළා.

යුද්දේ නැවතුනා. නගරවල හිටිය මිනිස්සු අන්ද්රේ හොයාගෙන එන්ට පටන් ගත්තා. රට පාලනය කරන්ටයි, රජකම බාරගන්ටයි කියලා මිනිස්සු අන්ද්රේ ගෙන් ඉල්ලා හිටියා.

අන්ද්රේ රට වැසියන්ගේ ඉල්ලීමට කැමති වුණා. ඔහු රට වැසියන්ට ලොකු උත්සවයක් ලෑස්ති කළා. බොහෝ කල් යන තුරු මාර්යා රජ බිසවයි අන්ද්රේ රජුයි බොහොම හොඳින් රට පාලනය කළා.

(රුසියන් සුරගනා කතාවකි)



# නව රෙජිමේන්තු අධිපති ලෙස යළි සපැමිණි මේජර් ජෙන





රාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී





# වයිට් හැකල් කාටූනය




අදහස : මේජර් හරිඳු විජේසිංහ ශ්‍රීලංපාත
චිත්‍ර : සෙ/30/875 කෝප්‍රල් ප්‍රේමලාල් විජේසිංහ (4 ශ්‍රීලංපාත)

# විරු උපහාර

හමු වී ගෙවුණු දින දෙක තුන නොසිතූ ලෙසින්
තිව්වා විරාමය හමුවුනු දෙසින් මැදින්
මතු දිනකදි හමුවන්නට සතුටක කඳුල මැදින්
යන්නට සැරසුනා රට රැක ගනු පිණිස දිරින්

මා පිය නෑසියන් නොමැතිව දින සති මාස ගණන්
ඇත රැඳි යුධ බිමේ යුධ අවි අතට අරන්
දිනු බිම නගන්නට සිත ගත දිරිය අරන්
පෙරමුණේ නුඹ යන්න නුඹට ජය රත්තරන්

දැරුමට වේදනා බැරිමුත් ගත සිත දෙකට ඔබේ
ඔබගේ මෙහෙය ලක් මවටයි වැඩිය අගේ
ජය පැන් බොන දිනය වැඩි ඈතක නැති බවයි පෙනේ
හැම දෙවි රැකවරණය ඔබටයි කුමරුවනේ

16 ශ්‍රීලංපාභ ගුණතිලක ඩීජීඑස්කේගේ
සොහොයුරිය

# අපරාධ සහ බුදු දහම

අන් අයට අල්ප මාත්‍රයක හෝ මානසික හෝ කායික පීඩාවක් ඇතිවන ලෙස දැනෙන ලෙස යමක් සිදු කිරීම අපරාධයකි.

අපරාධ මර්ධනයට බුදු දහම ප්‍රබල ආයුධයකි. බුදු දහම මගින් අපරාධ වැළැක්වීම සඳහා අවශ්‍ය කරන උපදෙස් ලබාදී ඇත.

සමාජයේ මුලින්ම නිති දර්ශනයක් ගොඩනංවා ඇත්තේ බුදුරජාණන් වහන්සේය. එය ග්‍රන්ථ පහකින් යුක්ත විනය පිටකයයි.

පංච ශීලය ගිහියාගේ නිත්‍ය ශීලයයි. එයද ගිහියාගේ නීතියයි. එය මැනවින් ආරක්‍ෂා කරන්නන් කිසි අපරාධයකට නැඹුරු නොවේ.

ප්‍රධාන වශයෙන් අපරාධවලට මූලික වන්නේ සිතයි. සියලුම අරමුණුවලට හේතු කාරණා වන සිත රැක ගැනීම තුලින් අපරාධ වලින් වැළකී සිටින්නට අපට බොහෝ ඉඩ ප්‍රස්ථාව ඇත.

පරඹුවන් මව මෙන්ද, අනුන්ට අයත් දේ කැට කැබිලිති මෙන්ද, සියලු සතුන් තමන් මෙන්ද යමෙක් දකී නම් එය නිවැරදි දැකීමයි.

උපපති ටීපී විතානගේ
1 ආබ ශ්‍රීලපාභ


අඩුවෙන් කථා කරන්න. වැඩියෙන් ඇහුම් කන් දෙන්න

# පිය සෙනෙහසක නිමාව..............

නොසිතූ විලසක මගෙ ආදර තාත්තේ
දුරකථන ඇතුමකි මා වෙත එන්නේ
ඔබ මෙලොවින් සමුගෙන ඇති බව පවසන්නේ
එය කෙලෙසක මා ඉවසා සිටින්නේ

සිතාගත නොහැකිය කුමක් සිදුවුණිද කියා
ඔබ මා අතහැර සදහටම යන්න ගියා
තාත්තේ මා තවමත් සිටින්නේ ඔබ ගැනම සිතා
එන්න බලන්න මා ළගම පෙර ලෙස දුවේ කියා

අම්මට මා කෙලෙස කියන්නද තාත්තේ
ඔබ ආපසු එන්නැති බව ගෙදර තාත්තේ
මගේ දෙනෙතේ කඳුළු හංගගෙන තාත්තේ
අම්මට මම ඔබ නැති බව කිවා තාත්තේ

මැදියම් රැයේ ඔබ එන මග බලමින්නේ
හමුදා භට පිරිසකි පළමුව ආවේ
තාත්තව තබන්න තැන සූදානම් කරමින්නේ
ලි දඬු වලින් සැදුනු පෙට්ටිය ගෙට ආවේ

අම්මා සිහිසුන්ව බිම ඇද වැටුණා තාත්තේ
ඔබ එන විලස දැකපු හැටි තාත්තේ
මා ඇඩුවා විලාප තියමින් තාත්තේ
ඔබ ළග නොමැති බව නොදැනේවි තාත්තේ


යාළුවෝ විලස අපි එදා ගත කරපු ජීවිතය
නිමාවුනාද තාත්තේ ඔබ නැති ඒ දිවිය
පිළිනොගනී මගෙ සිත ඔබ නැති බවය
යථාර්තයක්වත් තේරුම් ගන්නට මට අද බැරිය

යාළුවො රැසකි ඔබ බැලීමට ආවේ
මුණවත් නොපෙනෙන වැසුණු පෙට්ටියකි ගෙනාවේ
මගේ අවාසනාවද මේ කියා මා සිතුවේ
නිවන් සුව අත්වේවායි මා අන්තිමේදි පැතුවේ

රට ජාතිය රැකුමට ගිය ආදර පියාණනේ
කොහෙද ඔබ දුව තනිකර සැගවුනේ
අන්තිමට ඔබ නැතිවීමයි අප හට උරුමවුනේ
මගේ සිතේ සැමවිට ඔබ ජීවත් වෙන්නේ

මියගිය මේජර් (උපා) ඩීආර් ප්‍රනාන්දුගේ
දියණිය ඩී. චමරී ගයාන්තිකා ප්‍රනාන්දු

## BIRD'S EYE-VIEW




Courtesy "soldier" Magazine of the British Army.

# 19 ශ්‍රීලපාහ 31 වන බංකරය

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 19 වන බළඇණිය වන මෙම බළඇණිය වන්නි මානුෂීය මෙහෙයුමෙහි යෙදී ඉතා සාර්ථක සේවයක් ඉටු කරමින් මෙහෙයුමෙහි අවසාන භාගයෙහි 59 වන සේනාංකයට අයත් 592 බළසේනාව යටතේ මුලතිව් ප්‍රදේශයේ නන්දිකඩාල් කලපු තීරයේ ග්‍රිඩ් අංක 965523 සිට 007501 දක්වා කිලෝ මීටර 4.7 ක භූමි භාගයක ස්ථානගතව රාජකාරි කරන ලදි. මෙම ප්‍රදේශයේ පවතින ක්‍රියාන්විත තත්ත්වය අනුව ත්‍රස්තවාදීන්ගේ දැඩි අවධානයකින් යුත් සතුරාට වැදගත් වූ ත්‍රස්තවාදීන් හා මුහුණට මුහුණලා ස්ථානගතව සිටින ශ්‍රී ලංකා යුධ හමුදාවටද ඉතා වැදගත් ආරක්ෂක වළල්ලක් විය. කිලෝ මීටර 4.7 ක භූමි ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශය ආවරණය කිරීම සඳහා 19 ශ්‍රීලපාහ අණදෙන නිලධාරීගේ අණදීම යටතේ 19 වන ශ්‍රී ලංකා පාබල බළඇණිය, 4 වන ශ්‍රී ලංකා පාබල ඒකකයට අයත් රයිෆල් කණ්ඩායම් දෙකක් සහ 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් රයිෆල් කණ්ඩායම් දෙකක් ඉදිරි ආරක්ෂක වළල්ලේ සේවයෙහි යොදවා තිබුනි.

මුලතිවු ප්‍රදේශයේ ක්‍රියාන්විතයේ නියුතු භට පිරිස් විසින් එල්ලකරන ලද දැඩි ප්‍රහාර හමුවේ ත්‍රස්තවාදීන්ගේ ප්‍රදේශය මොහොතින් මොහොත කුඩා භූමියක් බවට පත් වීමේදී ත්‍රස්තවාදී නායකයන් හට ඉතා ලෙහෙසියෙන් මුලතිවු වනාන්තරය වෙත පැන යාමේ හැකියාවක් ඇති ස්ථානය වනුයේ ඒකකය ස්ථාන ගතව ඇති නන්දිකඩාල් කලපුව හරහා පලා යාමයි. මෙම නන්දිකඩාල් කලපුව හරහා මිනිසකු හට ඇවිදගෙන පහසුවෙන් පැමිණිය හැකි නොගැඹුරු කලපුවක් වන නිසා ඒකකය නිතර සතුරා බලාපොරොත්තුව ප්‍රහාර එල්ල කිරීමට සූදානම්ව සිටින ලදී.

නවතමයෙන් නගා සිටුවන ලද ඒකකයක් වුවත් මෙම වන්නි මානුෂික මෙහෙයුම සඳහා මඩු උතුරු ප්‍රදේශයේ නදන්කන්ඩාල් සිට ඒ 9 මාර්ගය හරහා මාන්කුලම් දක්වාත් එහි සිට ඔිලුමඩු, අම්පකාමම්, ඔඩ්ඩුසුඩාන්, මුලතිව් දක්වා අඛණ්ඩව ක්‍රියාන්විතයන් හිදී සතුරාට ප්‍රහාර එල්ලකර විශාල ජයග්‍රහණ ලබා තිබූ ඉතා උසස් චිත්ත ධෛර්යයක් ඇති නිලධාරී/ සෙබළ පිරිසකගෙන් යුත් ඒකකයක් බැව් ක්‍රියාවෙන් පෙන්නවූ මෙම ඒකකය 2009.05.16 වන දින රාත්‍රියේදී භට පිරිස් හට මුදා නොගත් වෙල්ලමුලක්කායි කලපු තීරයේ සිට අප ප්‍රදේශය දෙසට පැමිණෙන එල්ටීටීඊ සංවිධානයට අයත් බෝට්ටු කීපයක් ඉදිරි ආරක්ෂක වළල්ලේ තිබූ රේඩාර් තීරයේ දිස්වන බව දැනගන්නට ලැබුණි. එම බෝට්ටු අප කලපුව හරහා පැමිණ ප්‍රහාර එල්ල කොට පැනයාම සඳහා ත්‍රස්තවාදීන් රැගෙන පැමිණ ඇති බව නිරීක්ෂණය විය. එම අවස්ථාව වන විට වැඩ බලන බළසේනාධිපති වශයෙන් 574 බළසේනාවේ බළසේනාධිපති වන ලුතිතන් කර්නල් එස්පී විජේසූරිය ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීද ඒකකය වෙත පැමිණ සිටි අතර ඒකක අණදෙන නිලධාරී බුද්ධි නිලධාරී ද සමග රේඩාර් පද්ධතිය සවිකර තිබූ ඉදිරි ආරක්ෂක වළල්ලේ ස්ථානයට ගොස් රේඩාර් තිරයේ දිස්වූ බෝට්ටු නිරීක්ෂණය කොට අනිවාර්යයෙන්ම සතුරු ප්‍රහාරයක් ඉදිරි ආරක්ෂක වළල්ලට එල්ලවන බව දැනුම් දී ප්‍රතිප්‍රහාර සඳහා භට පිරිස් සූදානම් කරන ලදී.

වේලාව මධ්‍යම රාත්‍රී 0100 පමණ වන විට ත්‍රස්තවාදීන්ගේ මරාගෙන මැරෙන ඒකකයට අයත් කලුකොටි 150 කට අධික ප්‍රමාණයක්



ඉදිරි ආරක්ෂක වළල්ලට දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. එහිදී 31 වන බංකරයට ඉදිරියෙන් තිබූ කම්බි වැට කපා ගෙන පැමිණි මරාගෙන මැරෙන එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් 31 වන බංකරයට පහර දෙන ලදී. ඉන් පසු මරාගෙන මැරෙන ප්‍රහාර සමග ඉදිරි ආරක්ෂක වළල්ල තුලට කඩා වැදුනු ත්‍රස්තවාදීන් 31 වන බංකරය අල්ලා ගන්නා ලදී. මේ අවස්ථාවේදී කලපු ප්‍රදේශයේ සිටි අනෙකුත් ත්‍රස්තවාදීන් හට භට පිරිස් විසින් දැඩි ප්‍රහාර එල්ල කල අතර, 31 වන බංකරයේ සිට බංකර් 05 කට දකුණු දෙසින් ඇති රේඩාර් පද්ධතිය සවිකර තිබූ ස්ථානයේ සිටි අණදෙන නිලධාරී සහ බුද්ධි නිලධාරී 574 බළසේනාධිපති තුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ඒකක අණදෙන නිලධාරී තුමාගේ අණදීමෙන් "බී" කණ්ඩායම් මූලස්ථානයේ ස්ථානගතව සිටි අමතර භට පිරිස් යොදා ගනිමින් ත්‍රස්තවාදීන් විසින් අත්පත් කරගන්නා ලද 31 වන බංකරය නැවත මුදා ගැනීම සඳහා ප්‍රහාර එල්ල කිරීමට අණදෙන නිලධාරීගේ අධීක්ෂණය, අණ හා පාලන කණ්ඩා-යමේ නිලධාරී අණදෙනගේ උපදෙස් මත බුද්ධි නිලධාරී විසින් භට පිරිස් මෙහෙය වන ලදී. එම අමතර භට පිරිසේ පෙළ අණදෙන්නා ලෙස කටයුතු කල සෙ/316691 කෝප්‍රල් ප්‍රේමසිරි පීපීබී යන කොනොනි ඉතා දක්ෂ ලෙස



සෙබළුන් මෙහෙයවමින් සතුරා බලාපොරොත්තු නොවූ ලෙස විස්මය ජනක ප්‍රහාරයක් එල්ල කර 31 වන බංකරය නැවතත් අත්පත් කර ගන්නා ලදී.

මෙම අවස්ථාව මුළු මහත් රටේත් ජාතියේත් හමුදාවේත් තීරණාත්මක මොහොතක් වූ අතර, මධ්‍යම රාත්‍රියේ සිට පහන් වන තුරු සතුරා අභිමුඛයෙහි සටන් වදිමින් සිදු කරන ලද මෙම සටන සමස්ත ශ්‍රී ලක් දෙරණෙහි සිදු වූ තීරණාත්මක සටනකි. සෑම විටම අණදෙන නිලධාරී විසින් පවසා සිටින ලද නන්දිකඩාල් කලපුව රත් පැහැ කිරීමේ අභියෝගය ජය ගනිමින් හතු පීපී තිබෙන ආකාරයෙන් හා නන්දිකඩාල් කලපුව රත්පැහැ ගන්වමින් ත්‍රස්තවාදී මලසිරුරු 119 ක් සොයා ගනිමින් එම තීරණාත්මක මෙහෙයුම විජයග්‍රහණය කරන ලදී.

මෙම ප්‍රහාරය සඳහා පැමිණි සියලු ත්‍රස්තවාදීන් ඝාතනයට ලක්වූ බැව් පසුදා ලබාගත් ඔවුන්ගේ මෘත දේහයන් මගින් සහ ඔවුන් සතු නවීන අවි ආයුධ මගින් සනාථ විය. මෙම ප්‍රහාරය එල්ටීටීඊ සංවිධානයේ වන්නි මානුෂය මෙහෙයුම් කාල සීමාව තුල එල්ල කරන ලද අවසාන ක්‍රියාන්විතය විය. ත්‍රස්තවාදීන්ගේ ගුවන් විදුලි යන්ත්‍ර වලට සවන් දීම තුලින් එම ක්‍රියාන්විතය “ඇන්කර් වන්” ලෙස නම් තබා ඇති බැව් දැනග න්නට ලැබුණි. ත්‍රස්තවාදී නායකයන් හට අවසාන මොහොතේ පැනයාම සඳහා තිබූ අවස්ථාවන් අහුරාලමින් අප බළඇණියේ උපරිම ශක්තිය යො -දා ඉදිරි ආරක්ෂක වළල්ල ආරක්ෂා කර ගැනීමට හැකිවීම මෙම ඒකකය සහ සමස්තයක් වශයෙන් යුධ හමුදාවම ලැබූ විශාල ජයග්‍රහණයකි. මෙසේ ත්‍රස්තවාදීන්ගේ අරමුණ අසාර්ථක වීමෙන් ඔවුන්ට අත්වූ ප්‍රතිඵලය වූයේ ත්‍රස්ත නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්, සංවිධානයේ සාමාජිකයන් කිහිප දෙනෙකු සමග කුඩා දූපතකට කොටුවීමයි. ඒකක අණදෙන නිලධාරී තුමා ඇතුළු සියලු නිලධාරී/සෙසු නිලයන් ගේ කැප කිරීම් හා උසස් චිත්ත ධෛර්ය නිසා එල්ටීටීඊ ත්‍රස්ත නායකයන්ගේ අවසාන තුරුම්පුව ද මෙසේ අවසන් විය.

25 වන පිටුවෙන්



අවසාන වශයෙන් මෙම සටනේදී මියගිය රණ විරුවන්

| | | | |
|---|---|---|---|
| සෙ/314117 | ලාකෝ | ආරියරත්න | එම්ඒසීකේ |
| සෙ/371468 | ලාකෝ | විමලසේන | යූපීඑස්අයිපී |
| සෙ/207411 | ආසෙ | මධුසංඛ | කේජේඒ |
| සෙ/51552 | ආසෙ | සුනිල් | ඩබ්පී |
| සෙ/44442 | ආසෙ | කුමාර | පීඑන් |

සහ මෙම සටනේදී තුවාල ලැබූ රණවිරුවන්ද සිහිපත් කරනුයේ ඔවුන්ගේ නම් ශ්‍රී ලංකා ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන බැවිද සිහිපත් කරමිනි.

| | | | |
|---|---|---|---|
| නි/66474 | 2/ලුතිතන් එල්බීජේපීසීපී | | ජයසූරිය |
| නි/365471 | 2/ලුතිතන් එස්පීඩීඒඒ | | විජේරත්න |
| සෙ/366173 | කෝප්‍රල් | පුෂ්ප කුමාර | එස්ආර් |
| සෙ/356786 | කෝප්‍රල් | බණ්ඩාර | එස්ඒසීඑස් |
| සෙ/359249 | කෝප්‍රල් | සමරතුංග | ටීඒආර්එල් |
| සෙ/365729 | කෝප්‍රල් | දුමින්ද සංජීව | කේයූ |
| සෙ/365282 | ලාකෝ | උදයසිංහ | ඒකේඩබ් |
| සෙ/370949 | ලාකෝ | පත්ම කුමාර | ආර්එම්එස් |
| සෙ/370609 | ලාකෝ | විජේරත්න | එස්පීඑන් |
| සෙ/12කිහු01661 | සාසෙ | ප්‍රදීප් කුමාර | ඩීපීසීඅයි |
| සෙ/210738 | ආසෙ | රත්නායක | ආර්එම්එස් |
| සෙ/210939 | ආසෙ | ධර්මසිරි | කේඑම්ඩීඑන් |
| සෙ/43038 | ආසෙ | සෙනරත් බණ්ඩාර | එල්ඩීඑච්ඩබ් |
| සෙ/361931 | රසෙ | සුපෙම්තිලක | පීඩබ් |
| සෙ/369486 | රසෙ | අනුරසිරි | එම්එම් |
| සෙ/371523 | රසෙ | සමන් කුමාර | එච්ඒඩබ් |
| සෙ/208074 | ආසෙ | ප්‍රේමකුමාර | ඩබ්වීපී |
| සෙ/45052 | රසෙ | පුෂ්ප කුමාර | ඩබ්වීපී |
| සෙ/371725 | රසෙ | රාජපක්ෂ | ඩබ්ආර්පීපී |
| සෙ/206904 | ආසෙ | දිසානායක | බීඑම් |
| සෙ/206891 | ආසෙ | වෙලගෙදර | එච්එම්ඩබ්යූපී |

බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ

# සෙබළාණෙනි ඔබ මැරුණා නොවේ කුසුමක් වෙලා ඔබ පිපුණා ලයේ

දසක 30ක කාලයක් රටේ පැවැති කුරිරු යුද්ධය නිමා කරමින් ලෝක ඉතිහාසයේ දැවැන්ත ගරිල්ලා සංවිධානයක් වන එල්ටීටීඊ සංවිධානයේ ප්‍රබලයා ඇතුලු සෙසු නායකයින් හා සාමාජිකයින් සියළුම දෙනා ශ්‍රී ලංකා යුධ, නාවික, ගුවන් හමුදාව විසින් දියත් කරන මෙහෙයුම් වලින් විනාශ කරමින් ශ්‍රී ලංකා දේශයේ ජිවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ජාතින්ගේ සිත්තුල තිබූ බලාපොරොත්තු වූ නිදහස ලබා දෙන ලදී.

අපගේ මාතෘ භූමිය දෙකඩ කිරීමට උත්සාහ දැරූ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඒකායන බලාපොරොත්තුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් දියත් කරන ලද මෙහෙයුම් වලට සහභාගි වෙමින් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ මාතෘ භූමියේ ස්වෛරීත්වය රැක ගැනීම සඳහා ත්‍රස්තවාදීන් සමග නිර්භිතව සටන් කර අප උපන් දේශයේ ඒකීයභාවය වෙනුවෙන් ජිවිතය පුදකරන ලද 7 වන බළ ඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් නිලධාරීන් සහ සෙසු නිලයින් 140 දෙනෙකුගේ ජිවිතය පුද කළ නමුත් ඔවුන් ගමන් කළ එම මාවතේ අප ගමන් කර ත්‍රස්තවාදය මුලිනුපුටා දීමීමට හැකිවී ඇති බැවි ඉතා තිහතමානීව සඳහන් කරන අතර එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ අණසකට යටත්ව තිබූ වන්නි ප්‍රදේශය මුදා ගැනීමේදී 57, 58, හා 59 යන සේනාංක යටතේ 2007 මාර්තු 22 දින සිට මඩු දේවස්ථානය කිලිනොච්චි මුලතිව්, පුදුමාතලන්, පුදුකුඩුඉරිප්පු යන ප්‍රධාන ස්ථානයන් මෙන්ම අවතැන්වූ දෙමළ ජනතාව මුදා ගැනීමේ මානුෂිය මෙහෙයුමේදී කැපිපෙනෙන ලදී.

අද ඔබ අප අතර නොමැති වුවත් සැම දිනකම හිරු නැග එන මොහොතේ දීත් හිරු අවරට යන මොහොතේදීත් සැමදා අභිමානයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.

කෝප්‍රල් සිරිවර්ධන ආර්ඩී
පසුමූලය 7 ශ්‍රීලපාහ

# මේ ගැනත් සිතන්න

**අළුත් වැඩක් ආරම්භ කරන විට මුලින්ම එන බාධකය නොසැලකිල්ලයි. ඊළඟට විරුද්ධ වාදින්ගේ උපහාසයට මුහුණ දෙන්නට සිදුවේ. එයින් එම කටයුත්ත අධෛර්යමත් කළ නොහැකි නම්, දෙවනුව එයට අපහාසාත්මකව කතා කරයි. එයත් අසාර්ථක වූ කල්හි, එය විනාශ කිරීමට බලයි. එයත් කළ නොහැකි නම් එම වැඩය අගය කරයි, එයට ගෞරවය කරයි.**

මහත්මා ගාන්ධි තුමාගේ වැකිය

- ගෙවීගියදේ ගැන දුක්වෙලා පලක් නෑ වෙච්චදේ සිදුවෙලා හමාරයි, කඳුළු පිරුණු අතිතය නැවත නැවත සිහි කරන්න එපා එය ජිවිතයට වේදනා ගොඩක්.

- වරද හැමදාමත් කළ යුත්තක් නොවේ, වරද අත්හල යුත්තක්, කවුරු වැරදි කළත් වරද හරද හදාගත්ත පුද්ගලයා වටිනවා.

- හෙට වැරදුනත් ඊළඟ දවසේ හැදෙන්න, දවසින් දවස හැදි හැදි යන මේ ජිවිත ගමන අප කාටත් සැනසිලි දායකයි.

(පොත පත ඇසුරෙනි)

1 ශ්‍රීලපාහ - ච/සැ චමින්ද කුමාර පිඑච්ගේ බිරිය
ඩබ්ලිව් නෙලුකා සුජිවනි

## ආදරණීය අම්මා

දරා දසමාසයක් නුඹ
මාමේ ලොවට බිහි කලා
මගේ ආදරණීය අම්මා
කුඩාකල සිට මා ලගින් හිඳ
හරි වැරදි මා හට පෙන්වාදී
නිවැරදි මග යැවූ නුඹ
මගේ ජීවිතයේ දෙවියන්
නුඹයි මගේ ආදරණීය අම්මේ
ජිවිතයේ කටුක අත්දැකීම් ලබා
නොයෙක් පීඩාවන්ට මැදිව
මගේ ජීවිතේ සැපවත් කරන්නට
වේදනාව උරුම කරගත්
මගේ අම්මා සදා ණය ගැතියි
ජිවිතේ මා නුඹට

ආසෙ අතුකෝරල පිජ්ආර්එල්
10 ශ්‍රීලපාහ බී කණ්ඩායම



## සඳාදර ගිනි අවිය

ඔබය පෙම්බර
මා දිවිය ඇති තුරා
නොසිතන්න වරදවා
තනි වූ යුධ කතරේ
මා වැනි සෙබලෙකුට
එයයි බිරිඳ...

සදාදර ගිනි අවිය
මා නිදන සයනයේ
පසෙක හිඳ ඇය
ගැඹිබරව උණ්ඩයෙන්
නොනිදා තිස්තුන්පැයම
රකී මගෙ දිවිය....

තිබෙන තුරු මගේ සුසුම් පොද
හිඳින තුරු ඇය මගේ ළඟ
රකිමි ලක් මවුනි ඔබේ
අනාගතය ගැන සිතා.....

උපපනි ටීපී විතානගේ
බුද්ධි අංශය
1 ආබ ශ්‍රීලපාහ

## (නො) ලැබීම....

අපෙ අම්මා වීර මාතා
අපේ සර් රණවික්‍රම
අම්මාට නම්, ඒත් කඳුළු
කිලෝගානට යකඩ
පදක්කම් සර්ට................,

ටවුන්එකේ හෝල්ට්එකේ
ඉන්නේ ලොකු බැනර් එකේ
ඉන්නා මමයි දැන්,...
ජාතියේ මුර දේවතා
එහෙත් හරි වැස්ස
මෙහෙත් හරි වැස්ස
අව්වත් හරි තදයි
කාක් බෙටි හරි ගඳයි....



ගම්හිරව අපෙ අයියා
ඉන්නේ බස් හෝල්ට් එකේ
සැමට සෙවණ බෙදන හදන
කවුරුත් ගුණ ගීම ගයන
ගැණු ළමෝ නිතරම එන
අයියා දැන් මල් නොකඩන...

පී ඉනෝකා බණ්ඩාර
(කෝප්‍රල් ගමගේ පීසී නැගණිය)

## අභිමි සෙනෙහස

යුද්දයේ දරුණුම මොහොතේ
ලැබිනි ඔබගේ ලිපියක්..
මනාලියක වී හෙට දින...
සුබ මොහොතින්.....
වෙන කෙනෙකු සමගින් යනබව....
බලා ගෙන සිටියෙමි මා
කඳුළු වැගිරෙන දෙනෙතින්
ඉදිරියේ එන උණ්ඩයක්
පසාරු කරගෙන මගේ ලය
නිසල කරවයි කියා මගේ පිවය
සඳහටම සමුගන්නට මෙලොවින්....

ලාකෝ අතපත්තු ඒවම්ආර්සී
17 ශ්‍රීලපාහ පාබල හමුදාව

## සෙබල සොයුරනේ

පොත් මිටියට සමුදී
දෙවයේ සරදමට එරෙහිව
ජිවන මග ජය ගන්නට
ගිනියම් යුධ බිමට ගිය
අපේ ලබැඳි සොයුරනේ
මව්බිමේ සාමයේ මල්
පුබුදුවාලන්නට
නෙතට නොපෙනෙන දුරක
සිටියත්
පතන්නම් පිං හඳින්...
ඔබට ජය...

කසුන් සසාක දිල්රුවන්

## උතුරේ වසන්තය.............

කරටි කැඩුන තල්ගස්වල මලක් පිපෙනවිට
බලාගන්න ඔබට පිනක් තියෙයි මලේ හෙට
උතුර දකුණ යා කරගෙන යාල් දේවි හඬ
ඇසෙන දිනක් වැඩි ඈතක නෙවෙයි නගේ තව........

ආඩි ළිඳට පණ ඇවිදින් වතුර පිරෙන විට
ඉරනමඩුවේ නිල් දියවර පොළව තෙමෙන විට
අලිමංකඩ තොටමුනේදි හිරු හිනැහෙන විට
උතුරෙ වසන්තය අරගෙන යමු අපි හනිකට........

අපි හැමෝම එකට හිඳිමු එකම ඉරක් යට
අත්වැල් බැඳගෙන රොක්වෙමු ජාතිභේද නැත
මරණයෙ සෙවනැළි වෙනුවට සාමය සොමිනස
අරන් දුන්න විරුවෙනි ඔබ වෙයි අති උත්තම.........

මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ
9 ශ්‍රීලපාහ




## යුද්ධයේ නිමාව

| | |
|---|---|
| මිනිසුන් මැරූ තිස් අවුරුදු | යුද්දේ |
| අංග විකල ආබාධිත කළ | යුද්දේ |
| දේශපාලනය ජය පැරදුම කළ | යුද්දේ |
| තුන් අවුරුද්දකින් නිම කරවපු | යුද්දේ |
| ප්‍රභාකරන් සුර සැප | වින්දේය |
| ඊලාම් සිහිනය අතරමං | වුණේය |
| ලැබූ විමුක්තියක් නැත දමිළ | ජනයාය |
| රණ විරු ජයෙන් සාමය | ලැබුනේය |
| පිටරට නායකයන්ගේ ගෙරවුම් | මැද්දේ |
| එන්ජිඕ අඩාපාලි උද්ඝෝසන | මැද්දේ |
| දමිළ ජනයාගේ කඳුලැලි | මැද්දේ |
| සාමය ගෙනාවේ අපේ ජනපති ඒ | මැද්දේ |
| ජිවිත දහස් ගණන් රණවිරුවන් කැප | කරලා |
| බල්ලන් බළලුන් ගානට කොටියන් | මරලා |
| රටත් ජාතියත් නිදහස් | කරලා |
| ලක් මැණියේ සතුටින් සැම නිදහස් | කළා |
| ජනපති තුමනි ඔබහට | සුභක් පින් |
| රණවිරුවනේ ඔබහට | සුභක් පින් |
| යුධ නාවික ගුවන් සෙන්පති ඔබටත් | සුභක් පින් |
| මේ පිං බිමට ඔබ සැමදා | වාසනා වන් |

සිවිල් සේවක (භෝජනාගාර සේවක)
අයිකේ අබේරත්න
12 ශ්‍රීලපාහ



විර්ය වන්තයාට කළ නොහැක්කක් නැත

# අපි හැමදා පෙරටම යනවා....

මළත් එකයි නැතත් එකයි දියෙත් එකයි
ගොඩෙත් එකයි අපි හැමදා පෙරටම යනවා
උතුරුකරේ කොහේ ගියත්
අපෙ රණ හඬ තාම ඇහෙනවා...

අදත් එකයි හෙටත් එකයි දියෙත් එකයි
ගොඩෙත් එකයි බැට කාලයි මුලතිව් ආවේ
උතුරුකරේ කොහේ ගියත්
අපෙ රණ හඬ තාම ඇහෙනවා...

දුන්නට ඇම්බුම් දමලා
දෙනවනේ අපි වට කරලා
ආට් වලට ඕන දෙයක් කරන්න හැකිලු
මල්ටි නැතත් රජ වෙනවාලු

ගහන ගහන මල්ටි වලට කොටියො දුවන්නේ
දුවල දුවල හති වැටිලයි කොටියෝ ඉන්නේ
ප්‍රභා උනත් අපිට බයයි ඉන්නේ වල ඇතුලෙයි
හෙට අනිද්දා පොළොවෙ නිදනවා...//

මළත් එකයි නැතත් එකයි....//

බැංකු පොතේ සතේ නැතේ කියල
මලේ මොටද තැවෙන්නේ
හමුදාවට ඔබ ආවොත්
ලොකු මුදලක් පොතටයි යන්නේ
අපිත් එක්ක ඔබ ආවොත්
වරදින්නෑ කවදාවත්
මේ කියන්නේ ඇත්තයි මල්ලී......
එහෙනම් අපිත් එක්ක ඔබ ආවොත්
වරදින්නෑ කවදාවත්
ඒ කියන්නේ ඇත්තයි නංගී

මළත් එකයි නැතත් එකයි............

සැරයන් පුන්‍යපාල ඩබ්ලිව්ජී
16 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම



# මා ආදරණීය තාත්තා

සිත පුරා නැගෙන දුක් ගින්න
ඒ ගින්න නිවීමට හැක්කේ
ඔබට පමනයි මගේ තාත්තේ
ආදරය අප රැකගෙන
නොකියාම අපහැර දමා ගියේ ඇයිද
මගේ තාත්තේ

ඔබගේ ආදරය දැනුනත් අපට
දැනෙනවා තාත්තේ
ඔබ නැතිව දහවල් හිරුද
රැයේ සඳුද නැතිව
යයිනේ මගේ තාත්තේ

ආසෙ ධනපාල ඩීඑම්
බී කණ්ඩායම 10 ශ්‍රීලපාහ

# හැරගිය සුදු නෝනාට

උපදින හැම භවයකදිම
මං ඔයාගෙම ඔයා මගේම
වෙන්න පැතුවට.....
අද ඔයා මාව දාලා
ගොඩක් දුර ඈත ගිහින්....

ඔයා දන්නවද සුදු නෝනා
එදා මං අඩපු තරම
තාමත් මගේ හිත මං රවටනවා
ඇසට කඳුළු ගලනකම්....
අඩන්නේ නෑ මං ආයෙමත්...

ඔයා සතුටින් ඉන්න
මං ඈත ඉඳන් බලා ඉන්නම්
එදා වගේම තාමත්
පපුව පැලෙන්න ආදරෙයි
සත්තමයි...........

ආසෙ විපිත කුමාර එස්එම්එස්
7 ශ්‍රීලපාහ
බී කණ්ඩායම
ඉරණමඩු



# ජාතිවාදය

කටට වැට බැඳිය නොහැකි හින්දා
ජාතිවාදය ඇදලා ගත්තා
සාමයේ සුදු පරවියෝ ටික
උන්ගේ දැතින් එලවා ගත්තා

යුද්දේ මවමින් දිනෙන් දින උන්
උන්ගේ මඩියම පුරවා ගත්තා
බලය ඇති මහ හමුදාව යැයි
ලෝකයටම කියා ගත්තා

එදා පෙරදිග මුතු ඇටය වුනු
බහුතරය සිංහලයො සිටි රට
මෙදා මිනිමරු කොටියා පිරිසට
හිස නමාවිද කිසිම දවසක

නැවත ඉඩ නැත ත්‍රස්තයන් හට
උන්ගෙ දෙපයින් නැගිට එන්නට
මතු දිනේ ත්‍රස්තයන් දැකුමට
යන්න වේදෝ මංදා කටුගෙට

ලුතිතන් එච්එම් රාජපක්ෂ ශ්‍රීලපාහ
7 ශ්‍රීලපාහ
බී කණ්ඩායම
ඉරණමඩු

# සෙබළ සිතුවිලි

යුද්ධය ඇතිවිට සළකයි දෙනා හැම
සාමය ඇතිකරයි පෙන්නා සෙබළ කම
කාලය ගෙවියයි මුලතිව් කැලයටම
ඇත්තේ අවිය පමණයි හැම දේටම

ලාකෝ කුමාරසිරි කේඑච්ජ්, **7** ශ්‍රීලපාහ

# අවසානය

එළාර දුටුගැමුණු සටන
අවසන් වුයේ කෙසේද?
කවුද හිතුවෙ මෙහෙම වෙයි කියා........
නමුත් එක දෙයක් ඉතිරිවී ඇත
ඒ මතකය පමණි......
සෙබළෙකුගේ මතකය ඉතා උසස්
අප හට ඒ අතීතය අමතක නැත
යළි ත්‍රස්තවාදය හිස ඔසවන්න
ඉඩ දෙන්නේ නෑ....... අවසානයක් වූ
මේ ත්‍රාස්තවාදය යළි හිස
ඔසවන්නට අපි ඉඩ නොදෙමු.....
සෙබළ සොයුරනි ඔබලා
සැමදා.. සුපිරි තරු...වේවා
මතුවටත් ඉතිරිවූ මතකය
අමතක නොකරමු......ජිවිතයේ
අවසානය වන තෙක්

උපපති එච්ආර්එන් සංජීව
12 ශ්‍රීලපාහ, "ඩී" කණ්ඩායම
මුලතිව්




# නව අරුණළු උදාවී ඇත දැන් මේ බුද්ධ රාජ්‍යයට

නව අරුණළු පායා හිරු හිනැහි
නව දවසක ආරම්භය මුල පුරද්දී
මිතුරු සෙබළ කැල සිහිවිය

දෙනෙතට කඳුළු ඉනුවේ මටත්
නොදැනීමය..... එය එසේ
නොවන්නේනම් මා සෙබලෙකු නොවේ...

මාගේ ළඟවුන් ඒ මිතුරන් අපහට
අහිමි විය පෙර දින මේ බුද්ධ රාජ්‍යයේ
ඇවිලි තිබූ ත්‍රස්තවාදය නිසාවෙනි.....

ප්‍රභාකරන් උඹ කවදාවත් මනුෂ්‍ය
ආත්මයක උපදින්නේ නෑ....
මන්ද උඹ මේ බුදුන් තුන්වරක් වැඩිය....

මේ බුද්ධ රාජ්‍යයට කළ ශාපයටයි
උඹට කොයි කවුරුත් කළ ශාපයටයි
වෙන කවරකටවත් නොවේ... අනේ

උපපති එච්ආර්එන් සංජීව
12 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම





පාබල හමුදා විශ්‍රාමිකයින්ගේ සංගමය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක්
ඉදිකිරීමට මුල් ගල තැබීමේ චාම් උත්සවයේ දසුන්











රෙම ශ්‍රීලපාහ නිලධාරි නිවස්නයේ
ඉදිවූ නව දෙමහල් ගොඩනැගිල්ල
විවෘත කිරීම සඳහා
පැවති චාම් උළෙලේ
දසුන්

# 2 ආබ ශ්‍රීලපාහ මුලංකෝවිල් වෙසක් අසිරිය





ශ්‍රී ලංකා පාබල හමුදාවේ දෙවන ආධාරක බළඇණිය කිලිනොච්චිය මුලංකාවිල් ප්‍රදේශයේ ස්ථාන ගතව සිටින අතර ලක් ඉතිහාසයේ පළමු වතාවට මුලංකාවිල් ප්‍රදේශයේ බුද්ධ තෙමගුල සිහි කිරීම සඳහා බුද්ධ වර්ෂ 2553 ක් වූ 2009.05.08 හා 09 වන දින රාත්‍රියේ අලුතින් ඉදිකරන ලද බුදු මැදුර අභියස මල් පහන් පත්තු කර බෝධි පූජාවක් පවත්වා රාත්‍රියේ අලංකාර ආලෝක පූජාවක් පවත්වා වෙසක් පහන් කුඩු ප්‍රදර්ශණයක් පැවැත්විණි.

පසුදින එනම් 2009.05.09 දින පළමු වතාවට උදෑසන සීනි සම්බල් සමගින් පාන් දන්සලක් පවත්වන ලද අතර එම අවස්ථාව සඳහා 651 බළසේනාධිපති තුමන් ද සහභාගි විය.

බුද්ධි අංශය 2 ආබ ශ්‍රීලපාහ











# යුධ හමුදා අන්තර් රෙජිමේන්තු මාගී ධාවන තරගාවලිය - 2009

ශ්‍රී ලංකා යුධ හමුදා මලල ක්‍රීඩා කමිටුව විසින් 44 වන වරටත් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු මාගී ධාවන තරගාවලිය 2009 මැයි මස 24 වන ඉරුදින අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. යුධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් මෙවරද තරගාවලිය සඳහා ලංකා මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රධාන තරග ආරම්භක නිලධාරී එම් වෛරවනාදන් මහතාගේ ආරම්භක සංඥාවෙන් ඇරඹි තරගය පාර්ලිමේන්තු වට රවුම, බත්තරමුල්ල හංදිය, කොස්වත්ත හංදිය, තලංගම, අතුරුගිරිය හංදිය, හබරකඩ, පනාගොඩ හංදිය, ගොඩගම හරහා පනාගොඩ යුධ හමුදා ජනපදයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුළුවී යුහ ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානය ඉදිරිපිටින් අවසන් වන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ මාගී ධාවන තරගාවලියක් වූ මෙය ශ්‍රී ලංකා ආධුනික මලල ක්‍රීඩා සංගමයේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවැත්විණි. ජාතික මට්ටමේ ක්‍රීඩකයින් රැසක් මේ සඳහා තරග වැදි නිසාවෙන් ඉතාමත් උණුසුම් තරග විලාසයක් උසුලන ලදී. එකිනෙකා පරයමින් ඉදිරියට පැමිණි තරගකරුවන් සඳහා සහයෝගය දැක්වීමටත් තරගය නැරඹීමටත් මග දෙපස මහජනතාව රැස්ව සිටි අතර, ශ්‍රී ලංකා පොලිසිය විසින් ඔවුන්ගේ නියාමක රථ මගින් තරගකරුවන්ට මාගීයේ ඉඩ ප්‍රස්තාව හා ආරක්ෂාව සපයන ලදී. කෙසේ වෙතත් කණ්ඩායම් තරගයක් වශයෙන් පැවති මෙම ධාවන තරගාවලිය සඳහා එක් රෙජිමේන්තුවකින් ක්‍රීඩකයින් 07 දෙනෙකු පමණ සහභාගි කරවීමට අවස්ථාව සලසා තිබුණු අතර, ඔවුන් අතුරින් තරගය අවසන් කරනු ලබන ප්‍රථම ක්‍රීඩකයින් 05 දෙනාගේ කාලය ගණනය කරමින් ජයග්‍රාහී රෙජිමේන්තුව නම් කරන ලදී. ක්‍රීඩකයින් 83 දෙනා අතරින් ප්‍රථමයෙන් තරගය නිමකරනු ලැබුයේ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ තුසෙ විජේතිලක අයිආර්පී වන අතර, එනමුදු සමස්ත තරගයේ ශූරතාවය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවටත්, අනුශූරතාවය ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බළකායටත් හිමි වූ අතර, තෙවන ස්ථානය දිනාගන්නා ලද්දේ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කාණ්ඩායමයි.

ශ්‍රී ලංකා පාබල හමුදා මාගී ධාවන කණ්ඩායම

| | | |
|---|---|---|
| කෝප්‍රල් | අජන්තන් | එම් |
| ලාකෝ | පිටිසන් | ඕජේඑස් |
| සාසෙ | පද්මකුමාර | ඒඒඑම් |
| සාසෙ | දිනුරංග | පීපීජී |
| සාසෙ | බංඩාර | ටීපීජී |
| සාසෙ | හිටගෙදර | ඒඊ |
| සාසෙ | කරුණාතිලක | එස්එච්පීඑන් |



# දෙවන බළඇණිය (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ 128 වන උපන් දිනය 2009.04.01 දින සැමරූ වගයි

1861 දී ස්වෙච්ඡා හමුදාවක් ආරම්භ කිරීම සඳහා 1861 අංක 01 දරන රාජ්‍ය ව්‍යවස්ථාව මඟින් බ්‍රිතාන්‍ය මහ රැජිනගේ අනුමැතිය ලැබිණි. උක්ත නියෝගය ප්‍රකාරව 1862.07.02 දින ස්වෙච්ඡා හමුදාවක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථාවක් 1862.07.05 දින අංක 38/26 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. එකී ව්‍යවස්ථාව ප්‍රකාශයට පත්වීමට එනම් 1862 ජුලි මාසයේදී මාතලේ ස්වෙච්ඡා රයිෆල් සංගමයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය අපේක්ෂා කළ තරම් නොවුන බව ප්‍රකාශ කරමින් එම ස්වෙච්ඡා රයිෆල් සංගමය ක්‍රියාත්මක කිරීම අත් හරින ලදී.

1880 දී කොළඹදී පිහිටුවන ලද රයිෆල් සමාජය 1881 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ ස්වෙච්ඡා හමුදාවක් පිහිටුවීම යෝග්‍ය යැයි තීරණය කොට එවැන්නක් ස්ථාපනය කිරීම සඳහා රජයේ අනුමැතිය ඉල්ලා සිටි අතර ඒ සඳහා කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පුද්ගලයන්ගේ අත්සන් ලබා ගන්නා ලදී. මෙම කටයුතු වලදී කොළඹ පොලිස් මැජිස්ට්‍රේට් ඩබ්ලිව්.ජේ.එස් බෝක් මුලිකත්වයෙන් ක්‍රියාකරන ලදී.

1881.04.01 දින මෙම ඒකකය සිලෝන් වොලන්ටියර්ස් නමින් ස්වෙච්ඡා හමුදාවක් ආරම්භ කිරීමට රජයේ ගැසට් පත්‍ර 43/96 හි 528 වන පිටුවෙන් ප්‍රකාශයට පත් කරන ලදී. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් ලැබූ මෙම ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් බ්‍රිතාන්‍යයේ 21 වන ස්වෙච්ඡා ලැන්ක්ෂියර් රයිෆල් බළකායට අයත් ලුතිනන් කර්නල් ජෝන් ස්කොට්


අණදෙන නිලධාරී විසින් සුබ මොහොතින් සෙසුනිළ උසස් කිරීමේ ලිපිය අත්සන් තැබූ අයුරු


ආම්ටේජ් රාජකාරී කරන ලදී. මෙම ඒකකයේ ප්‍රථම විධායක අධිකාරී ලෙස රාජකීය ග්ලැමෝගන් ස්වෙච්ඡා පාබල හමුදාවේ කපිතාන් පීඑල් ග්වොට්කින් රාජකාරී කරන ලදී. ඉතිහාසයේ බැබළි බැබළි යන මෙම ඒකකයේ රණවිරුවන් භාවිතා කරන ලද ප්‍රථම අවියද ස්නයිඩර් රයිෆලය බවද අභිමානයෙන් සඳහන් කරමි.

1881.11.30 දින ඒකකයේ ගෞරවනීය කර්නල් පදවියට එවකට බ්‍රිතාන්‍ය ඔටුන්න හිමි වේල්ස් හි කුමරු පසුව 07 වන එඩ්වඩ් රජු විසින් භාර ගන්නා ලදී. ඒ සමගම කුමරුගේ ශිරස්ථ ලාඤ්ඡනය වන පැස්බර පිහාටු 03ක් හා කුඩා ඔටුන්නද ඔහුගේ ආදර්ශ පාඨය වූ "සේවය කරමි" යන ඒකක ලාඤ්ඡනය හා ආදර්ශ පාඨය වශයෙන් සාඩම්බරයෙන් භාවිතයට යොදා ගන්නා ලදී. අදත් "සේවය කරමි" යන උදෘත පාඨය යටතේ නිදන් ගත ඉතිහාසයකට හිමිකම් කියන මෙම ඒකකය යුධ හමුදාවේ ව්‍යාප්තියට සාපේක්ෂව ලංකා ආරක්ෂක කාලතුවක්කු බළකායද, ලංකා ඉංජිනේරු බළකාය, ලංකා වෛද්‍ය බළකාය මෙන්ම, සිංහ හා ගැමුණු ඒකකද මෙම ඒකකයෙන් බිහි වී ඇති බව සාඩම්බරයෙන් කියමු.

යුද්ධ හමුදාවේ සෑම ඒකකයකටම නෑකම් කිය හැකි මෙම ඒකකයේ අභීත වීර රණවිරුවන් කරන ලද සේවය අගයා 1922 වර්ෂයේ ඒකකයට ප්‍රථම වරට මහා බ්‍රිතාන්‍ය රජතුමාගේ


කැළණි විහාරයේ ආගමික වතාවත්වල යෙදෙමින්

සම්මාන ධජයන් සහ රෙජිමේන්තු සම්මාන ධජයන් එසවීමට වරම් ලැබීමෙන් පසු 1922.03.22 දින මෙම ධජයන් ඒකකයට උත්සවාකාරයෙන් ප්‍රදානය කිරීම සඳහා ගෞරවනීය කර්නල් වන වේල්ස් හි කුමරු (පසුව 8වන එඩ්විඩ් රජු) කොටුව එච්ලෝන් චතුරශ්‍රයේදී සිදු කරන ලදී. තවද 1954 අප්‍රේල් මස බ්‍රිතාන්‍ය මහ රැජින වූ 11 වන එලිසබෙත් රැජින හා එඩිම්බරෝ ආදිපාද තුමා ලංකාවට සම්ප්‍රාප්ත විය. 1922 දී ඒකකය වෙත පිරිනමන ලදී. රාජකීය සම්මාන ධජ යොදා ගනිමින් අවසන් වරට සම්මාන මුරයක් පිරිනමන ලද්දේ එම වසරේදී මහනුවරට පැමිණි 11 වන එලිසබෙත් මහ රැජින වෙතය. 1954.04.21 දින 11 වන එළිසබෙත් මහ රැජින විසින් කොළඹ ගාලු මුවදොර පිටියේදී


උසස් වීම් ලද සෙසුනිලයෝ රෙජිමේන්තු සැරයන් මේජර් සමග


You can get only one shot at a shell bird.



තම රාජකීය සම්මාන ධජයන් හා රෙජිමේන්තු සම්මාන ධජයන් ප්‍රදානය කරන ලදී. 1922 දී මෙම ස්වෙච්ජා ඒකකය වෙත පිරිනමා තිබූ රාජකීය සම්මාන ධජයන් භාවිතයෙන් තොරව කොළඹ කොටුවේ ශාන්ත පීතර දේවස්ථානයේ ගෞරව සහිතව තැන්පත් කරන ලදී.

අභිමානවත් ඉතිහාසය තව දුරටත් සනිටුහන් කරමින් 1978.10.10 වන දින එවකට ශ්‍රීලංකා අතිගරු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන උතුමාණන් විසින් පනාගොඩ සරඹ භූමි පිටියේදී ඒකක ජනාධිපති සම්මාන ධජයන් හා රෙජිමේන්තු සම්මාන ධජයන් ප්‍රදානය කරන ලදී. මෙකී කරුණු පැහැදිළි කරමින් 128 වන සංවත්සරය නිමිත්තෙන් 2009.04.01 දින මුර පිරික්සුමකින් පිළිගත් 37 වන අණදෙන නිළධාරි නි/2870 ලූතිතන් කර්නල් ඩබ්පීආර් විජේරත්න ශ්‍රීලපාභ විසින් ඉතා සාඩම්බරයෙන් නිලධාරි/සෙසුනිලයින් අමතා කළ ප්‍රකාශයේ නිදන් ගත කරුණු තුල සෙබළුන්ගේ චිත්ත ධෛර්ය ඉතා උසස් මට්ටමක තැබූ අභිමානවත් ඉතිහාසය ඉහතින් ලියවුනේ බිඳක් පමණි.

වත්මන් අණදෙන නිලධාරිතුමන් මෙම ඒකකයේ ඉතිහාසය මෙන්ම ද්‍රවිඩ ඊළාම් එල්ටීටීඊ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ආරම්භ වූ 1983 වර්ෂයේ සිට මේ දක්වා ඒකීය රටක් වෙනුවෙන් ත්‍රස්තවාදය වනසා දමා අප මතු පරපුරට නිවහල් රටක් උරුම කර දීමේ චේතනාවෙන් සටන් වැද සදහටම මේ මිහිතලය සිප ගත් ඒකකයේ සාමාජිකයින් 07×192 මෙන්ම සමස්ත යුද්ධ හමුදාවේ මියගිය රණවිරුවන්වද, ඒකකයේ තුවාල ලැබූ රණවිරුවන් 221 ප්‍රමුඛව සමස්ත යුධ හමුදාවේ තුවාල ලැබූ රණවිරුවන්ටද නව ඒකක ස්ථාපනයත් සමගම ඒකකයේ වැඩි පිරිසක් වශයෙන් සිටින ආධුනිකයින්ද හමුවේ සදහටම සමුගත් සහ තුවාල ලැබූ රණවිරුවන්ද සිහිපත්කළේ ඉතා හැගිම්බරවයි. ඒකක සාමාජිකයින්ගේ සිත් සතන් එඩිතරභාවය අධිෂ්ඨානය, මෙන්ම කැපවීම ගලේ කෙටූ අකුරු මෙන් සටහන් තැබූ අණදෙන නිලධාරි තුමා 1997 වර්ෂයේදී අප බළඇණි මූලස්ථානය කොළඹ යුධ හමුදා මූලස්ථානයෙන් සමුගෙන කැලණිමුල්ල හමුදා කඳවුරේ ස්ථාපනය කර එදා තිබූ එකී කඳවුරත් මේ වන විට එම කඳවුරේ පැවැත්ම පරිපාලනය, නව ඉදිකිරීම් හා එහි අලංකාරත්වය උසස් මට්ටමකට ගෙන ඒමට පස් පිඬැල්ලකින් හෝ තම දහඩිය සලමින් ශක්තිය මෙන්ම ස්වකීය කැමැත්ත මත සියලු ආධාර උපකාර කරමින් නැවත අපටම කියා මූලස්ථානයක් සාඩම්බරයෙන් ගොඩ නැගීමට උරදුන් සියලුම දෙනා ඇතුළු එහි සියලු නායකත්වයෙන් කටයුතු කළ හිටපු අණදෙන නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ද සිහිපත් කිරීම වත්මන් අණදෙන නිලධාරි අමතක කළේ නැත. එයද අප කා හටත් එතුමාගේ අවංකභාවය සහ හැගීම්බර භාවය ආදර්ශයක් විය.

වර්ෂ 128ක සාඩම්බර ඉතිහාසයකින් පුංචිම පුංචි තිතක තරම් නිදන් ගත කරුණු කිහිපයක් පමණක් මෙහි සනිටුහන් කළද, ඒකකයේ මියගිය සෙබළු සහ තුවාල ලැබූ සෙබළුද පමණක් නොව 2(සෙච්) ශ්‍රීලංකා පාබල හමුදා ධජය යටතේ සේවය කර නව ඒකක නගා සිටුවීම යටතේ 16.17.18 සහ 21 ශ්‍රීලපාභ ඒකක වෙතද අපගෙන් සමුගෙන ගිය නිලධාරි/සෙසුනිලයින්ද අණදෙන නිලධාරි තුමන් සිහිපත් කළේ බලඇණි සංවත්සර දිනයේ ඔවුන්ද අප සමඟ සිටියා නම් හිතේ සතුට කොතෙක්ද යන්න අනෙකුත් අයගේද හැඟිම්බර සිතුවිලි වලට සමගාමීව අදහස් ප්‍රකාශ කළා.

තවද අප ඒකකය ආරම්භයේ සිට මේ දක්වාම මේ මාතෘභූමියේ ස්වාධීපත්‍ය ආරක්‍ෂා කිරීම සඳහා අගමැතිවරුන් යුධ හමුදාපතිවරුන් සහ තවත් බොහෝ ප්‍රභූවරුන් බිහිකළ මෙම ඒකකයේ සාමාජිකත්වය ලැබූ සියලු සාමාජිකයින්ගේ සංසාරගත වාසනාවක් බවට කරුණු තහවුරු කර දෙමින් ඒකකය ආරම්භයේ සිට රාජකාරි කළ සියලුම අයවළුන් සහ අදටත් ඒකකයේ නිර්භිතනාමය රැකෙන පරිදි රාජකාරි කරන වත්මන් නිලධාරි/සෙසුනිලයින්ද අමතා යළි යළිත් ඔවුන්ගේ නිර්මල වූ සේවය අගයමින් එම කාර්යයෙන් සමුගත්තේ මුවපිරි සිනාවෙනි. පසුව අණදෙන නිලධාරි තුමාගේ කාර්යාලයට පියමන් කළේ නියමිත වේලාවට සුදානම් කර තිබූ සෙසුනිල උසස් කිරීම් ලිපිය අත්සන් කිරීමටයි.

රාජකාරී අවශ්‍යතාවය බහුල වුවද ඒකකයේ නිලධාරි ඌනතාවය බලපාන මෙවන් අවස්ථාවක මේ සඳහා අණදෙන නිලධාරි ප්‍රමුඛ විධායක අධිකාරි කපිතාන් යූආර්එල් පෙරේරා ශ්‍රීලපාභ අණ සහ පාලන කණ්ඩායමේ නිලධාරි අණදෙන වන කපිතාන් පීඩබ්එන්එස්කේ වීරසිංහ ශ්‍රීලපාභ "බී" කණ්ඩායමේ නිලධාරි අණදෙන කපිතාන් ඒඑස් කුමාර ශ්‍රීලපාභ ඒකක බුද්ධි නිලධාරි 2ලූතිතන් ඒපීඑන් ධනසිරි ශ්‍රීලපාභ උපානි ලූතිතන් කේඑන් සිල්වා ශ්‍රීලපාභ ප්‍රමුඛව ඒකක රෙසැමේ බනි 1 පිඩබ් පංචම ඇතුලත්ව ඒකකයේ බළලත් නිලධාරි, ජ්‍යෙෂකොනොනි, කොනොනි ඇතුළු සෙසු සාමාජික බොහෝ පිරිසක් සහභාගි වූහ.

ඒකකයේ දීර්ඝ කාලයකින් සිදු නොවූ පරිදි සියලු නිල එනම් බනි11, ව/සැරයන්, සැරයන්, කෝප්‍රල් සහ ලා/කෝ නිල උසස්වීම් සැළකිය යුතු ප්‍රමාණයක් හිමි ගැන්වුනා. ඒකකයේ පෞරාණිකත්වය හා සැළකිය යුතු කාල සීමාවක් තුලදී බළඇණි දිනයක සෙසුනිලයින්ට හිමි බනි 1 හැර සියලු නිල උසස් වීම් ලැබූ ඉතිහාසගත අවස්ථාවකට කරුණු ඒකරාශි කරමින් නිල පැළඳි සියලුම අයවළුන් අමතා අණදෙන නිලධාරි කථා කළේ සුවිශේෂි වූ සතුටක් හිතේ ඇතිවයි

128 වන සංවත්සරය සනිටුහන් කරමින් අණදෙන නිලධාරිතුමන් සම්ප්‍රදානුකූලව පැවතගෙන එන ක්‍රියා පටිපාටිය පෙරදැරිව සියලු නිල නියෝජනය වන පරිදි තේ පැන් සංග්‍රහය සහ දිවා භොජන සංග්‍රහය පැවැත්වුවා.

හිතේ සතුට පුරවාගත් අණදෙන නිලධාරි එකී සතුට බෙදා හදාගත්තේ එකම ක්‍රම වේදයක් තුලින් නොවේ. එනම් 2009.04.01 සවස කැළණි රජමහා විහාරයේ මියගිය රණවිරුවන්ද සිහිපත්කර ඔවුන්ගේ ඥාතීන් ඇතුළු ක්‍රියාකාරි සාමාජිකයින් ප්‍රමුඛව වත්මන් යුද්ධ හමුදාපති තුමා ඇතුළු සටන් පෙරමුණේ සටන් වදින ත්‍රිවිධ හමුදාවේ සියලු සාමාජිකයින්ට සෙත් පතා බෝධි පූජාවක් පැවැත්වීම සහ 2009.04.02 දින උදෑසන හිල් දානය, දහවල් සාංඝික දානයක්ද පිරිනමමින් සංඝයා වහන්සේලාට පිරිකර පූජා කරමින් අප කාගේත් ජීවිත අනියත බවත්, මිනිසෙක් වෙලා මිහිතලයේ උපන් අප දැහැමින් හොඳින් ජීවිතය ගත කිරීම සියලු සාමාජිකයින්හට පසක් කිරීමට අණදෙන නිලධාරි තුමන් අමතක කළේද නැත.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ මව් බළඇණිය වීමේ භාග්‍ය ලත් දෙවන (ස්වෙච්ජා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඓතිහාසික තොරතුරු ඇතුලත්ව 128 වන උපන් දිනය පියමං කළ මෙම ඒකකයේ පැරණිම සම්ප්‍රදායන් අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් බළඇණියේ කීර්තිනාමය, ගෞරවය, කැපවීම ධෛර්යය, අධිෂ්ඨානය මෙන්ම විනය රාජ්‍ය පක්‍ෂපාතිභාවය උසස් මට්ටමක පවත්වා ගනිමින් "සේවය කරමි" යන රෙජිමේන්තු ආදර්ශ පාඨයේ පරිසමාප්ත අර්ථයෙන්ම බළඇණියේ සේවකයා වුද සේවය කරන්නා වුද සියලු නිලයින්ට ඓතිහාසික අවස්ථාව ජීවිතයේ තවත් මල්පල ගැන්වූ අවස්ථාවක් වේවායි ප්‍රාර්ථනා කරමු.

විජයානන්ද එච්එම්ජේආර්
ප්‍රධාන ලිපිකරු
දෙවන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව

# රට රැක දුන් අපේ මුරදේවතාවුන්ට

තිස්වසරක් මව්බිම වෙලාගත සිටි ඒ කුරිරු
ත්‍රස්තවාදය නිමා කරලන්න ඔබ සියලු දෙන කර
කැපකිරීම් අනන්ත අප්‍රමානය ඒ කලාවු
කැපකිරීම්වලට අප සදා නයගැතියි එය කෙසේ ගෙවා
දමන්නද යැයි අපට නොහැගෙයි ඔබෙත් අපෙත්
මවුවූ මේ ලක්දෙරණේ රැක දුන් ඔබ සියලු දෙනා
සදා අමරණීය වනු නියතයි
අප ඔබට දහස්ගණන් සොහොයුරන්
අහිමි වීම දුකක් වුනත් ඔවුන් කර සේවය
අප හදවත් තුළ සදා අමරණීයයි
දෙමාපියනට දරුවන් අහිමි කර දරුවනට
දෙමාපියන් අහිමි කර බිරින්දෑවරුනට ස්වාමියන්
අහිමි කර ඒ ත්‍රස්තවාදය නැමති ඝන අඳුර
අප ලක්දෙරණින් නිමා කොට
මේ මව්බිමට ලබාදුන් ඔබ සියලු දෙනා
ගෙවන හැම නිමේෂකම අප හදවත්තුල
පායන හිරුමෙන් පවතී තවද ඔබ අපට
මගේ මව්බිමට නව ජීවයක් ලබා දුන් අහිමි වු
විරුවන් අප හදවත් තුළ හැමදාමත්
පිපෙන කුසුම්මෙන් පිපිදෙයි සත්තයි
ඔබ සියලුදෙනා තිස්තුන් කෝටියක්
දේවතාවුන් වහන්සේලා රැකදේවා....

# දිනු ජය......

ත්‍රස්තවාදයෙන් මුළුලොව වැජඹ වුණු
ත්‍රස්තභීතියෙන් සැම දන සසල කෙරූ
ලොව සිටි මිලේච්ඡම ත්‍රස්තය යැයි කියපු
මරණෙට බය එකෙන් ඒ වගෙ වෙන නැතිලු

මින් මතු මෙරට නෑ සුළු ජාතික වාදේ
ඉන්නේ දේජාතියකුයි සිරි ලංකාවේ
ගෙනහැර පැවොතින් ඒ ගැන මේ මොහොතේ
සිත තුල නැගෙන්නේ ජාතික අභිමානේ

මිනිසුන් එකයි ඔවුනට වෙනසක් නැත්තේ
සිතුවිලි තමයි ඔවුනගෙ වෙනසට ඇත්තේ
මේ ටික වෙනස් නොකළොත් දිනු ජය මැද්දේ
ලැබු ජය වුවත් ආපස්සට යනු ඇත්තේ


කපිතාන් යුඩීඑස්ආර් උස්ගෙට්ටි ජආසේ
ජනාධිපති ආරක්ෂක සේනාව
අරලියගහ මන්දිරය
කොළඹ 3




# බොදු දරුවනි

සුමන රාහුල සෝපාක
සුව සංකච්ච බොදු සසුන් අඹරේ
දිළෙන තරු මෙන් සරා සඳවට
බුදුන් හා දෙවි අරම් වෙහෙරේ
කරන ලද ඒ මහා දස්කම් වලින්
පත පොත පිරී ඉතිරේ
සරණ සිල් මගේ බැති ගී කුසුම්
පාද පුදසුනේ ඇතිරේ
නිදා ඉන්නට කල් නොවේ මෙය
තුන් හෙලේ බොදු දරුවනේ
කිදා බැස ඇත පතුලටම අද
ලොවේ මිසදුට දූෂණේ
උදාසීනව නොසිට කරවා
යළිත් සාසන සෝදනේ
සදාතනිකව රකිනු දරුවනි
ඔබට බාරයි සාසනේ
නොසිට පසු බැස සුරත පන්සිල්
ලබාගෙන තෙසරණ ගුණේ
රටට සාමය දෑයට සලසනු
සදාකල් සහපිවනේ
ඔබට උරුමයි පන්දහස් කල්
පවත්නා මේ සාසනේ
පෙරට එනු මැන සිංහලේ බොදු දරුවනේ

කෝප්‍රල් රත්නායක ටීඑම්
1 වන ආධාරක බළඇණිය



# මුලතිව් සදුට

උතුරු කරේ ඔබ මුර කපොලු රකිනවා
මා තනියට දරුතිදෙනා නිවසේ රඳනවා
දින සති මාස එකිනෙක ගෙවිලා යනවා
තාත්තා එන්නෙ කවදාදෑයි
දරුවන් විමසනවා
මා දරුවන් සමග දෙවියන් අයදින්නේ
තිස්තුන් කෝටියක් දෙවි රැකවරණය
ඔබහට ලැබ දෙන්නේ
උපන් රට දෑය රැකුමට
ඔබ සෙබළෙක් වූයේ
අපගේ පුතුන් හට
ආදර්ශවත් පියෙක් වූයේ
මාහට දෙවියකු වැනි සැමියකු වූයේ
දෙවියන් හට භාරකළෙමි
මා හිමි සඳුනේ
සාමයේ සුදු පරවියන්
සැමතැන ඉගිලේවා
යුද්ධ නිමා වී සාමය රටටම ලැබේවා
අප හද තුල නැගෙන දුක් ගිනි නිවේවා
මා සැමියනි ඔබට
දෙවි රැකවරණය ලැබේවා.

බී ජී කමලා රත්නායක
කෝම්බුව, කුඹුක්ගැටේ

# අහිමි වූ පියසෙනෙහස

සුසිල් දිය දහරක් සේ
සිසිල් සුවදින් එන මද පවනක් සේ
හදවතට නිරතුරු දැනෙයි....
පියාණෙනි දයාබර නුඹේ සෙනෙහස
2007 ක් වු ජනවාරි මාසයේ
අවසන්ම දිනයේදී
සදහටම දෙනෙත් පියා නුඹ
ගියා මගෙන් දුර ඈත....
මිහිදන් කළා නුඹ
පෙබරවාරි 04 වන නිදහස් දිනයේදී
තුන් මසක් එළඹුනා
වෙසක් මහ පෝ දිනට
සාංඝික දාන දී ගිහි පිරිත් කියවලා
පැතුව නුඹ එතරකරවන්නට පියාණෙනි
සංසාර මාවතෙන්......

සංකල්පනා
උපපති ඒකේඑස්කේ ගුණසේකර

# වෙසක් අසිරිය

සදහම් සුවඳ පිබිදෙන පුන් පොහොය දිනේ
ගස් වැල් නලවමින් සඳ කැන් ගලනු පෙනේ
තෙල් මල් ඇත රැගෙන මිනිසුන් ඇලෙනු පෙනේ
ගිනි අවියක් සුරතේ මා යුධ පිටියක කොනේ

පන්සල් තුලින් ඝන්ඨා හඬ ඇසෙන විට
හිමි සදු වඳින්නට බැරි වුනි වෙසගයට
එන්නට බැරි වුනේ හිමියන් පිදීමට
නිදහස නැති නිසයි මා දිනු මගෙ බිමට

නසනට එපා කිසිදින කිසිවෙකුගෙ පණ
සිහියට නැගෙනු ඇත හිමි ඔබ දෙසුව බණ
රට දැය නසන විට සතුරා පෙරට පැන
පිහිටක් නොමැත යුධයෙන් මිස අපට වෙන

රට දැයට නැගුමින් හද දයා වෙනි
පර පණ නැසුවෙ රට රකිනා නිසාවෙනි
අත අපි සිරවුනේ සතුරන් නිසාවෙනි
මා ගැන කමා වුව මැන බුදු පියාණෙනි

කෝප්‍රල් රත්නායක ජේඑම්
1 වන ආධාරක බලඇණිය ශ්‍රීලපාහ
යුධ හමුදා කඳවුර

## නීතිය

මිනිසුන් කපාකොටා තැනින් තැන මරණ කල
මත්කුඩු මත්වතුර තැනින් තැන බිහිවන කල
නීතියට බය නැති මිනිසුන් සිටින කල
නීතිය නිතිය ඉදිරියේ අසරණ වන කල
මේකද රටේ නීතියට යන කල

සාසෙ දයාරත්න ඩීඑටී
රෙමශ්‍රීලපාහ ක්‍රීඩා අංශය
පනාගොඩ




උතුරේ ගිනි බිඳුම් නිම විය, රට සුවසේ
සිරුරේ හැම රිදුම් දුරු විය විඳි දුකසේ
සසරේ රියෙහි සක පෙරලෙන'මුදු මෙලෙසේ
මිතුරේ පෙළෙහි එනු පෙරමුණටම පෙරසේ

දසුන :- යුද හමුදා ජනමාධ්‍ය අධ්‍යක්‍ෂක මණ්ඩලය අනුග්‍රහයෙන්
හසුන :- මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ

# අධික අවුරුද්ද

අධික අවුරුද්දක් වශයෙන් ගණන් ගන්නේ දින තුන්සිය හැට හයක් යෙදී තිබීම නිසාය. සාමාන්‍ය අවුරුද්ද දින තුන්සිය හැට පහකි. ඒත් මෙම දින තුන්සිය හැට හය ලබන්නේ අවුරුදු හතරකට වරක්ය. අනෙක් අවුරුදු වල පෙබරවාරි මාසය දින විසි අටකින් අවසන් වේ. මෙම අධික අවුරුද්දේ පෙබරවාරි මාසයේ දින 29 ක් යෙදේ. අපුරු සිදුවීම නම් මෙම පෙබරවාරි මාසයේ 29 වන දින උපන් කෙනෙකුට තම උපන් දිනය සැමරීමට සිදුවන්නේ අවුරුදු හතරකට වරක් නිසාය. මෙම අධික අවුරුද්දක් ලැබීමට හේතුව පෘථිවිය සූර්යයා වටා කැරකැවීමට දින තුන්සිය හැට පහක් ගතවේ. එය අවුරුද්දක්ය. ඒත් දින තුන්සිය හැට පහක් අවසන්ව තව පැය පහයි විනාඩි හතලිස් අටයි තප්පර 47.5 ක කාලයක් සම්පූර්ණව සූර්යයා වටා යන්නට ගත වන කාලය සාමාන්‍යයෙන් වසරකට දින තුන්සිය හැට පහක් ලෙස ගණන් ගත්තද ඉතිරිවන පැය පහයි විනාඩි 48 තත්පර 47.5 ක කාලය වසර හතරකදී එකතුවූ විට පැය 23යි විනාඩි 15යි තත්පර 10යි. එහෙත් පැය 246ක් වශයෙන් ගණන් ගනී. එම දවසද දින දර්ශනයට එකතු කරන්නේ වසරේ කෙටිම මාසය ලෙස ගණින් ගන්නා පෙබරවාරි මාසයටයි. ඒත් මෙය මෙතනින් අවසන් නොවී වසර හතරකට වරක් දිනයක් ලෙස ගණන් ගත්තද එම කාලය විනාඩි 44 තත්පර 50 ක් අඩුවයි ගණන් ගන්නේ. මෙම අඩුව වසර 400දී දින තුනක් දින දර්ශනයට එකතු කිරීමෙන් ප්‍රශ්නය විසඳේ. අවුරුදු 400 කටම අධික අවුරුදු ඇත්තේ 97 පමණය.

සාසෙ දයාරත්න ඩීඒටී
රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය
පනාගොඩ

# THE WORLD SNIPING RIFLES

Contd. from 60" Issue

As with all armies, once private enterprise was shown to be profitable, it became institutionalised and official snipers were selected, sniping schools were begun, better rifles with better sights were provided and sniping became a commonplace fact of life on every front. Men vied for job, for it gave them a far more independent life than simply standing in a trench waiting for the next attack or performing fatigues. The sniper, to a large degree, selected his own positions, went and came as he chose, and provided he was effective tended to be left alone to get on with it. But not every volunteer proved to be a success at this trade, it takes a special type of soldier to lie still and silent for hours, then fire a single shot, and continue to lie still and silent so as not to reveal his position by moving away. He also needed a certain amount of imagination so as not to immediately occupy the obvious bell tower or lone tree which would be the focus of machine gun fire as soon as any sniper opened fire. He needed a great deal of field craft and country lore to be able to move without it attracting attention and conceal himself effectively, to understand the play of light and shade across the country, to estimate range and deflection.



The German Army's standard sniping rifle in World War II was this Mauser Kar. 98k.

After the war sniping became an almost forgotten skill, it was perhaps perpetuated in infantry schools, but the general line infantry was short of men and whilst it may have had room for a company sniper on the formal war Establishments he was rarely seen on the peace Establishments. As a consequence, when World War Two broke out in 1939 there was a shortage of snipers in every army. As things turned out there was not much scope for snipe in the first years of the war, the confrontation of the Allied and German armies across the French frontier was conducted on a 'live and let live' basis, and when the Blitzkrieg struck in May 1940 events moved far too quickly for snipers to be tactically effective. Similarly the North African desert gave very little scope for sniping, and it was not until 1944, with the invasion of Europe, that the British found any scope for snipers. The Germans and Russians had found plenty of scope on the Eastern Front, however, and both sides had snipers working hard by 1942. The Americans encountered Japanese snipers in their island - hopping campaign in the south pacific and soon developed their own sniping capability in order to counter the threat.



Although the Soviet Army used some semi-automatic rifles for sniping, most of their snipers relied on this bolt-action Mosin-Nagant Model 1891/30.

Generally speaking, the sniping rifles of World War II were the service rifles, carefully selected for accuracy and provided with telescope sights. The British stuck to their Lee-Enfield, plus a number of pattern 14 rifles specially adapted for sniping during World War 1 and brought back into service. The Germans used their stock "Mauser Kar". 98k, the Russians their stock "Mosin¬Nagant' 1891/30, both with the addition of telescopes, but the Russians also pioneered the use of a self-loading sniping rifle which did away with the often fatal movement of the sniper's hand and arm as he reloaded. The American army adopted the Garand semi-automatic in some cases, but the general preference was for the Springfield MI 903, a special sniping version being developed.

World War Two saw a great deal of technical and scientific innovation, and among this was the adoption of infra -red technology to permit locating targets in darkness. This was first thought of as a method of detecting aircraft, but the discovery of radar soon put infra-red out of business on that front. The Germans then developed it as a coast-watching device, with considerable success, and from there, as the technology improved and the equipment became more compact and reliable, as a night-driving aid. Then came an infrared spotlight and an infrared telescope which could both be attached to a rifle and, powered by a set of batteries carried in the man's pack, allowed shooting with accuracy out to about 200 yards in pitch darkness. Similar development work had been done in Britain and the USA which resulted in British night-driving equipment and an American infra-red spotlight and telescope for night sniping. The latter equipment saw some use in the South Pacific theatre, but it was really more in the nature of an extended field trial than a practical aid to sniping. And it became apparent that with the range limited to 200 yards or so (by the power available from a set of heavy batteries) it was more in the nature of a



One of the first of the .50 specialist sniping rifles was this Model 500 from Research Armaments Industries of the USA.

night sentry's device than a sniper's tool.

Sniping had its next outing in the Korean War, for this war there were still plenty of soldiers in the British and US armies with practical experience of sniping, and once the war settled down into the static phase around the 38`" parallel, sniping came into its own, though the equipment was still the same as that used in the 1939-45 war. There is a story told of an officer in the commonwealth Division of the British Army who acquired fired a 50 Browning machine gun barrel, had a suitable bolt action and stock fitted by a Japanese gunsmith, and personal sniping tool. He was not popular with either side, them for being somewhat more than usually dangerous, and us for attracting retaliatory mortar fire.

Sniping then lay dormant, in the absence of any major conflict, for several years. But in the 1970s it suddenly began to attract a wider audience. This was the time of the terrorist, the hostage-taker, the hijacker and similar people. And when peaceful methods failed, it was soon seen that the solution lay in a sniper capable of taking action against the individual terrorist at long range and with surgical precision. Police and counter-terrorist forces thus began to appreciate the value of a trained marksman with a precision rifle, and rifle manufacturers were not slow to see the potential market.

Things now became technically interesting, in spite of various German and Russian semi-automatic rifles used for sniping in 1941 - 45, in the 1970s it was still generally accepted as Gospel that no semi-automatic rifle could ever be as accurate as a boltaction weapon, and nobody outside the USSR would entertain such an idea. The soviet Army had adopted the Dragunov in 1963, though this was not widely known in the west, and even then such knowledge would not have been accepted as a testimonial for the semi¬automatic principle. The boltaction reigned supreme. But during the 1980s improved semi-automatic rifles went into general service, and sniping versions began to appear.



*The German 'Vampir' infra-red night sight being tested by a British soldier in 1945. Note the size of the back-pack which contained batteries for the IR searchlight and compressed gas for cooling the IR detector in the sight unit.*

By the late 1990s there is less resistance to the semi-automatic in the sniping role,, but it takes an exceptional one to win a military contract, the bolt action is still dominant.The other question which the 1975 - 90 period brought to the fore was the question of caliber and cartridge. Service ammunition is built to a specification, and the accuracy element of that specification is somewhat below the standard which a sniper has the right to expect, and some manufacturers have said ` Never mind what the service standard is, our rifle is optimized to work with 243 Winchester (or some other cartridge) and that is our recommendation.

The pages which follow exhibit the state of art as it stands in 1997, with details of sniping rifles in use around the world or which are currently being offered to the military and security markets. Most of these rifles are in production, a few are no longer produced, but remain in service and are likely to do so for some considerable time, since sniping rifles are slow to wear out. There are also pages of information on sighting systems and similar matters, since without sighting and target acquisition, even the best sniping rifle is at a disadvantage.



*A US Marine sniper team in Vietnam, using the Remington M40 rifle.*

(Resources - Greenhill Books - London)

**Lt Col. MGANB MAHATHUWAKKARA SLLI**
Commanding officer
2 RFT - SLLI



# විරුවනි ඔබලා සුරපුරයෙද ඉන්නේ

දරුවා නොමැත පාසල වෙත ගියෙ ආයේ
අම්මා තාත්තා දරුවන්ට නැති වුයේ
ආදර බිරියන්ට තම සැමියන් නැති වුයේ
අවසන් කළා විරුවන් මෙහෙයුම ජයේ


ඉපදුන බිමට හෙළ ජාතියට
වැදු මවට හැදු පියතුමට
ආදර බිරියට ජනිත කළ දරුවනට
සාමය සැදුවා විරුවා තම මව් බිමට

සාමය ලබා දෙන්නට දිවි පිදුව
විරු දූ පුතුන් වෙයි ලක් මැණිය සතුව
හෙළ දූ පුතුන් ලේ බිඳු මෙහි හෙළුව
දිනූ මව් බිමේ මිණි කැට එයි මතුව

හුස්මයි ගන්නේ ඒ හෙළ විරුවන් හෙළුව
රුහිරු ද දා බිඳුද මේ පොළොවට හෙළුව
මිහිදන් වෙලා විරුවන් පස සරු කෙරුව
ආහාරයි ලබන්නේ අප විරුවනේ සරුව

සාමය ලබා රට පිබිදි එන්නේ
පැතු ඒ ලෝකයයි හෙට ඉදි වෙන්නේ
සාමය සතුට සැම සිත් සනසන්නේ
විරුවනි, ඔබලා සුර පුරයෙද ඉන්නේ

1997.06.06 ජය සිකුරු මෙහෙයුමේදී රට ජාතිය වෙනුවෙන් දිවි පිදු 6 ශ්‍රීලපාහ සැරයන් තිලකරත්න එම්ගේ ආදර බිරිය කේ මාවඩවිලගේ [redacted]වනට උපහාර පිණිස.



# ආදරය

නුඹ ළග ඉන්න විට
මුළු ලොවම මගේයැයි සිතුනා
ඔය සුමිහිරි සිනහව
කෙලෙස අමතක කරන්න
මා කොතෙක් බලා උන්නද
නිහඬවම ඔය දිලිසෙන නෙත් යුවල
කොපමන මිහිරිද මට
මට මෙසේ හිතුණා
නුඹේ දෙතොල ගන්නට
හිද මුළු සසර පුරාම
ආදරේ කරන්න මට සිතුනා

**කෝප්‍රල් සුදු බංඩා ආර්ඩී**
ඒ කණ්ඩායම
7 ශ්‍රීලපාහ

# දයාබර කුමරියට

දැනුනත් මට පෙම් දුක
නුඹ නැත අද මගේ ළග
මා තනිවී තල් අරණේ
නුඹ නැත අද මගේ කුමරියේ...

මා දිවිය නැලවූ
සත්සර ඔබමයි
සිත් සතුටින් තබමින්
මා මනසේ රැව්දුන්
ඔය සුමුදු ස්වරයෙන්
හැකිද මට ලංවී
ගයන්න පෙම්
ගිතිකා..........


දිවි ඇති තුරා හඬන
මෘදු ස්වරය ඔබම වේවා
මතුද උපදින භවේ
ඔබ මගේම වේවා
මා ප්‍රාර්ථනා කරමි.........

**සාසෙ දිසානායක ඩීඑම්ජීඩී**
7 ශ්‍රීලපාහ

# නුඹට පෙම්කල වරදට

නොසිතු ලෙසින් මහදට ලංවී
ආදරය කිමැයි පසක් කර දුන්
සුපෙම් කුමරියනි
වේදනාවේ කඳුළු බිංදු
දෙනුවන් අතර රඳවා
සහසක් පැතුම් මවා
සිත් විමන අඳුරු කර
ගියත් ඔබ වෙන් වී
සාප නොකරමි කිසිම දින
සදා තනි වෙන්නම්
කඳුළු ප්‍රේමයේ මතකයන් අතර
සමා දෙනු මැන දස දහස් වර

මම නොදුටු හිතවත කුමක්කරන්නද මා
පහන් වූ සිතින්
පතන්නම් පැතුම්
නොබිදෙන සෙනෙහසින්
ඔබේ ජිවිතය
ගියක්ම වේවා........



**කෝප්‍රල් ධර්මප්‍රිය ඒපිසි**
ඒ කණ්ඩායම
7 ශ්‍රීලපාහ




# අපූරු ජීවියා

වනාන්තරය වූ කලි ස්වකීය පැවැත්ම සඳහා කිසිවක් නොඉල්ලනාවුද, තම ජීව ක්‍රියාවලියේදී සිය නිෂ්පාදන ඉතා පරිත්‍යාගශීලිව අනුන්හට හා පරිත්‍යාගශීලී භාවයකින් යුක්ත වුවද අපූරු ජීවයකි. එතෙම සියල් ජීවින්ට රැකවරණය සලසයි. රුදුරු පොරෝ පහරින් සියදිවි විනාශය සලස්සන්නාටද සෙවන දෙයි.

සාසෙ දයාරත්න ඩීඒටී
රෙ.ම.ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය, පනාගොඩ

# වීර මවුනි ඔබහට උපහාරයක්ම වේවා!

සසරේ පුරුද්දට අපෙ අම්මා	වුවා
දහදුක් විඳ දරාඅප ඇති දැඩි	කෙරුවා
මවුනි ඔබේ රතු රුධිරය කිරි	කෙරුවා
ඔබෙ ගුණ අප සැමට රන් කිරි ලෙස	පෙව්වා

අම්මගෙ නිධානය පුත්‍රයො හතර	දෙනා
දිවිමග ගෙවන්නට අම්මට සවිය	වුණා
ඔබගෙ ගුණ සුවඳ ගම සැම පැතිර	වුණා
අම්මා නැති සෙවින් ගම අඳ අඳුරු	වුණා

ලොකු පුතු ඔබේ ගාමිණී අද සොවින්	හඬයි
අම්මා නොමැති දුක සෝකය හදේ	දරයි
උදේ සවස අම්මා ළග නිතර	හිදියි
අහෝ කවදාද අම්මා එන්නේ	කියයි

අම්මා නිතර ළග හිඳගෙන හිටපු	පුතා
ඔබ නැති සොවින් වැළපෙයි අද මද්දු	පුතා
අම්මා නොමැති ගේ අද මගෙ පාළු	වුණා
අම්මේ යනවාද අප සැම තනි	කදරා

අම්මාගේ ජිවයම පණගත් චුටි	පුතා
උමතු වී හඬයි අම්මා ගැනම	සිතා
නිවස සැමතැනම මව් රුව සොයන	පුතා
උණු කඳුළැලි සලයි ඔබගේ චුටි	පුතා

ලොකු දුව ඔබේ දුක සැප ගැන සොයා	බලා
කටයුතු අම්මගේ අඩු පාඩු	බලා
අවසන් ගමන් යන මොහොතේ ළගට	වෙලා
පණ බේරාගන්න සටන්	කළා

පොඩි දුව ඔබෙන් වෙන්වී දුර ඈත	හිඳ
අම්මා ගිය මගම යන්නට බලා	හිඳ
ඔබෙ රුව නොමැත අද මා ඉදිරියෙන්	රැඳි
ඔබ ගුණ ගැයීමට හෝඩියෙ අකුරු	මදි

අම්මගෙ තුරුලේ හිදිමින් දඟ කෙරුව	තමයි
තවමත් සුරතලයි අම්මා ලඟම	හිඳියි
පොඩි පුතුඇවිත් අම්මට පණ දෙන්න	හදයි
එනමුත් අනියතයි අම්මා නිතර	සිතයි

රට බේරාගන්න දන්දුන් බාල	පුතා
එනිසා ඔහුට පාදය අද අහිමි	වුනා
එපින් බලෙන් අම්මා නිවනට	යෙදුණා
අම්මා ඉතිහාසයේ වීර මාතාව	වුණා

බෑණාවරුන් සහ ලේලියන් නිතර	සිතා
නැන්දගේ ගුණ කියයි නිතරම දැක්ක	නිසා
මුණුබුරු මිණිබිරියො සැම සුරතලයි	ඉතා
යනවද අවසන් ගමන ඒ සැම	හැරදා

හැත්තා තුනක් ඔබෙ දිවිමග ගෙවී	ගියේ
ඇල්වූ පහන අප නිවසේ නිවී	ගියේ
ඔබෙ ගුණ සැමගේ හදවත් තුළ රැඳී	තියේ
පතනෙමි මවුනි ඔබහට අප නිවන්	සුවේ

සැරයන් අතපත්තු ඒඑස්ගේ වැඩිමහල් සොහොයුරිය.

# ආබාධිත රණවිරුවන් හට රෝද පුටු පරිත්‍යාග කිරීම



වන්නි ප්‍රදේශයේ සිදු කරන ලද මානුෂිය මෙහෙයුම්වලට සහභාගි වී ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් ශ්‍රීලංකා පාබල හමුදාවේ රණවිරුවන් හට අතුරුගිරිය අරංගල එක්සත් ව්‍යාපාරික ප්‍රජා පදනම මගින් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා රෝද පුටු පරිත්‍යාගයක් 2009.06.09 වන දින පනාගොඩ ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රවණාගාරයේදී සිදුකරන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ටීජේ කොඩිතුවක්කු, ආර්ඩබ්පි ශ්‍රීලපාහ සහභාගි වූ අතර, අතුරුගිරිය අරංගල එක්සත් ව්‍යාපාරික ප්‍රජා පදනම වෙනුවෙන් මේජර් (විශ්‍රාමික) කේඒඑස්ඒවී කරුණාතිලක ආර්එස්පි, ශ්‍රීලපාහ ටී.ඒ. ප්‍රනාන්දු මහතා, ඒ.ඩී. ප්‍රනාන්දු මහතා, කේ.ජේ. ප්‍රනාන්දු මහතා, ඒ.වී. අමරසේකර මහතා, ආර්.එන්. අමරසේකර මහත්මිය, බී.එම්. අමරසේකර මහත්මිය, යූ.වී.එම්.වී. පෙරේරා මෙනෙවිය, යූ.වී.පී.වී. පෙරේරා මහතා, යූ.ජේ. රංජන් මහතා, රංජිත් සේනාධීර මහතා, තිලක් අබේසිංහ මහතා, ඩබ්ලිව්. ද සිල්වා මහතා, ඩබ්ලිව්.එම්. ද සිල්වා මහතා, ඩබ්ලිව්.එන්. ද සිල්වා මහතා, ඒ.එස්. කොඩිකාර මහතා, ඒ. මහේෂි පැලවත්ත මහත්මිය, කේ. සුමතිපාල මහතා, අචලා කොඩිකාර මහත්මිය, සංජීව ලොකුගේ මහතා, යන අය එම භාණ්ඩ ආබාධිත රණවිරුවන් වෙත පරිත්‍යාග කරන ලදී.










# ආබාධිත රණවිරුවන් හට සනීපාරක්ෂක කට්ටල පරිත්‍යාග කිරීම



වන්නි ප්‍රදේශයේ සිදු කරන ලද මානුෂිය මෙහෙයුම් වලට සහභාගි වී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණවිරුවන් දොලොස් දෙනෙකු හට අංක 07 උපාලි පෙදෙස මාතලේ යන ලිපිනයේ පදිංචි පරිත්‍යාගශීලි ඩීඒ වර්ණපාල මහතා ඇතුලු පවුලේ සාමාජිකයින් විසින් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා සනීපාරක්ෂක කට්ටල 12 ක පරිත්‍යාගයක් 2009.06.25 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු මූලස්ථාන බළ ඇණියේ අණදෙන නිලධාරි ලූතිතන් කර්නල් අයිපීආර්පී බෝගොඩවත්ත ශ්‍රීලපාහ සහභාගි වූ අතර, ඩී.ඒ.- වර්ණපාල මහතා, විසින් මෙම ඒකකයේ ලාකෝ සම්පත් ඒඑම් යන සෙනියා හට සනීපාරක්ෂක කට්ටල ලබා දෙන අයුරු මෙම ඡායාරූපයේ දැක්වේ. රෙජිමුඛ ශ්‍රීලපාහ පාලන කණ්ඩායම් නිලධාරි අණදෙන නි/64709 කපිතාන් ඒවීබීටී ප්‍රියංකර ශ්‍රීලපාහ ද සහභාගි විය.

# FEDERAL COUNTRIES IN THE WORLD

"Having or relating to a system of government in which several states form a unity but remain independent in internal affairs," that's what Oxford Dictionary says about the meaning of 'Federal'. According to the same dictionary, 'federate' means, "of a member of states organize or organized on a federal basis". 'Federation' means, "a federal group of states". Whatever it is everybody knows that Sri Lanka is not a federation or a federal state. Nowadays, in Sri Lanka the word 'federal' is a controversial issue, because the issues related to 13th amendment of the constitution are been tabled.

The countries such as United Kingdom and Spain in which the central government has delegated some of it's powers to self - governing subsidiary governments, creating a quasi - federation. United Kingdom is comprised of England, Scotland, Wales and Northern Ireland. Spain has 17 autonomous communities and 2 autonomous cities. In addition to that there are some countries in which the central government has delegated some of its powers to regional governments. It is called regionalized unitary. Peoples' Republic of China, Italy, New Zealand and Philippines are examples. China has 22 provinces, 5 autonomous regions, 4 municipalities and 2 special administrative regions. There are 20 regions and 5 granted 'autonomous' status in Italy. Philippines has 17 regions and 1 autonomous region. New Zealand has 16 regions. However all the countries above mentioned are unitary states.

In this world there are some federacies also. Denmark, Finland, France, kingdom of the Netherlands, Portugal, Serbia, Tanzania and Ukraine are very good examples for that. A federacy is a country in which some sub states function like states in a federation and others like states in a unitary state. In Denmark, there are 2 autonomous regions and 5 regions. In Finland there are 19 regions and 1 autonomous province. France is with 1 sui generis collectivity and 26 regions, 4 collectivites d' outré–mer and 1 territorie d' outré-mer. There are 2 states and 12 provinces in Netherlands. In Portugal, there are 2 autonomous regions (Azores and Madeira) and 18 districts. Significant autonomy granted to Vojvodina in Serbia. In Tanzania there are 21 mainland regions and 5 regions under autonomous government of Zanizibar. Ukraine has 24 Oblasts, 2 special-status cities and the Autonomous Republic of Crimea.

Then let's come to the topic now. According to Internet there are 26 federal countries in the world. Among them some are small island states. Federal governments of these 26 countries share power with semi - independent regional governments. In many cases, the central government is (in theory) a creation of the regional governments. A prime example is the United States of America. Countries with federal government in the world are as follows.

(1) **Argentina** (23 provinces and 1 autonomous city)
(2) **Australia** ( 6 states and 2 territories )
(3) **Austria** ( 9 states )
(4) **Belgium** (3 regions and 3 linguistic communities)
(5) **Bosnia and Herzegovina** ( Federation of Bosnia and Herzegovina, Republika Srpska and Breko District )
(6) **Brazil** ( 26 states and 1 federal district )
(7) **Canada** ( 10 provinces and 3 territories )
(8) **Comoros** ( Anjouan, Grande comore, Moheli )
(9) **Ethiopia** ( 9 regions and 3 chartered cities )
(10) **Germany** ( 16 states)
(11) **India** ( 28 states and 7 union territories )
(12) **Iraq** ( Currently 18 governates and 1 region )
(13) **Malaysia** ( 13 states and 3 federal territories )
(14) **Mexico** ( 31 states and 1 federal capital territory )
(15) **Micronesia** ( Chuuk, Kosrae, Pohnpei and Yap )
(16) **Nigeria** ( 36 states and 1 federal capital territory)
(17) **Pakistan** ( 4 provinces and 2 territories )
(18) **Palau** ( 16 states)
(19) **Papua New Guinea** (18 provinces ,1 autonomous region and 1 capital district )
(20) **Russia** (46 oblasts, 21 republics, 9 krais, 4 autonomous okrugs, 2 federal cities, 1 autonomous oblast)
(21) **Saint Kitts and Nevis** ( 14 parishes )
(22) **South Africa** (9 provinces )
(23) **Switzerland** ( 26 cantons )
(24) **United Arab Emirates** ( 7 emirates )
(25) **United States** (50 states, 2 commonwealths, 1 federal district and 14 territories)
(26) **Venezuela** (23 states, 1 capital district and 1 federal dependency )

**Maj Tharindu Weerasinghe SLLI**
tharinduweerasinghe@yahoo.com

# කෙසෙල් කොටයට යටවුන රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය

දෙවන විමලධර්මසූරිය රජතුමාගෙන් පසු රජකමට පත් නරේන්ද්‍රසිංහ නරපතියාගේ රාජ්‍ය කාලයෙහි ( 1707 - 1739 ) ඇති වූ කුමන්ත්‍රණයක් පිළිබඳ රසවත් කතා පුවතක් 1993 දෙසතිය සඟරාවේ පළවී ඇත. එය ඔබගේ රසවින්දනය පිණිස මෙසේ ඉදිරිපත් කරනු ලැබේ.

කුමන්ත්‍රණයේ නායකයා " කිරිවවිලේ රාළ " නම් අයෙකි. ඔහුට අවශ්‍ය වූයේ නරේන්ද්‍රසිංහ රජු මරා " පට්ටියේ බණ්ඩාර " නම් රජ පවුලේම අයෙක් රජ කමට පත් කිරීමයි. රජතුමා මරා දැමීමේ කටයුත්තට හත් දෙනෙක හවුල් කරගත් කිරි වවිලේ රාළ ගේ සැලැස්ම වූයේ නින්දේ සිටින රජතුමාට කඩුවෙන් කොටා මරා දැමීමයි. රජතුමාට පාක්ෂිකව සිටි රම්මාලක රාජ විසින් රජතුමාට මේ බව කලින්ම දන්වා සිටියෙන් උඩවත්ත කැලයට පැන ගිය රජතුමා ගඟෙනුත් එගොඩ වී උඩුගොඩ දේවාලයේ සැගවී ඇත. පලායාමට පෙර රජතුමාගේ සිරි යහන් ගැබේ ලොකු කෙසෙල් කඳක් වසා තබා ගියෙන් මාලිගාවට ඇතුළු වූ කුමන්ත්‍රණකරුවෝ කෙසෙල් කොටය පෙති ගසා දැමූහ. උඩුගොඩ දේවාලයේ කැපකරුවකු ලෙස සේවය කළ යක් දෙස්සෙක් රජතුමාට කියා සිටියේ දින හතක් යනතුරු යළි රජ වාසලට නොයන ලෙසත් ඉන්පසු පැමිණියහොත් සතුරන් දමනය කර යළි රජකම ගෙන යා හැකි බවත්ය. යක් දෙස්සාගේ උපදෙස් පිළිගත් රජතුමා උඩසිය පත්තුවට පැනගොස් පුරා සතියක් තුලම පොද්දල්ගොඩ ගල් ගෙයක සැගවී සිට නැවත මාලිගාවට පැමිණ ඇත. කුමන්ත්‍රණකරුවන් සියළු දෙනාම රජතුමා ඉදිරියට පමුණන ලදින් රාජාඥාව අනුව මරා දමන ලදි. රජ වෙන්නට සිටි පට්ටියේ බණ්ඩාර තලවින්න නම් තැනක ගසක එල්ලා වැද්දන් විසින් විද මරා දමන ලදි. රජතුමාට ඔත්තුව දුන් රම්මාලක රාලට තාන්න මාන්න ලැබුනු අතර, රජතුමා විසින් උඩුගොඩ දේවාලයද ප්‍රතිසංස්කරණය කර ඇත.

## ප්‍රහේලිකා අංක 42

නිවැරදි විසඳුම්පත් 2010 ජනවාරි මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරග කූපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 42

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | | | | | 3 | 7 | | |
| | 1 | | | 6 | | | 4 | |
| | | 2 | 8 | | | | | 5 |
| 6 | | | | | 2 | 1 | | |
| | 3 | | | 5 | | | 2 | |
| | | 7 | 3 | | | | | 9 |
| 9 | | | | | 5 | 3 | | |
| | 7 | | | 3 | | | 9 | |
| | | 3 | 6 | | 3 | | | 8 |

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුල 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුලත් විය යුතු අතර එය පිළිවෙළකට අවශ්‍ය නැත.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුලත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙළකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුල හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 39

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 5 | 8 | 1 | 3 | 4 | 6 | 9 | 7 |
| 4 | 9 | 3 | 8 | 7 | 6 | 5 | 2 | 1 |
| 6 | 7 | 1 | 5 | 2 | 9 | 3 | 4 | 8 |
| 7 | 3 | 2 | 6 | 5 | 1 | 9 | 8 | 4 |
| 5 | 4 | 9 | 3 | 8 | 2 | 7 | 1 | 6 |
| 1 | 8 | 6 | 4 | 9 | 7 | 2 | 5 | 3 |
| 3 | 1 | 5 | 9 | 6 | 8 | 4 | 7 | 2 |
| 8 | 6 | 7 | 2 | 4 | 5 | 1 | 3 | 9 |
| 9 | 2 | 4 | 7 | 1 | 3 | 8 | 6 | 5 |

ප්‍රහේලිකා අංක 39 හී ජයග්‍රහකයින්

පළමු ස්ථානය

නි/64778 කපිතාන් ආර්එම්ආර්කේ රාජගුරු ශ්‍රීලපාහ
සී කණ්ඩායම
15 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
මුලතිව්

දෙවන ස්ථානය

සෙ/301467 කෝප්‍රල් සෝමතිලක බීඑම්සී
සී කණ්ඩායම
15 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
මුලතිව්

## තරග කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන,දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/- , රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබාදීමට තිරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තිරණ අවසාන තිරණය ලෙස සැලකේ.
5. ප්‍රහේලිකා අංක 42 හි නිවැරදි විසඳුම් පත් 2010 ජනවාරි මස 15 වන දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දිම සිදු කෙරේ.
7. පිළිතුරු පත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 42 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ජනපදය
පනාගොඩ
හෝමාගම

## වයිට් හැකල් ප්‍රහේලිකාව

### අංක 42

### කූපනය

අංකය :..........................................................

නිලය :..........................................................

නම :..........................................................

රාජකාරී ලිපිනය :..........................................................

..........................................................

..........................................................

ඒකකය :..........................................................

ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................







සම්බුදු තෙමගුල සිහි කිරීම
නිමිත්තෙන්
11 සේමු සංවිධානය කළ
ශ්‍රී බෝධි රාජාරාමයේ
පැවති පිංකම් මාලාවේ
රෙම ශ්‍රීලපාහ දායකත්වය








මානුෂීය මෙහෙයුම අවසන් වීමෙන් පසු වෙල්ලමුල්ලි වයික්කාල් වෙරළ තීරයේදී

කැමරා ඇස දුටු ශ්‍රීලපාහ නිලධාරීන් පිරිසක්

